# THE FACULTY JOURNAL OF HUMANITIES AND SOCIAL SCIENCES

**Volume 10**

**Issue 01**

**June 2021**

Faculty of Humanities and Social Sciences

University of Ruhuna

Matara

Sri Lanka

## The Faculty Journal of Humanities and Social Sciences

**Volume 10, Issue 01. June 2021**



Copyright © June 2021, Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Matara, Sri Lanka.

All rights reserved. No part of this publication may be reproduced, stored in a retrieval system or transmitted by any means, electronic, mechanical photocopying, and recording or otherwise, without written consent of the publisher.



ISSN 1800-3486



**Editorial Board**

Dr. Chandika Gunasinghe (Editor-in-Chief)

Senior Prof. E.A. Gamini Fonseka

Dr. S.G.S. Samaraweera

Dr. Shyama Ranabahu

Dr. W. Bohingamuwa

Ven. Prof. Beligalle Dhammajoti Thero

Dr. N.S. Ariyarathne

Ven. Dr. M. Ariyawansa Thero

Dr. P.R. Ekanayake

Dr. Kokila Ramanayaka

Dr. Y. Ananda Karunarathna



Published by
Faculty of Humanities and Social Sciences
University of Ruhuna, Matara, Sri Lanka.
Tel: +94 41 22 270 10
Email: fjhss@hss.ruh.ac.lk

# The Faculty Journal of Humanities and Social Sciences

**Volume 10, Issue 01. June 2021**

The Faculty Journal of Humanities and Social Sciences, Volume 10, Issue 01, June 2021 is a peer-reviewed journal published biannually by the Faculty of Humanities and Social Sciences, University of Ruhuna. As a multidisciplinary journal, it intends to provide a common platform for academics, researchers and professionals to publish their research results in areas pertaining to Humanities and Social Sciences.

**Editorial Office**

The Faculty Journal of Humanities and Social Sciences

Faculty of Humanities and Social Sciences

University of Ruhuna

Matara

Sri Lanka

Tel: +94 41 22 27010

Email: fjhss@hss.ruh.ac.lk

**The Faculty Journal of Humanities and Social Sciences**

**Volume 10, Issue 01. June 2021**

**Editors**

Dr. Chandika Gunasinghe, Department of Economics, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Snr. Prof. E.A. Gamini Fonseka, Department of English and Linguistics, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Dr. S.G.S. Samaraweera, Department of English Language Teaching, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Dr. Shyama Ranabahu, Department of Geography, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Dr. W. Bohingamuwa, Department of History & Archaeology, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Ven. Prof. Beligalle Dhammajoti Thera, Department of Pali and Buddhist Studies, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Dr. N.S. Ariyarathne, Department of Public Policy, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Ven. Dr. M. Ariyawansa Thera, Department of Sinhala, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Dr. P.R. Ekanayake, Department of Sociology, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Dr. Kokila Ramanayaka, Department of Information Technology, Faculty of Humanities and Social Sciences, University of Ruhuna.

Dr. Y. Ananda Karunarathna, Department of Geography, Faculty of Arts, University of Colombo.

# Content

ස්ත්‍රීත්වය සාහිත්‍යගත කිරීම : සිංහල නවකතාව පිළිබඳ ස්ත්‍රීවාදී ප්‍රවේශයක් 1
**(**Femininity in literature: A feminist approach on the Sinhala Novel)
ලතා ගුරුසිංහ

Effects of Anthropogenic Activities on the Natural Environment in Kotmale Catchment (With special reference to Malhewa, Ramboda and Wedamulla GN Divisions) 19
Madhushani G.O.G.N and Herath H.M.P

සෙක්කුවඃ ඒ හා සබැඳි සමාජ, ආර්ථික සහ සංස්කෘතික පසුබිම පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්(ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක ඇසුරින් (Sekku: A Historical Study on Social, Economic and Cultural Background of the related on Sekku (Based on Galle and Matara Districts)) 46
ලක්මිණි ගමගේ , කවුඩාගම්මන රතනසාර හිමි

Use of literature-based online ESL materials in enhancing the English-speaking skills of undergraduate learners 65
Ruwan Gunawardane, Shavindra Chandradasa, H.H. Senevirathne

නූතන සිංහල කෙටි කවි විචාරයෙහිලා ක්ෂණික අන්තර්දෘෂ්ටි (Epiphany) සංකල්පයෙහි ඇති වැදගත්කම (The significance of epiphany in criticizing Modern Sinhalese short poems) 78
අපරැක්කේ සිරිසුධම්ම හිමි

## Editorial Note

On behalf of the Editorial Board, I am extremely happy to write this editorial note for the Journal of the Faculty of Humanities and Social Sciences (JFHSS), Volume 10, Issue 1, 2021. The JFHSS is a double-blind peer-reviewed scholarly journal published twice a year (June and December) by the Faculty of Humanities and Social Sciences, University of Ruhuna. The members of the Editorial Board, amidst the numerous teaching, research, administrative, and social commitments, managed to come out with a collection of five valuable academic papers that address some crucial issues of timely relevance for the benefit of the academic and research community of Sri Lanka and abroad. The papers in this issue were subjected to a strict blind review process and the authors were requested to revise them more than twice. On behalf of the Editorial Board, I express my humble gratitude and appreciation to all the reviewers for their generous and expert involvement as reviewers to improve the quality of the papers up to a standard suitable for publication in this issue. I am also grateful to the members of the editorial board for their commitment and dedication extended to producing this issue and, to the authors for submitting their valuable academic works to the journal.

Issue 1 of Volume 10 of the Journal of the Faculty of Humanities and Social Sciences (JFHSS) is meant to address some important concerns in the disciplines that are specialized under nine separate departments within the Faculty of Humanities and Social Sciences as a timely contribution to the ongoing process of producing and disseminating knowledge. The issue consists of 5 papers that present the outcomes of 5 thorough research projects carried out by some academics from the university system of Sri Lanka, specializing in a variety of disciplines including gender studies, geography,

culture and history, English language teaching, and modern Sinhalese poetry, respectively.

The opening paper in the volume by Latha Gunasinghe discusses a feminist approach to the Sinhala novel under the integration of femininity in the art of literature. She examines the gender representations in the Sinhala novel within a feminist approach to literary analysis, using the works of Eva Ranaweera, Sumithra Rahubaddha, K. Jayatilake, and Tennyson Perera. Also, she explains the connection between feminist literature and feminine experience of reality from a feminist standpoint with reference to the feelings, beliefs, and lifestyles of the women portrayed in the respective novels. According to the author, feminism has become a broad concept that goes beyond the issues of equal rights and democratic liberation movements, in the attempts to change the existing social system. Thus, based on a feminist ideology-based analysis of the respective works of fiction, the author argues that points out the necessity of exposure to the worldwide tendencies of femininity in the craftsmanship of fiction.

G.O.G.N Madhushani and H.M.P Herath examine the effects of anthropogenic activities in the natural environment of the Kotmale sub-catchment in the Upper Mahaweli Catchment where land use seem to have undergone a radical change over the years 1997-2011. Using both primary and secondary data collection methods, Chi- square analysis and GIS techniques, satellite images of Landsat of 1997 and 2011, the authors argue that deforestation, unsuitable land use practices, excessive usage of agrochemicals, construction activities, and agricultural activities as the main anthropogenic activities that cause erosion, sedimentation, soil quality degradation, and landslides. The authors also uncover an increasing pattern of built-up area and cultivated lands within

the relevant period, and a gradual decreasing pattern of the vegetation cover and the water bodies in the area.

L. Gamage and the Ven. Kawudagammana Rathanasara Thera examine the social, economic, and cultural changes the two districts in the Southern Province - Galle and Matara - experienced under the British colonial regime across the $19^{th}$ and $20^{th}$ centuries, because of the traditional-mode coconut oil industry that pivoted on the *sekku*, the traditional pressing tool used for extracting oil from copra. Under the British plantation economy, coconut cultivation flourished as a commercial crop while a market for coconut-based products emerged locally as well as internationally. Based on the field studies and in-depth interviews as well as previous research studies considered here as secondary sources, the authors uncover how the *sekku* owners developed their social status by being wealthy and gaining colonial positions. The authors further find that the *sekku* industry boosted the region's economy and cultural identity by making a decisive impact on the economic, social, and cultural conditions of the Southern Province during the period concerned.

R. Gunawardane, S. Chandradasa, and H.H. Senevirathne investigate the impact of literature-based language lessons conducted online in enhancing English-speaking skills. They claim to have developed a literature-based language programme and conducted it online for over 15 weeks for the third-year undergraduate students who had got registered for the English language programme of the Faculty of Science, University of Ruhuna. The data has been collected from a group of 50 such students through a questionnaire survey with open-ended questions and from 6 English teachers with focus group discussions. Having observed the classrooms to get a better insight into the impact created by these lessons, they find that English lessons based on literature were able to create a conducive teaching and learning atmosphere,

which eventually enhanced the students' intrinsic motivation, creative thinking, active participation, and attendance while reducing their anxiety to a considerable level. They conclude that literature-based language teaching methods inspire language learners in improving their speaking skills to the extent that the language teachers perform well in exploiting the ideal literary texts in the classroom.

In this compilation of papers, the last in line is a detailed investigation into "The conceptual significance of epiphany in the criticism of modern Sinhala hyku-type short lyrics" by the Ven. Aparekke Sirisudhamma Thero. Epiphany in poetry is a rhetorical device applied to provide a sudden insight or realization capable of changing the reader's mindset about a particular aspect of reality, while preserving the reader's independence in enjoying the impact of poetics as well as perceiving reality in the medium of poetry. The author proposes an approach to critical reading of modern Sinhalese short poems with a focus on the use of epiphany and suggests the literary value of short poems as a sub-genre in modern Sinhalese poetry.

Thus the five papers mirror a fraction of the research interests of the faculty. Of course, the editorial board emphasize that the respective authors are solely responsible for the ideas generated in the papers.

The compilation of the journal was obviously a group activity. Therefore on behalf of the editorial board I thank all those who helped in this venture.

Dr. Chandika Gunasinghe
Editor-in-Chief

# ස්ත්‍රීත්වය සාහිත්‍යගත කිරීම : සිංහල නවකතාව පිළිබඳ ස්ත්‍රීවාදී ප්‍රවේශයක්

# Femininity in literature: A feminist approach on the Sinhala Novel

ලතා ගුරුසිංහ

සිංහල අධ්‍යයනාංශය

කොළඹ විශ්වවිද්‍යාලය

latha@sinh.cmb.ac.lk

---

**සංක්ෂේපය**

ස්ත්‍රීවාදී එළඹුමක් සහිතව සිංහල නවකතාවේ නිරූපිත ස්ත්‍රී-පුරුෂ සමාජභාව විමසීම මේ පර්යේෂණ පත්‍රිකාවේ මුඛ්‍ය අරමුණ වේ. මක් නිසාද යත් ස්ත්‍රීවාදී දාර්ශනික විශ්ලේෂණ ක්‍රමය  සෑම සමාජ ගැටලුවක්ම ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අනුව විග්‍රහ කරන බැවිනි. 19 වන හා 20 වන සියවස්වල බටහිර සමාජයෙහි ස්ත්‍රී ප්‍රශ්න හා බැඳුණු උද්ඝෝෂණ හැඳින්වීමට ස්ත්‍රීවාදය යන වචනය භාවිත කළත් මේ වන විට එය පුළුල් අර්ථයකට වර්ධනය වී ඇත. ඒ අනුව ස්ත්‍රීවාදය ස්ත්‍රීන්ට විරුද්ධව දැනට කෙරෙන වෙනස්කම් නැති කිරීම සඳහා සම අයිතීන් හා නෛතික ප්‍රතිශෝධන ඉල්ලා සිටින අතරම සමානාත්මතා සහ විමුක්ති ව්‍යාපාරවලින් ද ඔබ්බට ගොස් පවත්නා ක්‍රමය වෙනස් කිරීමට උත්සාහ කරන පුළුල් සංකල්පයක් බවට පත්වී ඇත.  ස්ත්‍රීවාදයෙහි විවිධ න්‍යායාත්මක ප්‍රවේශ දැකිය හැකිය. කාන්තාවට බලය පැවරීමට, සමානාත්මතාව නිර්මාණය කිරීමට ,විමුක්තිය අත්පත් කර ගැනීමට ,මර්දනයට හා වෙනස්කම් ඉවත් කිරීමට යන කරුණු මතවාදීමය වශයෙන් ස්ත්‍රීවාදයට  ඉලක්කගත වේ. ස්ත්‍රීවාදී සාහිත්‍ය ස්ත්‍රීවාදී ව්‍යාපාරයේ කාර්යභාරය පරිසමාප්ත කිරීමට උත්සුක වේ. ස්ත්‍රීවාදී සාහිත්‍ය විචාරයේ දී සාහිත්‍යකරණය හා ස්ත්‍රී අනුභූතීන් අතර පවත්නා සම්බන්ධය ස්ත්‍රීවාදී දෘෂ්ටියක් මත පිහිටා ව්‍යාඛ්‍යාන කිරීමත්, ලේඛකයන් විසින් මෙන්ම ලේඛිකාවන් විසින් ද ස්ත්‍රීන්ගේ සිතුම් පැතුම්, ඇදහිලි විශ්වාස, ජීවන ශෛලීන් සාහිත්‍යගත කොට ඇති ආකාරය සියුම් පරීක්ෂණයකට ලක් කිරීමත් සිදු වේ. ඒ අනුව ඊවා රණවීර, සුමිත්‍රා රාහුබද්ධ, කේ. ජයතිලක, ටෙනිසන් පෙරේරා යන කතුවර කතුවරියන්ගේ තෝරා ගත් නවකතා ඇසුරෙන් මෙම අධ්‍යයනය සිදු කෙරේ.

**ප්‍රමුඛ පද: නවකතාව, ස්ත්‍රීවාදය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පීතෘ මූලිකත්වය, සාහිත්‍ය විචාරය**

## Abstract

Inquiring into depictions of gender in the Sinhala novel with a feminist approach is the objective of this research paper. The fact that in feminist ideology-based analysis, every social issue is explained in terms of gender is the reason for this. Though the term feminism first came into use in reference to the protests which occurred in relation to issues concerning women in western society in the 19th and 20th centuries, it has by now acquired a broader meaning. Feminism has become a broad concept which, while seeking to end the prevailing discrimination against women by demanding equal rights and amending of laws, also goes beyond equal rights and liberation movements, in attempts to change the existing system. There are several theoretical approaches in feminism. Empowering women, creating gender equality, achieving liberation, removing suppression and discrimination are ideologically targeted in feminism. Feminist literature is solicitous to (i.e., keenly concerned with) fulfilling the role of the feminist movement. In feminist literary criticism the connection between literature and the feminine experience is expounded from a feminist standpoint and the depictions in literature by writers (both male and female) of feelings, beliefs and lifestyles of women are subjected to close scrutiny. Accordingly, this study has been conducted using novels selected from among the works of authors Eva Ranaweera, Sumithra Rahubaddha, K. Jayatilake, and Tennyson Perera.

**Keywords: Novelty, Feminism, Gender, Patriarchy, Literary Criticism**

## 1. හැඳින්වීම

ස්ත්‍රීවාදී අභිමතාර්ථ දිනා ගැනීමේ පරිශ්‍රමය පසුපස ස්ත්‍රී-පුරුෂ සමාජභාව ගැටලුව පවතී. ස්ත්‍රී-පුරුෂ සමාජභාව යනු සමාජ සංස්කෘතික නිර්මිතියකි. ස්ත්‍රී-පුරුෂ සමාජභාව න්‍යායාත්මක නිර්ණායකයක් සහ සංස්කෘතික යථාර්ථයක් ලෙස නිරතුරුව පවතී.

ස්ත්‍රී-පුරුෂ සමාජ අසමානතාව, ස්ත්‍රී-පුරුෂ භේදය, ස්ත්‍රිය වෙනස්කම්වලට ලක් කිරීම, මර්දනය, ද්විතීයිකභාවය යන බොහෝ අංග පිතෘ මූලිකත්වයේ නිපැයුමකි. පීතෘ මූලික සමාජය යනු ස්ත්‍රීන් යටපත් කොටගෙන පුරුෂයන් ආධිපත්‍යය පෑම නොව පද්ධතිගත ව්‍යූහයක් ලෙස පවතින්නකි. පීතෘ මූලික මතවාද පුරුෂ මූලිකත්වය යන සංකල්පවලට ස්ත්‍රීවාදීහු දැඩි ලෙස අභියෝග කරති. ස්ත්‍රීත්වය යන සංකල්පයෙහි නියම අර්ථය පහදා දීමටත්, එය පුරුෂ කේන්ද්‍රීය සමාජවල බලපෑම හා ආධිපත්‍යයට නතු වී ඇති ආකාරය පෙන්වා දීමත් ස්ත්‍රීවාදී සාහිත්‍ය එළඹුම්වල අපේක්ෂාව වේ. ස්ත්‍රීවාදයෙහි විවිධ ප්‍රභේද පවතින අතරම එහි යටිතලයේ පදනම වන ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ ද විවිධාකාර විග්‍රහ කිරීම් දැකිය හැකිය.

## 2. සාහිත්‍ය විමර්ශනය

ඒ.වී. සුරවීර නවකතා නිර්මාණය හා අවබෝධය, එදිරිවීර සරච්චන්ද්‍ර සිංහල නවකතා ඉතිහාසය හා විචාරය, එරික් ඉලයප්ආරච්චි කලාත්මක ඥානය සහ සැබෑ ලෝකය, දූවෙන ප්‍රශ්න, ලියනගේ අමරකීර්ති අමුතු කතාව, පශ්චාත් යථාර්ථවාදී ප්‍රබන්ධ කලාවක් වෙත ප්‍රබන්ධ න්‍යායික රචනා සිංහල නවකතාව පිළිබඳ අධ්‍යයනයේ දී භාවිතයට ගැනිණ. මේ හැර ස්ත්‍රිය විෂයෙහි එළිදක්වන ලද සිංහල ප්‍රකාශන ගණනාවක් ද ඇසුරු කෙරිණ. පිතෘ මූලිකත්වය යනු කුමක්ද? කමලා භාසින් ,ස්ත්‍රීවාදය හා ජාතිකවාදය කුමාරි ජයවර්ධන, භාවිත කෙරිණ. එමෙන්ම ස්ත්‍රීවාදය හා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ න්‍යායාත්මක දැනුම ලබා ගැනීම සඳහා Betty Freiden The Feminine Mystique , Judith Butler Gender Trouble, Simone de Beauvoir The Second Sex , Freedman Jademan Feminism, Sandra Gillbert and Susan Guber The Mad Women in the Attic කෘති ද පරිශීලනය කෙරිණ.

## 3. අධ්‍යයනයේ අරමුණ

ස්ත්‍රීවාදී සාහිත්‍ය විචාරයට අනුගත වෙමින් සිංහල නවකතා රචකයන් හා රචිකාවියන් ස්ත්‍රීත්වය සාහිත්‍යගත කොට ඇති ආකාරය විමසා බැලීම මෙම පර්යේෂණාත්මක අධ්‍යයනයේ ප්‍රමුඛතම අභිප්‍රාය වේ. සාහිත්‍ය නිර්මාණ එය බිහිවන කාල පරිච්ඡේදයේ ස්ත්‍රිය පිළිබඳ ආකල්ප, සිතුම් පැතුම් පිළිබිඹු කරන බව ස්ත්‍රීවාදීන්ගේ අදහසකි. ස්ත්‍රීත්වය පිළිබඳව සම්මතව පවත්නා සාම්ප්‍රදායික චින්තනයෙන් බැහැරවීමට මෙම නිර්මාණකරුවෝ සමත් වී ඇත්ද ? ස්ත්‍රීවාදී සාහිත්‍ය එළඹුමක් නිර්මාණවල අන්තර්ගත වී තිබේද යන්න විමසා බැලීම අධ්‍යයනයේ අරමුණු වේ.

## 4. අධ්‍යයන ක්‍රමවේදය

වර්තමාන ලාංකේය කාන්තාව තරමක නිදහස් බවක් අත්පත් කරගෙන සිටිය ද ඉතිහාසයේ සිට ඇය තවමත් වෙනස්කම්වලට (discrimination), මර්දනයට (oppression), ද්විතියිකභාවයට (subordination) භාජනය වේ. ශ්‍රී ලාංකේය කාන්තාව සම්බන්ධ පර්යේෂණ වැඩි වශයෙන් දිශානුගත වී ඇත්තේ සමාජ, සංස්කෘතික, දේශපාලනික, නෛතික වැනි විෂයානුබද්ධ කරුණු පදනම් කරගෙනය. මේ නිසා නූතන සිංහල සාහිත්‍ය සම්බන්ධිතව සිදුවී ඇති මැදිහත්වීම් අත්‍යවශ්‍ය වී ඇත. පුස්තකාලය ආශ්‍රිතව පර්යේෂණ කටයුතු සිදු කෙරිණ. සාහිත්‍යයෙහි ස්ත්‍රීත්වය ස්ථානගත කර ඇති ආකාරය අධ්‍යයනය කිරීම සඳහා ඊවා රණවීර, සුමිත්‍රා රාහුබද්ධ, කේ. ජයතිලක, ටෙනිසන් පෙරේරා යන ලේඛක ලේඛිකාවන්ගේ කෘති මේ සඳහා ඇසුරු කෙරිණ.

## 5. සාකච්ඡාව

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය යනු ස්ත්‍රියට හා පුරුෂයාට සමාජය විසින් ලබා දී ඇති ස්ථානයයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිරිමියාට වඩා ස්ත්‍රිය පීඩනයට පත් කරන සමාජීය ගොඩනැංවීමකි. පීතෘ මූලිකත්වය විසින් මෙම ගොඩනැංවීම සිදු කරනු ලබයි. ස්ත්‍රී-පුරුෂ සමාජභාව හා සම්බන්ධිත ස්ත්‍රීවාදී න්‍යාය පොදු මූලධර්ම මත නිර්මාණය කර ගත්තකි. ස්ත්‍රීවාදය නැතහොත් කාන්තා විමුක්තිය සඳහා වන අරගලය ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකමක් ලෙස මෙම න්‍යායෙහි අන්තර්ගත වේ. භාෂාවත්, සාහිත්‍ය සම්පාදනයත්, සාහිත්‍යික විචාරයත් යන තුන් වපසරිය තුළ ස්ත්‍රීවාදී ධාරාව පහළ වූයේ පුරුෂ බලයට හෙවත් පීතෘ මූලිකත්වයට එරෙහිව දක්වන විරෝධතා සහිත ව්‍යාපාරයක් ලෙසිනි. සාහිත්‍ය පඨිත අධ්‍යයනය කරන විට ස්ත්‍රී-පුරුෂ සමාජභාවය නම් පදාර්ථය එම පඨිත හරහා විවිධ පරාස ඔස්සේ සාකච්ඡා වන අයුරු දැකගත හැකිය. ස්ත්‍රීවාදය වර්තමානය වන විටත් ලාංකේය සමාජ සන්දර්භය පිළිගත්තක් නොවේ. වැරදි වටහාගැනීම්, ප්‍රතික්ෂේප කිරීම්, විරෝධතා දැක්වීම් සහිත මතවාදයක් ලෙස ස්ත්‍රීවාදය තහවුරු වී ඇත. ස්ත්‍රීවාදී සාහිත්‍ය විචාරය, එහි ක්‍රමය සහ න්‍යාය බහුවිධ අරුත් ගනියි. ස්ත්‍රීවාදී සාහිත්‍ය විචාර දේශපාලන කතිකාව තුළ පීතෘ මූලිකත්වය සහ ලිංගිකත්වයට එරෙහි විචාරාත්මක, න්‍යායාත්මක ප්‍රායෝගික තත්ව දැකිය හැකිය.

ඊවා රණවීර තම නවකතා ත්‍රිත්වයටම ලැයිසා (1967), සෙදෝනා (1973), තනි නොතනියට (2003) විෂය කරගෙන ඇත්තේ පුරුෂ මූලික සමාජ ව්‍යුහයක පීඩනයට ලක්වන, විශේෂයෙන් ලිංගික හිංසනයට ලක්වන ස්ත්‍රීන්ය. පුරුෂෝත්තම සමාජයක දරිද්‍රතාවෙන් පීඩා විඳින ගැහැනිය පිළිබඳ ප්‍රබල විවරණයක් මේ නිර්මාණවල ගැබ්ව පවතී. ලැයිසා, හෙලේනා සහ ඔවුන්ගේ මව නිවෙස්වල බැලමෙහෙවර කරන කාන්තාවෝ වෙති. පාසැල් ගුරුවරියක වන

හාමිනේත් ඇයගේ ස්වාමිපුරුෂයා වන රාජපක්ෂ මහතාත් ලැයිසා නම් මෙහෙකාරියට සලකන්නේ දෙයාකාරයකිනි. හාමිනේ නිවසේ සියලු කටයුතු ලැයිසාගෙන් සිදු කර ගන්නා අතරම රාජපක්ෂ මහතා ලැයිසාගෙන් ලිංගික අවශ්‍යතා සපුරා ගනියි. ලැයිසාත් මවත් තම සොහොයුරිය වන හෙලේනාත් දිළිඳුකම හා අනාරක්ෂිත බව නිසා පුරුෂයින්ගේ අතවරවලට ලක් වෙති. සමාජ ප්‍රභූත්වය දිළිඳු ස්ත්‍රිය කෙරෙහි බලපවත්වන ආකාරය ඒවා මනාව මෙම නවකතා ත්‍රිත්වයෙන් පෙන්නුම් කරයි.

> ''රාජපක්ෂ පවුලේ ළමයකු මගේ කුස පිළිසිඳ ගැනීම නම්බුවක් ලෙස අම්මාත් සලකනවා ඇතැයි මට සිතුණා. මගෙ කෙල්ලගෙ තාත්තට අවනම්බු නැතිව කෙල්ලට උගන්වන්න ඕනෑ යයි අම්මා කියනවා මට මතකයි. වෙන එකක් තියා තාත්තා කවුද කියාවත් අම්මා කිව්වෙ නැත්තෙ තාත්තට අපි අවනම්බුක් වෙන නිසා විය හැකිය'' (රණවීර, 1967 : 118).

මේ නවකතාවේ සිදුවීම් තුළින් මතු වන්නේ ස්ත්‍රීත්වයට හිමි යටහත් බවේ රාමුවයි. මේ කාන්තාවන් තිදෙනාම අහිංසක, අවංක යටහත් පහත් ගැහැනු වෙති. ලැයිසා තමා නිසා ගැබ් ගෙන ඇති බව දැනගන්නා රාජපක්ෂ මහතා දරු ගැබ හානි කිරීමට උත්සාහ ගනියි. ඒ සමගම වෙනත් පුරුෂයකුට ඇය විවාහ කර දීමට ද උත්සුක වේ. නීත්‍යානුකූල විවාහයකින් තොරව ස්ත්‍රියකට දරු ගැබක් පිහිටීම සමාජ අවමානයට හේතුවකි. එහි දී පීතෘත්වය නිර්ණය කිරීමේ වගකීම පැවරෙන්නේ ස්ත්‍රියටය. ස්ත්‍රියගේ ඉරණම කෙරෙහි බලපාන ප්‍රේමය, විවාහය, ලිංගිකත්වය පිළිබඳ ගැටලු ස්ත්‍රී විමුක්ති ව්‍යාපාරයේ තියුණු විමසුමට ලක් වේ.

පීතෘ මූලික ආධිපත්‍යය පිළිබඳ කතුවරිය යටිතලයේ ගෙන යන සාකච්ඡා සංකීර්ණ සාකච්ඡාවකට මඟ පාදයි. මෙහි දී පීතෘ මූලිකත්වය පද්ධතියක් ලෙස තේරුම් ගැනීම වැදගත්ය. පිරිමි ගැහැනුන්ට වඩා උසස් වෙතියිද පිරිමින් විසින් ගැහැනුන් පාලනය කරනු ලැබිය යුතු යයි ද ගැහැනුන් පිරිමියාට අයත් දේපලෙහි කොටසක් වෙතියිද යන දෘෂ්ටිය ඒවාගේ නිර්මාණ තුළ අභියෝගාත්මක ප්‍රකාශන වේ. පුද්ගලික දේපල ක්‍රමය, ධනේශ්වර සමාජ ක්‍රමය පවත්නා තන්හි ලිංගික හා වෛවාහික ප්‍රශ්න අනේකවිධ ගැටලු සහ ගැටුම් සියලුම සමාජ පන්ති හා ස්තරවල ස්ත්‍රිය පීඩාවට පත් කරන බව ස්ත්‍රීවාදීන්ගේ අදහසකි.

ඒවා රණවීරගේ 'සෙදෝනා' නවකතාවෙහි දෙමාපියන් අහිමි අවිවාහක දිළිඳු තරුණියකගේ ජීවන වෘත්තාන්තය අන්තර්ගත වේ. ගමේ නිවෙස්වල මෙහෙකාර සේවයේ යෙදෙමින් සොහොයුරා පෝෂණය කරන ඇය තමා සේවය කරන ගෙදරක විවාහක පුරුෂයකු සමග ප්‍රේමයෙන් බැඳේ. සියලු සමාජ කුල සිරිත්, සදාචාරය ඇයට එරෙහිව අවි දරන්නේ ඇගේ දිළිඳුකමට පමණක් නොව ස්ත්‍රීත්වයට බව අවධාරණය කිරීම කතුවරියගේ අරමුණ වූ බව පෙනේ.

> ''ජේමිස් මුරකාරයා ආවා..... ඉණෙන් ඇද්දා. කොස් ඇට ටික බිම. හැට්ටෙ ඇද්දා.... සෙදෝනා කෑ මොර දුන්නා. දෙපළු වුණ හැට්ටෙ අල්ලාගෙන කෑ ගසන සෙදෝනා ඉස්සරහ ඉර අව්වට දියවෙන අයිස් කැල්ලක් වගේ ජේමිස් අතුරුදහන් වුණා'' (රණවීර, 1999 : 57).

සෙදෝනාගේත්, දියෝනිස්ගේත් ප්‍රේමය ඵලප්‍රාප්ත වන්නේ මහ රබර්වත්ත මැද ගල්පොත්ත උඩදීය. එක් රාත්‍රියකදී සදාචාරවාදී අධිපතිවාදී මතවලින් ආතුර වූ ගම්මු රබර්වත්ත වටලති. එහි දී සෙදෝනාට සමාජයෙන් ලැබෙන ප්‍රතිචාරය වේදනාකාරීය. සෙදෝනා පවත්නා සංස්කෘතික රාමුවෙන් බැහැරවීම නිසා ඇයට ගමේ සියලු දොරවල් වැසෙයි. පිරිමියා පමණක් නොව ස්ත්‍රීන් අතර ද පවත්නා පීතෘ මූලික බලධාරිත්වය පිරිමියාට වරද පටවන්නේ නැත. මෙහි දී වරදකාරයන් කළ වරද කුමක්ද මිස වරදකාරයා කවරෙක්ද යන්න නොවිමසයි. ස්ත්‍රීවාදීහු මෙම පුරුෂ මූලිකත්වය දැඩි විවේචනයට ලක් කරති. ඊවා රණවීරගේ ලැයිසා, සෙදෝනා නවකතා ද්විත්වයෙන්ම සාකච්ඡා කෙරෙන්නේ ස්ත්‍රීභාවයට එරෙහිව පවත්නා පීතෘ මූලිකත්ව සංකල්පයයි.

සුමිත්‍රා රාහුබද්ධගේ බොහෝ නවකතාවල ද ස්ත්‍රීත්වය පුරුෂත්වය පිළිබඳ ප්‍රකාශන හඳුනාගත හැකිය. උදානය (1979), දළ රළ පෙළ (1981), කෙළිමඬල (1984), සුර අසුර (1986), ඉටි පහන් (1994), අග පිපි මල් (1998) මීන් කෘති කිහිපයකි. කෙළිමඬල නවකතාවේ දේශපාලනඥයකුගේ අනියම් බිරියක වීම නිසා ස්ත්‍රියක් ගෙවන පීඩාකාරී ජීවිතය සාකච්ඡා වේ. උදානය නවකතාවේ දී නොමේරූ මනසක් ඇති දරුවකුගේ මවක ලෙසත් ස්වාමියා විසින් නොසලකා හරින ලද බිරිඳක ලෙසත් සියලු අභියෝග හමුවේ අප්‍රතිහත ධෛර්යයෙන් හා ඒකායන අධිෂ්ඨානයෙන් ජීවිතය ජය ගන්නා ගැහැනියක නිරූපිතය. ඉටිපහන් නවකතාවේ අවජාතක දරුවකු හදාවඩා ගැනීමේ අසීරු අවස්ථාවට මුහුණ දෙන මවක් හා සමාජය විසින් අවතක්සේරු කරන තරුණියක පවතින දේශපාලනය වෙනස් කිරීම සඳහා විකල්ප දේශපාලන ගමනක් යාමත්, නිදහස් ලෙස සිතන ඇය ක්‍රමයෙන් තමා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ දේශපාලන බල අධිකාරියේම ගොදුරක්ව අවසන් ගමන් යන ආකාරයත් නිරූපිතය. 'අග පිපි මල්' නවකතාවේ දික්කසාද වී දරු දෙදෙනෙකු ද සමග දිවි ගෙවන නීතිඥවරියක සිය වෘත්තිමය හා ආත්ම ගරුත්වය උදෙසා කරන අරගල, මවක ලෙස විඳින කායික, මානසික පීඩාවනුත් සාකච්ඡා වේ.

'උදානය' නවකතාවේ අමරා ගමේ වෙද මහතාගේ දියණියයි. විශ්වවිද්‍යාලයේ දී හෙක්ටර් සමග පැවති සබඳතාව නිසා ඇයට විවාහයට පෙර ඔහු නිසා දරු ගැබක් හට ගනියි. අමරා මවක වීමේ දැඩි ආසාවකින් සිටිය ද දරු ගැබ නැති කිරීමට හෙක්ටර් අමරාට යෝජනා කරයි. තම අනාගත ඉලක්ක සඳහා යන ගමනට දරුවා බාධකයක් බව හෙක්ටර් පවසයි.

''මොනව වුණත් මට වාවන්න බෑ හෙක්ටර් මේ පවුකාර වැඩේ අත්හැරලා දාමු හෙක්ටර්. අපි බැන්දම ප්‍රශ්නෙ ඉවරනෙ.
දැන් ඔය ළමයා උපන්නත් වැඩක් නෑ. කොච්චර වස විස කැවද? අංග විකලයෙක් වෙන්නත් බැරි නෑ. අනික මාස හත අටක් යනකන් බදින්න මට කොහොමත් බෑ'' (රාහුබද්ධ, 1979 : 32).

පූර්ව වෛවාහික කාලයේ දී ලිංගික සබඳතා පැවැත්වීම නිසා අවසානයේ පීඩා විඳින්නේ ස්ත්‍රිය බව කතුවරිය අවධාරණය කරයි. පවුල් සැලසුම් ක්‍රම පවා ස්ත්‍රියට පමණක් ඇති වගකීමක් කොට සලකා ඇත. ස්ත්‍රීත්වය සම්බන්ධ පුරුෂ කේන්ද්‍රීය දෘෂ්ටිය ශ්‍රී ලාංකේය සමාජයේ පවතින ස්ත්‍රීත්වය පිළිබඳ ප්‍රතිනිරූපණය කතුවරියගේ නිර්මාණවලින් වඩාත් හොඳින් සාකච්ඡා වේ.

''තමුසේ විශ්වාස කරනවා...... අපේ මිසිස් ඉන්නවා නේද? වචනයක් කතා කරන්නෙ නැහැ. මං ...... හ්ම් කිව්වොත්. අනික ඔය බහුභූත ආරලු බූරලුත් නැහැ එයා ගාව. පොඩ්ඩක් සෝෂල් මදි උනාට..... ඒක හොඳයි.....'' (රාහුබද්ධ, .....).

සුමිත්‍රාගේ **'දළ රළ පෙළ'** කෘතියෙහි දී පියාගේ බලපෑම මත මහලු පුද්ගලයෙකුට බිරිය වීමට අකමැති වීම නිසාත් කුසගින්න හා බැඳුණු පීඩා නිසාත් පබාවතී නිවසෙන් පිටවෙයි. අවසානයේ මෙහෙකාරියක ලෙස සේවයට ගිය ඇයට නිවසේ ධනවත් මහල්ලාගේ අනියම් බිරිය වීමට සිදු වේ. එහි උත්ප්‍රාසාත්මක කාරණය වනුයේ තම බිරිඳගෙන් ලබා ගැනීමට නොහැකි වූ කන්‍යාභාවය පිළිබඳ සලකුණ දැකීමට ඔහු තුළ නිදන්ගතව පැවති කැමැත්ත පබාවතීගෙන් සපුරා ගැනීමයි. ඔහු නිසා පබාවතිය ගැබ් ගැනීමත්, නිවැසියන්ගේ වෙනස්කම්වලට මුහුණදීමට සිදුවීමත් නිසා ඇය බෙහෙවින් අසරණ වේ. අවසානයේ නීත්‍යානුකූල විවාහයේ සැමියා සියදිවි නසා ගැනීමත් නිසා දරු දෙදෙනෙකු සමග තනි වීමට පබාවතීට සිදු වේ.

ස්ත්‍රියට එරෙහිව පවත්නා පුරුෂ හිංසනය යනු හුදෙක් ඇයට එරෙහිව ක්‍රියාත්මක වන බලයේ එක් ස්වරූපයක් පමණක් බවට ස්ත්‍රීවාදීහු අර්ථකථනය කරති. හිංසනය, තර්ජනය මගින් පුරුෂ මූලිකත්වයට එරෙහිව කාන්තාවගේ පාර්ශ්වයෙන් එල්ල විය හැකි අභියෝග නැති කර දැමිය හැකිය. එමෙන්ම ඇය තව දුරටත් සාම්ප්‍රදායික රාමුව තුළ සිරගත කළ හැකිය.

''ඒක යස කතාවක්නේ....ඒ මිනිහා හැට පැහිච්ච මිනිහෙක්. මේකි ඇබින්දන් කෙල්ල. ඒකි ගෙදර හිටපුවාවෙ. අම්මා එදා තාත්තා සමග හරි හරියට කතා කළාය. පඳුරි..... තෝ එනවද මාත් එක්ක කට ගහන්න.... තෝ මරල හංගනවා කැලේ.....අම්මපා..... වහපිය කිව්ව කට...... අම්මා එදා තාත්තාගෙන් වෙනදාට වඩා ගුටි කෑවාය'' (රාහුබද්ධ, 1998 : 20).

පියාගේ පහර කෑමට ලක් වන මවත්, මෙහෙකාර සේවයේ යෙදෙන නිවසේ විජේවර්ධනගෙන් පහර කන මෝනා නම් බිරිඳත් ගෘහස්ත හිංසනය පිළිබඳ ප්‍රබල නිදසුන්ය. පබාවතිය ළමා කාලයේ පියාගෙන් ද මෙහෙකාර සේවයේ දී විජේවර්ධනගෙන් ද විවාහයේ දී වීරසේනගෙන් ද හිරිහැර විඳියි.

> ''ලෝකයේ සෑම තැනකම පවතින ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ වෙනස්කම් බොහෝ විට පීතෘ මූලික වේ. මෙම වෙනස්කම් නිසා පිරිමින්ගේ ආධිපත්‍යය තහවුරු වන අතරම පිරිමින්ට වාසිදායක ද වේ'' (භාසින්, 2009 : 36).

දේශපාලනඥයෙකුට අනියම් බිරිය වීම නිසා දුක උරුම කර ගත් ගැහැනියකගේ කතාවක් කෙළිමඩල නවකතාවට විෂය වී ඇත. පස් අවුරුද්දක් රංජනී සමග පෙම් බැඳ සිටි පූජිත තෙන්නකෝන් සමරා නම් ධනවත් තරුණිය විවාහ කර ගනියි. එහෙත් ප්‍රේම සම්බන්ධය ද විවාහය සමග දිගටම පවත්වාගෙන යාම නිසා රංජනීට දියණියක් ද සමරාට දරු තිදෙනෙක් ද උරුම වෙති. රංජනීට දරු ගැබක් හටගෙන ඇති බව දැනගත් විට එය නැති කිරීමට පූජිත උත්සාහ කිරීමෙන් ගැටුමක් හට ගනියි.

> ''ඇයි මේ අනාචාරයට ස්ත්‍රී පුරුෂ භේදයක්. පිරිමියෙක් රස්සාවෙන් දොට්ට දාලා නෑ අනියම් බිරියට ළමයෙක් හම්බවුණාය කියලා. පූජිත මේ ඔක්කොම සම්ප්‍රදායවල්. සදාචාර කතා, මොකද එක පැත්තකට විතරක් ඇයි?
> විමුක්තිකාරියන්ට ඕකට විරුද්ධව සටනක් ආරම්භ කරන්න බැරියැ. ඔය ඉන්නෙ කලිසම් ඇඳගෙන තොප්පි දාගෙන තොල් රතු කරගෙන. සමතැන් ඉල්ල ඉල්ලා ගෙනියන්න පුළුවන්නෙ ව්‍යාපාරයක්. ආදරෙන් මුලා වී වැටෙන්න එපාය කියලා කියමින් පූජිත හඬ නගා සිනාසුණේය'' (රාහුබද්ධ, 1984 : 68, 69).

සුමිත්‍රා රාහුබද්ධගේ 'සුර අසුර' නවකතාව ත්‍රස්තවාදය විසින් බෙදා වෙන් කොට පාලනය කරනු ලැබීමේ උපක්‍රමශීලී ප්‍රතිපත්තියට ගොදුරු වූ සහෝදර ජනතා කොටස් දෙකක සම්බන්ධතාව ඇසුරු කර ගත්තකි. සුරනිමල පරිපාලන නිලධාරියකු ලෙසත්, ලක්ෂ්මී ද්‍රවිඩ වෛද්‍යවරියක ලෙසත් ප්‍රේමයෙන් බැඳී විවාහයකින් එක් වන්නේ වැඩිහිටි විරෝධතා මධ්‍යයේය. එහෙත් ලක්ෂ්මී තම රෝහලේ සේවය කරන රොමේෂ් සමග හිතවත් වීම සුරනිමල දකින්නේ පතිද්‍රෝහී වීමක් ලෙසිනි. සුරනිමලගේ දැඩි ආධිපත්‍යය නිසා ලක්ෂ්මීට මුහුණදීමට සිදු වන ඛේදජනක අත්දැකීම් 'Prtrayed of women in Sri Lanka' කෘතියේ දැක්වේ.

සුමිත්‍රාගේ ඉටිපහන් නවකතාව ප්‍රධාන වශයෙන් ස්ත්‍රීත්වය තේමා කර ගත්තකි. හීන්අප්පු සමග විවාහ වී සිටින දුලිනා නගරයේ සුදු ඒජන්තගේ නිවසේ මෙහෙකාර සේවයට ගොස් දියණියක ද රැගෙන ගමට පැමිණෙයි. එම දියණිය වන ඩේසි සුසන් හෙවත් සෝමේ ගමේ හැලහැප්පීම්වලට මුහුණදෙමින් අධ්‍යාපන කටයුතුවල යෙදුණ ද එම සමාජ සංස්කෘතිය

ඇයට හිස එසවීමට ඉඩ නොදෙයි. විවිධ හිරිහැරවලට එරෙහිව දේශපාලන වශයෙන් නැගී සිටීමට ඇය උත්සුක වන්නේ එබැවිනි. අවසානයේ හමුදා නිලධාරියකු වන නියතපාල සමග විවාහ වන ඩේසි විවිධාකාර අභියෝගවලට මුහුණදෙයි.

> ''මෙහෙන් මාව අල්ලගෙන ගිය දවසෙම පොලීසියේ ලොක්කෙක්.... ලොක්කෙක් නෙවෙයි උෟ බල්ලෙක්.... උෟ කිසිම අනුකම්පාවක් නැතුව මාව නන්නත්තාර කළා. ඊට පස්සෙ විඩෙන් විඩේ මාසයක්...... හමාරක් පොලීසියෙ එවුනුයි...... තව තවත් එවුනුයි මාව හප කළා'' (රාහුබද්ධ, 1994 ඃ 193).

සෝමේ පොලිස් අත්අඩංගුවේදී ගැහැනියක වීමත් දූලීනා සහ සෝමේ පිළිබඳ ගමේ පවත්නා කතාබහත් නිසා සෝමේගේ සැමියා වන නියතපාල ක්‍රෝධයෙන් හා කලකිරීමෙන් පසුවෙයි. දේශපාලනය ගැන උනන්දු වීම ඊට ප්‍රායෝගිකව මැදිහත්වීම පිරිමියා සතු අයිතියකි. පිටත ලෝකය සමග සම්බන්ධතා පැවැත්වීමේ නිදහස පිරිමියා සතුය. පවුලක දෛනික පැවැත්ම පිළිබඳ වගකීම සම්පූර්ණයෙන් බාර වනුයේ කාන්තාවටය. නියතපාලට අවශ්‍ය වූයේත් සෝමේ මගහැර සිටියේත් මෙම කාර්යයන්ය. අවසානයේ නියතපාල දූලීනාටත්, සෝමේටත් පහර දී සියදිවි නසා ගනියි.

ගෘහ ප්‍රචණ්ඩත්වය මුදා හැරීමට පුරුෂයා මූලික වන අතර, එහි ගොදුර බවට පත් වන්නේ කාන්තාවයි. පුද්ගලයා තුළින් ප්‍රචණ්ඩ බව ඇතිවීම හා ඉස්මතු වීම කෙරෙහි ඔහු ජීවත්වන සමාජයේ පවතින සමාජ, ආර්ථික, දේශපාලන මූලයන් මගින් නිර්මාණය කරනු ලබන මානසික පසුබිම ප්‍රබල බලපෑමක් ඇති කරයි. නියතපාල පමණක් නොව සෝමේ ද මෙයට ගොදුරු වෙති. මෙම ප්‍රචණ්ඩත්වයට හේතුව ලෙස දැකිය හැක්කේ ගෘහය තුළ ක්‍රියාත්මක වන බලය, පාලනය හා අධිකාරිත්වය ස්ත්‍රී-පුරුෂ භේදය මත ක්‍රියාත්මක වීමයි. එසේම කාන්තාව පුරුෂාධිපත්‍යයට එරෙහි වීම ප්‍රචණ්ඩත්වයට බලපාන ප්‍රධාන හේතුවක් වෙයි.

> ''කාන්තාවන්ට එරෙහි හිංසනය යනුවෙන් අදහස් වන්නේ කාන්තාවන්ට කායික, මානසික හෝ ලිංගික හානියක් සිදුවන හෝ සිදුවිය හැකි ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ ඕනෑම ක්‍රියාවකි. ඊට සමාජීය හෝ පෞද්ගලික ජීවිතයේ දී එවැනි ක්‍රියා කිරීමේ තර්ජනයන්, බලකිරීම් හෝ හිතුවක්කාර ලෙස නිදහස අහිමි කිරීම ද අයත්ය'' (බීජං ප්‍රකාශනය, 1996 ඃ 85).

අවුරුදු දොළහක යුග දිවිය නිමා කර ගයාන්, ශානි නම් දරු දෙදෙනා ද සමග නිවසින් බැහැර වන අමා නම් නීතිඥවරියගේ කතාව 'අග පිපි මල්' නවකතාවට විෂය වී ඇත. දික්කසාද වූ ස්ත්‍රියකට පවත්නා සමාජ සම්මතයන් අභියෝගාත්මකව බලපෑම් කරන ආකාරය මෙහි වඩාත් ප්‍රබල අන්දමින් නිරූපිතය.

''අසිත මෙන්ම සමාජයෙහි ඉහළ ස්තරයන්හි සිටින පිරිමි ද සමාජයේ පහළම ස්තරයන්හි සිටින පිරිමින් ද සිතන්නේ සමාජයේ සුක්කානම ඔවුන් අත ඇති බවය. ගැහැනියක වශයෙන් ඉපදීමෙන් උපතින්ම අඩු සමාජ තත්වයක් ගැහැනු ළමයා රැගෙන එන්නේ යැයි අමා සිතුවාය. ඉදින් ඒ දරුවා හැදී වැඩිය යුත්තේ ගැහැනුකමේ එම සීමාවන්ට යටත්වය. ඒ සීමාවන්ගෙන් පිටතට එබිකම් කළහොත් සමාජයේ ගල් පහරට දූන හෝ නොදූන ගොදුරු වන්නට සිදු වේ'' (රාහුබද්ධ, 1994 : 229).

සිංහල නවකතාවේ අභිවර්ධනයට දායකත්වය දැක්වූ ප්‍රධාන ලේඛකයකු වන කේ. ජයතිලක තම නිර්මාණ මගින් ලාංකේය ගම, පවුල, පුද්ගල සම්බන්ධතා, සමාජ දේශපාලන වෙනස්වීම් ස්පර්ශ කරයි. කේ. ජයතිලකගේ පරාජිතයෝ (1955) නවකතාවෙන් නිර්මාණකරණයට ප්‍රවිෂ්ට වී චරිත තුනක් (1963), අප්‍රසන්න කතාවක් (1963), දෙලොවට නැති අය (1964), පිතාමහ (1966), මායා මාළිගා (1974), මතු සම්බන්ධයි (1975), රාජපක්ෂ වලව්ව (1980), පුංචිරාලගේ මරණය (1986), මහල්ලකුගේ ප්‍රේම කතාව (1992), අධිෂ්ඨාන (1992), කාලෝ අයංතෙ (1994), පියා සහ පුත්තු (1997) වැනි කෘති රචනා කළේය.

විසිවන සියවසේ මුල් භාගයේ දී බස්නාහිර පළාතේ පිටිසරබද ගමක විසූ පවුලක තොරතුරු 'පිතාමහ' කතාවෙන් ඉදිරිපත් වේ. පිරිමි දරුවන් පස් දෙනෙකු හා ගැහැනු දරුවන් පස් දෙනෙකු සිටින මෙම පවුලේ පුතුන්ට පමණක් අධ්‍යාපන අවස්ථා ලබා දෙයි. පියාගේ ආධිපත්‍යය, තේජස මෙන්ම මවගේ අනුවණකම් හා යටහත්පහත්භාවය ද කතුවරයා කථකයා ලවා ඉස්මතු කරවයි.

''අම්මා නුවණක්කාර කාන්තාවක වනුයේ වරින් වර පමණකි. එසේ නොවන විට දී වරින් වර ඈ කෙරෙන් ද සාම්ප්‍රදායික හැදිමිටි මතුවීමට බැරිකමක් නැත'' (ජයතිලක, 1982 : 84).

කාලෝ අයංතෙ වැනි නවකතාවල ගැමි පරිසරයක ජීවත්වන පුද්ගල සමූහයකගේ සමාජ, ආර්ථික, සංස්කෘතික, ලිංගික හැසිරීම් විවෘතව සාකච්ඡා කරයි. ගිල්බට් නමැති කතා නායකයා හාමිනා, ජයවතී, බක්කි අම්මා, රාළහාමි වැනි පුද්ගල චරිත මෙහි ප්‍රධාන වේ. ස්ත්‍රීත්වය පිළිබඳ කතුවරයාගේ හැඟීම්, ආකල්ප, ඍජුවම ඉදිරිපත් වේ.

''උඹ හිතන විදිහෙ කෙල්ලක් නෙවේ ඒකි. ඒකි හොඳ හැදුණු කෙල්ලක්. නටන කෙල්ලෝ අතරෙ ඉන්නවද හැදුණු එවුන්. අහක ඉන්න නැහැදුණු එවුන්ටත් කියන්නෙ නැට්ටුක්කාරියො කියල බව උඹ දන්නෙ නැද්ද?'' (ජයතිලක, 1974 : 46).

ජීවිතයේ සැඳෑ සමයේ හුදකලාව විසින් කායික, මානසික පීඩනයට ලක් කරන ලද දෙමාපියන්ගේ කතාන්දරය පුංචිරාළ නවකතාවට තේමාව වී ඇත. සුවිමලී සහ නන්දන දරු දෙදෙනාට අධ්‍යාපනය ලබා දී, සමාජයේ ඉහළට ඔසවා තැබීමට දෙමාපියෝ සමත් වෙති.

පුංචිරාලගේ මරණය නවකතාවට ඇසුරු කර ගන්නේ එම දරුවන්ගේ විවාහ ජීවිත හා බැඳුණු ගැටලුය. පුංචිරාල හා පොඩිනා අඹු සැමියන් ලෙස ගත කළ නිදහස් සන්සුන් ජීවිතය විපරිණාමයට ලක් වී දරුවන්ගේ ලෝකය අතෘප්තිය, අසහනය, පීඩාව වෙලාගෙන ඇති ආකාරය දැකිය හැකිය. සමාජය හා පවුල තුළ සිදු වූ පුළුල් වෙනස්කම් කාන්තාවගේ ස්වාධීනත්වයට බලපෑම් කර ඇත.

'පුංචිරාලගේ මරණය' නවකතාවෙන් සාකච්ඡා කෙරෙන්නේ නන්දනගේ බිරිඳ වන රේණුකාට විදුහල්පති ධුරයක් ලැබීම නිසා පවුලේ ඇතිවන ගැටුම් හා අර්බුදයි. මව නිවසේ නැති අවස්ථාවලදී පියා ඉවුම් පිහුම් කටයුතු කිරීම තරුණ පුතාගේ කෝපයට හේතු වේ.

> ''ඒ ගෑනිට මකබෑ වෙන්න කියනවා. තාත්තා උයල දුන්නට මම බත් ඇටයක් කන්නෙ නෑ. අපියි තාත්තට උයලා දෙන්න ඕන'' (ජයතිලක, 1986 : 133).

ප්‍රාථමික වූත්, ඉතා බලවත් වූත්, ඒකකය පවුල බව සඳහන් කරන ජයතිලක 'පියා සහ පුත්තු' නවකතාවේ දී උත්සාහයෙන් හා ධෛර්යයෙන් දියුණු වූ අසේල තමා උපයා ගත් දේපල පුතුන් දෙදෙනාගේ ලේලිවරුන් විනාශ මුඛයට ගෙන යනු දැක ඇති වූ කම්පනය නිසා නිවස හැරදා යයි. ජයතිලක තමාගේ හැම නවකතාවකින්ම පාහේ ස්ත්‍රියගේ ද්විතියිකභාවය සහතික කරයි.

'මහල්ලකුගේ ප්‍රේම කතාව' නවකතාවෙහි නිර්මාණශීලී ජනප්‍රිය ලේඛකයකු වන සමරනායක පරිපාලන නිලධාරිනියක වන බිරිඳගේ කාර්යබහුල බව නිසා තම අවශ්‍යතා සපුරා ගැනීමට විමලා නම් තරුණිය යොදා ගනියි. ස්වාමිපුරුෂයාගේ කායික, මානසික අවශ්‍යතා සපුරාලීම බිරිඳගේ අනිවාර්ය වගකීමක් කොට අදහස් ඉදිරිපත් කරයි.

කේ. ජයතිලක 'චරිත තුනක්' නවකතාව මගින් ද බස්නාහිර පළාතේ පිටිසර ගමක ජීවත් වූ සහෝදරයන් තිදෙනෙකුගේ ජීවිත කතාන්තරය ඉදිරිපත් කරයි. එසමයෙහි ස්ත්‍රීන්ගේ අධ්‍යාපනික පසුබිම මෙම නවකතාවෙන් පැහැදිලිව හඳුනාගත හැකිය.

> ''නංගිට ඉගෙන්වීමේ අදහසක් අම්මා හෝ තාත්තා තුළ නොවීය. අපේ ගොඩැල්ලෙන් කිසිම ගැහැනු ළමයෙකු පාසැල් ගියේ නැත. ගෙදර ගොම මැටි ටිකක් ගාගෙන වළඳක් රත් කරගෙන ඉන්ට මොන අකුරු ද වැඩිහිටියෝ තර්ක කළහ'' (ජයතිලක, 1963 : 63).

කෙසේ වුවද කුඹුරු වැඩවලදී ස්ත්‍රිය පුරුෂයා හා සමග කරට කර වැඩ කළ බව මෙහි සඳහන් වේ. ගෘහ කටයුතුවල මෙන්ම කෘෂිකාර්මික කටයුතුවල ද ස්ත්‍රියගේ ශ්‍රම සහභාගිත්වය විධිමත් රැකියා අංශයක් ලෙස වර්ග කර නොමැති වීම මෙයට හේතුව විය හැකිය.

දේශපාලන තේමාවක් ඇසුරු කර ගත් 'රාජපක්ෂ වලව්ව' මගින් ද ප්‍රතිනිර්මාණය කෙරෙන්නේ ශ්‍රී ලංකාවේ වලව් පන්ති අතර හුවමාරු වූ තට්ටු මාරු දේශපාලනයයි. මෙහි ද දැකිය හැක්කේ ප්‍රබල පුරුෂ චරිත පමණි. දෙලොවට නැති අය, මතු සම්බන්ධයි නවකතාවල ද මෙම ලක්ෂණ පැහැදිලිව දැකිය හැකිය. පුරුෂත්වය හා බැඳි නායකත්වය, බලය, පාලනය, අධිකාරිත්වය සියල්ලම පීතෘ මූලික දෘෂ්ටි වේ. සමස්තයක් ලෙස බලන විට ජයතිලකගේ නවකතාවල පුරුෂ චරිතය ප්‍රධාන වේ. අධ්‍යාපන, සමාජ, දේශපාලන කිසිදු කරුණකදී ඇය මූලිකත්වයේ තබා නැත. ඓතිහාසික සමාජ සම්මත රාමුව මතුයෙහි ස්ත්‍රීත්වය ස්ථානගත කර ඇත.

සිංහල නවකතාවේ හැට දශකය නියෝජනය කරන ටෙනිසන් පෙරේරා තම නිර්මාණ මගින් පුළුල් සමාජ, දේශපාලන පසුබිමක් ආවරණය කරයි. **දුක් ගින්දරක් මැදින්** (1960)**, විප්ලවය** (1963), **පහන් කන්ද මුල අඳුර** (1964), **දුටිය ගාමිණී නොමළ වගයි** (1969), **නික්මන** (1990), **පද්මිණීලා, තිවංකලා** (1990), **පද්මිණීලා, තිවංකලා, රසිනලා** (1990), **සතුරු සේනා** (1991), **මම රාජාභරණ** (1992), **අග්නි කල්පය** (1993), **ගිරිදුර්ග** (1993), **චක්‍රවර්ති** (1995), **සත්‍යවාදීන්ගේ මරණ මංචකය** (1998) මින් කිහිපයකි.

ටෙනිසන් පෙරේරාගේ 'දුටිය ගාමිණී නොමළ වගයි' නවකතාවට පෙරවදනක් ලියන සුනිල් විජේසිරිවර්ධන,

> ''නූතන කැරලිකරුවා අපූරු සත්වයෙකි. විප්ලවවාදියා නම් දරන ඔහු අසම්ප්‍රදායික ජීවිතයක් සඳහා ද පරාධීනත්වයට එරෙහිව ද සකලවිධ පීඩනයට එරෙහිව ද ප්‍රසිද්ධියේ පෙනී සිටින නමුත් ඔහුගේ නිවහන තුළ පැරණි වහල් ගැහැනියම බිරිඳගේ වේශයෙන් පෙනී සිටී'' (පෙරේරා, 1992 : XIV).

මිස් නාහේන, දියසේන හා ඔවුන්ගේ ජීවිතවලට සම්බන්ධ වන ශ්‍රද්ධාසේන පිළිබඳ කතාන්තරය සමාජ, සංස්කෘතික, ආර්ථික, දේශපාලනික විෂමතා හෙළි කරන්නකි. ස්ත්‍රීත්වය පහත් කොට සලකන ආගමික, සංස්කෘතික පද්ධති තුළින් නිරතුරු පීතෘත්වයට ඉහළ අගයක් ලබා දෙයි. ස්ත්‍රියකගේ ජීවිතයේ තීරණාත්මක අවස්ථා වන ප්‍රේමය, විවාහය, කන්‍යාභාවය, ප්‍රජනනය, උපත් පාලනය යන අවස්ථා පුරුෂ මූලිකත්වයට යටත් වන ආකාරය මෙහි නිර්මිතය.

> ''ඔහෙට ඕන මෙයාද? මෙයාද? මෙයාද? රූප, ගීතා, චමලී, රමණී, අතිරමණී'' (පෙරේරා, 1992 : 22).

ටෙනිසන් පෙරේරාගේ පද්මිණීලා, තිවංකලා (පළමු කොටස), පද්මිණීලා, තිවංකලා, රසිනලා (දෙවන කොටස) කතා වස්තුවලින් කියවෙන්නේ තිවංකගේ ජීවිතයට එක්වන ගැහැනුන්ගේ

ඉරණමයි. රමණී, මෙත්තා, පද්මිණී, රසිනා යන ගැහැනු සමග විවාහය හා ඉන් පරිබාහිරව පවත්නා ලිංගික සම්බන්ධතා මෙහි නිරූපණය වේ. රැඩිකල් ස්ත්‍රීවාදීන්ට අනුව පීතෘ අධිපතිත්වය යනු ස්ත්‍රියගේ සශ්‍රීකත්වය පිරිමියාගේ පාලනයට නතු වීමයි. බුදු දහමේ දක්වෙන ආවේණික දුක්ඛ සූත්‍රය හා සමානව ඉස්ලාම් දහමේ පරිපාලනය පිරිමින්ට පමණක් යන්න අල්ලාහු පවසන බව ඉහ්සාන් පවසයි.

> ''අල්ලාහු නආලා පිරිමින් මෙන් ගැහැනුන් මැව්වේ නැත. ගැහැනු අතර බෙලහීනතාවන් සමහරක් ඇත. ස්ත්‍රිය ශක්තියෙන් හා ස්වභාවයෙන් බෙලහීන වන්නීය. ඇයට මාසික ඍතුව, දරු ප්‍රසූති ඍතුව ඇති වන්නේය. ගැබ් ගන්නීය. කිරි දෙන්නීය. මෙලෙස කරුණු රාශියක්ම ඇයව බෙලහීන කරන්නේය...... පිරිමින් ගැහැනුන් පාලනය කරන්නෝය'' (සුරතුන් නිසා, 34, ඉහ්සාන්, 2008 : 10).

'සතුරු සේනා' නවකතාවේ දී විශ්වවිද්‍යාල ආචාර්යවරයකු වන යෝගේෂ්වරම්, බිරිඳ තංගම්මා, පුත් කෘෂ්ණාගේ ජීවිතවල පවත්නා අර්බුද විවෘතව ඉදිරිපත් කරයි. කෘතිය පුරාම දැකිය හැක්කේ තමා සතු බලය සහ ආධිපත්‍යය මතින් ස්ත්‍රීත්වය යටපත් කරන ආකාරයයි. ලිංගිකමය වශයෙන් ඉතා ක්‍රියාශීලීව හැසිරෙන කාන්තාව පුරුෂයා විසින් හෙලාදකිනු ලබන අතර එහි අකර්මණ්‍ය හා උදාසීන කාන්තාව ඒ සඳහා බලෙන් යටපත් කර ගනියි. එමෙන්ම පුරුෂයා තමාගේ ලිංගික ශක්තිය හා හැකියාව පිළිබඳව ආඩම්බර වෙයි. ස්ත්‍රියට එරෙහිව පැතිරී ඇති පුරුෂ හිංසනය යනු හුදෙක් ඇයට එරෙහිව ක්‍රියාත්මක වන බලයේ එක් ස්වරූපයක් පමණක් බව ස්ත්‍රීවාදීන්ගේ අදහසකි.

ටෙනිසන් පෙරේරාගේ 'ගිරිදුර්ග' නවකතාව පුරුෂ මූලික දෘෂ්ටියෙන් නිර්මිතය. විදෙස් රැකියාවක් සඳහා මැදපෙරදිග ගිය බිරිඳ මෙහි ප්‍රධාන චරිතය වේ. මෙහි දී කර්තෘවරයා ස්ත්‍රීත්වය හා පුරුෂත්වය පිළිබඳ සීමා මායිම් වෙන් කර ගනියි.

> ''අම්මා බුදු වේවා, ගෑනු බුදු වෙනවද? බෝධිසත්වවරියක් ගෑනුන්ට මොස්ක් තහනම්, එහෙ දෙයියො පුරුෂාධිපත්‍යයට පක්ෂයි. දෙයියන්නාන්සේ පිරිමියෙක් ද? ගෑනියෙක් ද? ලිංගභේදයක් නෑ. ඒත් පුරුෂ හෝමෝන වැඩියි'' (පෙරේරා, 1993 : 25, 40).

'සත්‍යවාදීන්ගේ මරණ මංචකය' නවකතාව එක්දහස් නවසිය හැත්තෑඑකේ අප්‍රේල් කැරැල්ල ඇසුරු කරගෙන රචනා කර ඇත. මෙහි කතා නායකයා පුවත්පත් ලේඛකයෙකි. ඔහු ලියන පොතේ ප්‍රධාන චරිතය මැජික්කාරයෙකි. සාහිත්‍ය කලාව, ඉතිහාසය, දේශපාලනය හදාරන කථකයා තම බිරිඳ වන රමණී විග්‍රහ කරන්නේ විකට් එකට බෝලය එල්ල කළ තරුණයන්ගේ දස්කම් ගැන කතා කරන අගතියෙන් කුණු වූ හැම දෙයක්ම සුවඳ විලවුමක් සේ ඇඟපතේ ගා ගැනීමට ප්‍රිය කරන්නියක් ලෙසිනි. ටෙනිසන් පෙරේරාගේ ප්‍රථම නවකතාව වන දුක්

ගින්දරක් මැදින්' කෘතියෙහි උපාලි නම් කතා නායකයා ළමා වියේ සිට වින්දේ දුක් කරදර සහිත ජීවිතයකි. උපාලි කුඩා කාලයේ දී මව පියාට කරන අතවරත්, උපාලිගේ තරුණ වියේ දී ඇසුරට පත්වන සෝමා, රමණී පිළිබඳ සිතුවිලිත් කතාව ආරම්භයේ සිට අවසානය දක්වා විකාශනය වේ.

> පරට්ටී, පරට්ටී, මහා පරට්ටී
> මොකද පරට්ටියේ කතා නැත්තේ.... තොට එක එකා එක්ක නම් ඕන තරම් කතා කරතැකි'' (පෙරේරා, 1965 : 2, 13 පිටු).

බීමට ඇබ්බැහු වූ පියෙකු නිසා පීඩාවිඳින මවක හා පුතෙකුගේ ජීවන වෘත්තාන්තය මෙහි ඉදිරිපත් වේ. පිරිමි ආධිපත්‍යය නිසා පීඩාවිඳින ස්ත්‍රී ජීවිත මෙහි දැකිය හැකිය.

> ''පියා මගින් කතුවරයා පෙන්වන්නේ පුරුෂාධිපත්‍යයයි. පුරුෂයා විසින් ස්ත්‍රිය පීඩනයට පත් කරන ආකාරයයි'' (තෝරදෙනිය, 2018 : 151).

කතුවරයාගේ අදහස් ඉදිරිපත් කිරීම්වල පීතෘවාදී නැඹුරුව පැහැදිලිව ගම්‍යමාන වේ. එහි දී සංස්කෘතිය නීතිය, ආගම, දේශපාලනය, ආර්ථිකය, ඉතිහාසය, අධ්‍යාපනය යනාදී හැම අංශයකම පීතෘ මූලික බල ව්‍යූහය ක්‍රියාත්මක වන ආකාරය දැකිය හැකිය.

සිංහල නවකතාවට දායක වී ඇති ප්‍රධාන පෙළේ ලේඛක ලේඛිකාවන් හතර දෙනාගේ නිර්මාණ සසඳා බලන විට පැහැදිලිව දැකිය හැකි ලක්ෂණයක් නම් ලේඛිකාවන් ස්ත්‍රීත්වය ප්‍රධාන කොටත්; ලේඛකයන් පුරුෂත්වය ප්‍රධාන කොටත් තම නිර්මාණ ඉදිරිපත් කර ඇති බවයි. සමස්තයක් ලෙස බලන විට මෙම නිර්මාණ බොහොමයකට පසුබිම් වී ඇත්තේ මධ්‍යම පන්තික පවුලයි. ලොව පුරාම දරුණු ලෙස පීඩාවට පත්වන ජන කොටස් අතර ස්ත්‍රිය කැපී පෙනෙන බවත් එය ඇයගේ අධ්‍යාපනය, පෝෂණය, සෞඛ්‍ය, ආරක්ෂාව, රැකියාව යනාදී සියලුම අංශවලට බලපෑම් කරන බවත් ස්ත්‍රීවාදීන්ගේ අදහසකි. මේ තත්වය නිර්මාණය වනුයේ පීතෘ මූලික සංස්කෘතිය ප්‍රධාන කොට ගෙනය.

> ''භාෂාව සංස්කෘතිය මෙන්ම එහිම උපාංග වන සාහිත්‍ය කලාවන් ද පුරුෂ නිර්මිතයක් බවත් මෙතුවක් සමස්ත සාහිත්‍ය ඉතිහාසය පුරාම ස්ත්‍රිය නිරූපණය වී ඇත්තේ පුරුෂ දැක්මට අනුව බවත් ස්ත්‍රීවාදීහු දැක්වූහ. පුරුෂ කේන්ද්‍රීය සමාජ සංස්කෘතික නිර්මිතය තුළ සිය පරාරෝපිත බව විමසීමත් (අනන්‍යතාව සොයා යාමත්) ස්ත්‍රීවාදී විචාරය තුළින් මෙන්ම නිර්මාණ මගින් ද අරමුණු කෙරිණ'' (සමන් කුමාර, 1999 : 32).

නිදසුනක් ලෙස සුමිත්‍රා රාහුබද්ධගේ ඉටි පහන් හි සෝමේ පවත්නා සමාජ, දේශපාලන, ආර්ථික පීඩනයන්ට එරෙහිව උඩුගං බලා යන ගැහැනියකි. ඇය අවසානයේ ජීවිතයෙන්

වන්දි ගෙවන්නේ ද පුරුෂ මූලිකත්වයට එරෙහිව යාමේ ප්‍රතිඵලයකිනි. නීත්‍යානුකූල පීතෘත්වය අහිමි වීම නිසා ළමා වියේ සිටම පීඩාකාරී අත්දැකීම් ලබන ඇය පීතෘ මූලික නියමයන් ඉදිරි පරපුර වෙත සම්ප්‍රේෂණය කිරීමේ නොහැකියාව නිසා ජීවිත ගමන නිමා කරයි. සෝමේ ස්ත්‍රී ගතිලක්ෂණවලින් බැහැර වීමත් සමාජය ඇය බැහැර කිරීමට ප්‍රධාන හේතුව වේ. ආර්ථික, දේශපාලන, ආගමික, සමාජ හා සංස්කෘතික ආයතන සියල්ලෙහිම පාලනය පුරුෂයා මත රැඳී ඇති බවට මෙම නිර්මාණ සාක්ෂ්‍ය දරයි. ස්ත්‍රියකගේ ශ්‍රම ශක්තිය, ප්‍රජනන ශක්තිය, සංචලතාව, දේපල හා ආර්ථික සම්පත් යනාදී සියල්ල පිරිමියා විසින් පාලනය කරනු ලබන ආකාරය කේ. ජයතිලකගේ හා ටෙනිසන් පෙරේරාගේ නිර්මාණ හදාරන විට සාක්ෂාත් වේ. එමෙන්ම පීතෘ මූලිකත්වයට අවනත වීමේ වැදගත්කම ලේඛක නිර්මාණවල ඍජුව ප්‍රකාශ නොවුවද සමස්ථාර්ථයෙහි යටි පෙළෙහි පැහැදිලිව විද්‍යමාන වේ. ස්ත්‍රී-පුරුෂ සමාජභාවය එක්තරා විෂම ලක්ෂණයක් ලෙස පොදුවේ මෙම නවකතාවල දැකිය හැකි සංකල්පයකි. ගෑනු ගති, උතුම් කාන්තා ගුණ, චපල ගැහැනිය, කිරි මව, නූගත් ගැහැනිය, වදක භාර්යාව යන හැම අර්ථයක්ම සංකල්ප රූපයක්ම (image) ලෙස ස්ථානගත වී ඇත. එහෙත් පිරිමියා මේ ආකාරයෙන් සංකේතවත් කර නැත. ඊට හේතුව මනුෂ්‍ය හා මානුෂික වශයෙන් සලකන හැම දෙයක්ම අවිඥානිකව පුරුෂ කේන්ද්‍රීය වීමයි. පිරිමියා සහ පිරිමි මතවාදය සර්ව බලධාරී දෙවියන් ලෙස වැඩ හිඳීමයි. ස්ත්‍රිය භාෂාව හෝ කතිකාව ඔස්සේ සම්පාදනය කර ඇත්තේ ඒකාකෘති (stereotype) අර්ථය නැතහොත් මනෝ විද්‍යාත්මක වශයෙන් පරිපූර්ණ වූ (psychologically rounded) අර්ථයයි. ඊවා රණවීරගේ සෙදෝනා නවකතාවේ විවාහක පුරුෂයකු සමග පෙමින් බැඳීම නිසා සෙදෝනා අපවාදයට ලක් වුවත් වියපත් වූ විට කිරි අම්මාවරුන්ගේ දානයකට ඇරයුම් ලැබීම විවාදසම්පන්නය.

ස්ත්‍රීවාදී දෘෂ්ටියක පිහිටා සමාජය තේරුම් ගැනීමට යාමේදී පුරුෂාධිපත්‍ය සංකල්පය එහි කේන්ද්‍රය ලෙස ස්ත්‍රීවාදීහු විශ්වාස කරති. ස්ත්‍රියට එරෙහි පීඩාකාරී තත්වයන් පවත්නා බවට නවකතා රචිකාවියන් තම නිර්මාණවලින් හැඟවුම් කළ ද පුරුෂ මූලික ස්වභාවයේ නිර්දය බව නොතකා හරින බව පෙනේ. සුමිත්‍රා රාහුබද්ධගේ 'අග පිපි මල්' නවකතාවෙන් ඉදිරිපත් වෙන දික්කසාදය නිසා දරු දෙදෙනෙකු සමග දුක් විඳින නීතිඥවරියක වුවද ඇය නිතර හිටපු සැමියාගේ ආරක්ෂාව සහ රැකවරණය පතයි. සුමිත්‍රාගේ නවකතාවල ගුරුවරිය, වෛද්‍යවරිය, නීතිඥවරිය, ඉංජිනේරුවරිය, ලිපිකාරිනිය වැනි චරිත ප්‍රධාන වේ. ඊවා රණවීරගේ නිර්මාණවල හමුවන්නේ අන්‍යයන්ගේ නිවෙස්වල බැළමෙහෙකම් කරන ආර්ථික දුෂ්කරතා නිසා අනාථව අසරණව ලිංගික හිංසනයට ලක්වන ගැහැනුය. කේ. ජයතිලක තම නවකතාවල ගෘහාශ්‍රිත කටයුතුවල නිරත වන ගැහැනු වැඩි වශයෙන් ඉදිරිපත් කරන අතර ටෙනිසන් පෙරේරා ස්ත්‍රීත්වය අප්‍රධාන කොට ලිංගිකත්වය සම්බන්ධ අවස්ථාවල දී පමණක් ඇය ප්‍රමුඛත්වයට ගෙන එයි.

## සමාලෝචනය

ස්ත්‍රීවාදය යනු පැහැදිලිව ලියා වගුගත කළ හැකි න්‍යායක් ලෙස පවතින්නක් නොවේ. එය විවිධ දෘෂ්ටිමය ආස්ථාන මත ගොඩනැගෙමින් පවතින්නකි. ස්ත්‍රීවාදය නැතහොත් කාන්තා විමුක්තිය සඳහා වන අරගලය ප්‍රජාතන්ත්‍රවාදය අන්තර්ගත වූවකි. ස්ත්‍රීවාදය සමාජ පරිවර්තනයක් යෝජනා කරන අතර කාන්තා පීඩනය නිමා කිරීමට උත්සාහ ගන්නා ව්‍යාපාරයක් ලෙස ද හැඳින්විය හැකිය. ශ්‍රී ලාංකේය සිංහල නවකතාවෙන් මේ සඳහා ලැබෙන පිටුබලය ඉතාමත් අවමය. ස්ත්‍රී පුරුෂ සමාජභාවය ස්ත්‍රියට හිංසාකාරී ලෙස බලපාන ආකාරය මෙන්ම එහි පිතෘමූලික ආකෘතියත් මෙම නවකතාවල පැහැදිලිව දැකිය.පර්යේෂණයට පාදක කර ගත් නවකතාවල ස්ත්‍රීවාදී ප්‍රවේශයක් දැකිය නොහැකි බැවින් ස්ත්‍රීත්වය පිළිබඳ විශ්වීය ප්‍රවණතාවල අවශ්‍යතාව යෝජනා කෙරේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අමරකීර්ති, ලියනගේ. (2005). අමුතු කතාව, පුංචිබොරැල්ල : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ඉලයප්ආරච්චි, එරික්. (2000). කලාත්මක ඥානය හා සැබෑ ලෝකය, පුංචිබොරැල්ල : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

ඉහ්සාන්, මව්ලවි රෂාදි. (2008). (සංස්.) ඉස්ලාමය තහවුරු කරන හිජාබය, කර්තෘ ප්‍රකාශන.

ජයතිලක, කේ. (1960). පරාජිතයෝ, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1964). දෙලොවට නැති අය, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1966). පිතාමහ, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1974). මායා මාළිගා, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1975). මතු සම්බන්ධයි, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1977). පුංචිරාළ, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1980). රාජපක්ෂ වලව්ව, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1986). පුංචිරාළගේ මරණය, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1992). මහල්ලකුගේ ප්‍රේම කතාව, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1994). කාලෝ අයංතෙ, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(1997). පියා සහ පුත්තු, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

(2001). චරිත තුනක්, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

ජයවර්ධන, කුමාරි. (1994). ස්ත්‍රීවාදය හා ජාතිකවාදය, කොළඹ : සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

තෝරදෙනිය, සේන. (2010). විචාර විලෝචන, කොළඹ : දයාවංශ ජයකොඩි සහ සමාගම.

ද සිල්වා, පී.ජී. ඥානසිරි .(2004). දර්ශනය හා කාන්තාව, කොළඹ : සමයවර්ධන පොත්හල.

පෙරේරා, ටෙනිසන්, (1965). දුක් ගින්දරක් මැදින්, කොළඹ : ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

(1990). නික්මන, කොළඹ : දයාවංශ ජයකොඩි සහ සමාගම.

(1990). පද්මිණීලා, තිවංකලා, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

(1992). දුට්ඨ ගාමිණී නොමළ වගයි, කොළඹ : දයාවංශ ජයකොඩි සහ සමාගම.

(1995). මම චක්‍රවර්ති, කොළඹ : දයාවංශ ජයකොඩි සහ සමාගම.

(1998). සත්‍යවාදීන්ගේ මරණ මංචකය, කොළඹ : ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

හාසින්, කමලා .(2000). පීතෘ මූලිකත්වය යනු කුමක්ද? කොළඹ : සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

රණවීර, ඊවා. (1999). සෙදෝනා, පුංචිබොරුල්ල : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

(2001). ලැයිසා, පුංචිබොරුල්ල : විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

රාහුබද්ධ, සුමිත්‍රා. (1978). බුමුතුරුණු, නුගේගොඩ : කර්තෘ ප්‍රකාශන.

(1979). උද්‍යානය, නුගේගොඩ : කර්තෘ ප්‍රකාශන.

(1981). දළ රළ පෙළ, නුගේගොඩ : කර්තෘ ප්‍රකාශන.

(1984). කෙළිමඬල, මහරගම : තරංජී ප්‍රින්ටර්ස්.

(1986). සුර අසුර, නුගේගොඩ : කර්තෘ ප්‍රකාශන.

(1994). ඉටි පහන්, නුගේගොඩ : කර්තෘ ප්‍රකාශන.

(1998). අග පිපි මල්, නුගේගොඩ : කර්තෘ ප්‍රකාශන.

සරච්චන්ද්‍ර එදිරිවීර. (1997). සිංහල නවකතා ඉතිහාසය හා විචාරය, නුගේගොඩ : සරසවි පොත්හල.

සුරවීර, ඒ.වී. (1973). නවකතා නිර්මාණය හා අවබෝධය, කොළඹ : හංස ප්‍රකාශකයෝ.

Beauvior,D.S. ( 1974). The Second sex, Newyork ; Vintage Books.

Butler, Judith. (1990). Gender Trouble,Newyork ;Routledge.

Freedman, Jademan. (2002). Feminism, New Delhi, Viva Books (Pvt) Ltd.

Freiden , Betty. (1963). The Feminine Mystique , Newyork:; W.W.Norton Company.

Gajab Sharma Kumari.(2001). Women's Writings, Women Voices, India : Luxmi Offset Press.

Garrett Stephanie. (1987). GENDER, New York: Routledge.

Showalter, Elaine. (1985). The New Feminist Criticism : Essays on Women, Literature and Theory,Newyok:Pantheon Books.

Gillbert Sandra and Gubar Susan. (1979). The Mad Women in the Attic : The Women Writer and the Nineteenth Century Literary Imagination, Baltimore Yale: University Press.

# Effects of Anthropogenic Activities on the Natural Environment in Kotmale Catchment (With special reference to Malhewa, Ramboda and Wedamulla GN Divisions)

Madhushani G.O.G.N[1] and Herath H.M.P[2]

Sabaragamuwa University of Sri Lanka

[1]nilu2madushani@gmail.com

## Abstract

Matano, A.S., Kanangire,C.K., Anyona,D.N., Abuom, P.O., Gelder, F.B., Dida, G.O., Owuor, P.O. and Ofulla, A.V.O. (2015).Effects of Land Use Change on Land Degradation Reflected by Soil Properties along Mara River, Kenya and Tanzania.*Open Journal of Soil Science,* 5(1), pp. 20-38.

Nayakekorala,H. (1999).Land use effects on hydrological processes and their implications on watershed management: A case study in the mid country intermediate zone of Sri Lanka. PhD. University of Peradeniya.

Sampath pethikada. (2015).Kotmale Divisional Secretariat, Kotmale.

Semmahasak, S. (2014). PhD. Soil erosion and sediment yield in tropical mountainous watershed of northwest Thailand: the spatial risk assessments under land use and rainfall changes. University of Birmingham.

Sharma,R.K.A. (1979). *Text book of hydrology and water resources*.New Delhi: DhanpatRai& sons.

Shirantha,R.R.A.R.,Amarathunga,A.A.D.and Weerasekara,K.A.W.S. (2010) .Existing challenge to succeed a sustainable built aqua-environment in misty green valleys in the hill country of Sri Lanka; a case study. *ResearchGate,* 2(1), pp. 344-354.

# සෙක්කුවඃ ඒ හා සබැඳි සමාජ, ආර්ථික සහ සංස්කෘතික පසුබිම පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක් (ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක ඇසුරින්)

*Sekku*: A Historical Study on Social, Economic and Cultural Background of the related on *Sekku* (Based on Galle and Matara Districts)

ලක්මිණි ගමගෙ[1], කවුඩාගම්මන රතනසාර හිමි[2]
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර
[1]lakmini24@gmail.com
[2]historyrs6@gmail.com

**සංක්ෂේපය**

සෙක්කුව යනු තෙල් සිඳීම සඳහා භාවිත සාම්ප්‍රදායික මෙවලමකි. යටත් විජිත සමයේ වාණිජ භෝගයක් ලෙස පොල් වගාව ශ්‍රී ලංකාව තුළ ඉදිරියට පැමිණීමට සමගාමී ව සෙක්කු කර්මාන්තය වඩාත් ප්‍රචලිත විය. දිවයිනේ නොයෙක් තැන්වල සෙක්කු කර්මාන්තය ප්‍රචලිත ව පැවතිය ද දකුණු පළාත තුළ එයට සුවිශේෂ ස්ථානයක් හිමි විය. සෙක්කු කර්මාන්තය තත් කලාපයේ දී සාධනීය දියුණුවක් අත්පත් කරගෙන තිබුණි. තාක්ෂණයේ දියුණුවත් සමග විසි වැනි සියවස අගභාගය වන විට දී සෙක්කුව යල්පැන ගිය මෙවලමක් වී අද්‍යතනයේ අතීත මතකයක් බවට පත්ව තිබේ. යටත් විජිත සමයේ දී දකුණු පළාතේ ක්‍රියාත්මක වූ සෙක්කු කර්මාන්තය හා සබැඳුණු සමාජ ආර්ථික හා සංස්කෘතික පසුබිම පිළිබඳ ඓතිහාසික දෘෂ්ටිකෝණයෙන් පර්යේෂණාත්මක අධ්‍යයනයක් තවමත් සිදු ව නැත. තත් ඌනතාව පූරණය කරන මෙම අධ්‍යයනය දකුණු පළාතේ ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක පදනම් කරගත් සෙක්කුව හා සබැඳි සමාජ, ආර්ථික හා සංස්කෘතික පසුබිම සොයා බලන්නකි. මෙම අධ්‍යයනය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය පදනම් කරගත්තකි. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය උපයුක්ත කරගනු ලැබූ අතර එම ප්‍රාථමික මූලාශ්‍රයන්ගෙන් කිහිපයක් කොළඹ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති ලේඛන ය. ද්විතීයික මූලාශ්‍රය විවිධ විද්‍යාර්ථීන් විසින් රචිත පර්යේෂණ ග්‍රන්ථය. එසේ ම මෙම පර්යේෂණය සඳහා ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල අහංගම, ගොවියාපාන, බෙන්තර, ගල්වඩුගොඩ, වැලිගම සහ මාතර නගරය මූලික කරගෙන ක්ෂේත්‍ර අධ්‍යයන ක්‍රමවේදය ද භාවිත කරනු ලැබුණි. මෙම ක්‍රමවේදය යටතේ දත්ත එක්රැස් කිරීමට දැනුමින් පොහොසත් පුද්ගලයන් (Data rich cases) සමග ගැඹුරු සම්මුඛ සාකච්ඡා (In-depth Interviews) පවත්වනු ලැබීය. සෙක්කු හිමියන් ධනයෙන් සමෘද්ධිමත්ව යටත් විජිත තනතුරු ලබාගැනීම මගින් ස්වකීය සමාජ තත්වය උත්කර්ෂ කරගත් අයුරු හෙළිදරව් කරගත හැකි විය. නව රැකියා උත්පාදනය කරමින් ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය නංවාලීමට ද සෙක්කු කර්මාන්තයට හැකි විය. දකුණු පළාතේ මහා මාර්ග පද්ධතියෙහි වර්ධනයට සෙක්කු කර්මාන්තය ඉවහල් වූ අන්දම ද මෙම අධ්‍යයනයෙන් අනාවරණය විය. සංස්කෘතිකමය අනන්‍යතාවක් ද තත් කර්මාන්තයට සමගාමීව නිර්මාණය වී තිබුණි. සෙක්කුව හුදු මෙවලමක් නොවී එකල දකුණු පළාතේ ආර්ථිකය, සමාජය සහ සංස්කෘතික තත්ත්වයන් කෙරෙහි තීරණාත්මක බලපෑමක් කරලීමට සමත්ව තිබේ.

**ප්‍රමුඛ පදඃ සෙක්කුව, තෙල් නිස්සාරණය, යටත් විජිත සමය, දකුණු පළාත, පොල් වගාව**

Abstract

Sekku (Chekku) is a traditional tool used for extracting oil. *Sekku* industry flourished with the development of coconut cultivation as a commercial crop in Sri Lanka during the colonial period. Although the *Sekku* industry was prevalent in many parts of the island, Southern Province was specialized. The *Sekku* industry had made positive progress in the region. *Sekku* has become an obsolete tool, by the end of the twentieth century and a thing of the past with the advancement of technology. No research has yet been done on the historical perspective of the socio-economic and cultural background associated with the *Sekku* industry in the Southern Province during the colonial period. This study fills in these gaps by answering the research problem 'How did the *Sekku* industry affect the social, economic, and cultural conditions of the 19th and 20th centuries in the two districts of Galle and Matara. Primary and secondary literature sources were utilized for this research. Some of those primary sources are deposited in the National Archives of Colombo. Some research articles and books have been used as secondary sources. Aditionaly, field study was conducted in Ahangama, Goviyapana, Benthara, Galwadugoda, Weligama, and Matara areas. In-depth interviews were conducted with the support of knowledge-rich individuals.This is a qualititative research. This research revealed how *Sekku* owners increased their social status by becoming wealthy and gaining colonial positions. The *Sekku* industry was also able to boost the region's economy by creating new jobs. The study also revealed how the *Sekku* industry has contributed to the growth of the road system in the Southern Province. Cultural identity was also created in parallel with the *sekku* industry. *Sekku* was not just a tool but had a decisive impact on the economic, social, and cultural conditions of the Southern Province at that time.

Keywords: Sekku (Chekku), Oil extracting, Colonial period, Southern Province, Coconut cultivation

## 1. හැඳින්වීම හා සාහිත්‍යය විමර්ශනය

සෙක්කුව ලෙස හැඳින්වෙන්නේ තෙල් නිස්සාරණය සඳහා භාවිත සාම්ප්‍රදායික යන්ත්‍රයකි. ප්‍රධාන වශයෙන් ම අතීත ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ මෙය කැපී පෙනුණ පැතිකඩක් වූ අතර තාක්ෂණයේ දියුණුවත් සමග එය ක්‍රමයෙන් සමාජයෙන් වියැකී ගිය උපකරණයක් බවට පත් විය.

ශ්‍රී ලංකාවේ සෙක්කු කර්මාන්තය පිළිබඳ ප්‍රාමාණික ශාස්ත්‍රීය පර්යේෂණ සිදු වූ බවක් පෙනෙන්නට නැත. පවතින ශාස්ත්‍රීය පර්යේෂණ අතරින් පීරිස් (2009) මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ සෙක්කුවේ පවතින තාක්‍ෂණික පැතිකඩ පිළිබඳ විග්‍රහ කිරීමට යි. ශ්‍රී ලාංකේය අවකාශය පිළිබඳ නොවූව ද දකුණු ඉන්දියාවේ සෙක්කු කර්මාන්තය පිළිබඳ අචායාගේ (1990, 1993) අවධානය යොමු ව තිබේ. මේ අනුව පර්යේෂකයන් කිහිපදෙනෙක් සුළු වශයෙන් සෙක්කු කර්මාන්තය සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබුණ ද ශ්‍රී ලංකාවේ සෙක්කු කර්මාන්තය හා බැඳුණු සමාජ, ආර්ථික හා සංස්කෘතික පසුබිම පිළිබඳ කරන ලද පර්යේෂණ දක්නට නො ලැබේ.

## 2. පර්යේෂණ අරමුණ, පර්යේෂණ ගැටලුව සහ උපන්‍යාසය

මෙම පර්යේෂණයේ මූලික ම අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ පැවති ප්‍රධාන මෙවලමක් වූ සෙක්කුවත් ඒ හා සබැඳි සමාජ ආර්ථික හා සංස්කෘතික පසුබිමත් අධ්‍යයනය කිරීම යි.

19 හා 20 වැනි ශතකයන්හි ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක දෙකෙහි සමාජ, ආර්ථික හා සංස්කෘතික තත්ත්වයන් කෙරෙහි සෙක්කු කර්මාන්තය බලපෑවේ කෙසේද? යන ගැටලුව මෙම අධ්‍යයනය මගින් පරීක්ෂාවට ලක් කෙරෙයි. පූර්වෝක්ත ශතාබ්දයන්හි ගාල්ල හා මාතර දිස්ත්‍රික්කද්වයෙහි මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රියාත්මක වූ සෙක්කු තෙල් කර්මාන්තයෙහි හුදු නිෂ්පාදන කාර්යයකට වඩා වැඩි යමක් පැවතුණි. සෙක්කු කර්මාන්තයෙන් තත් අවධියෙහි එම ප්‍රදේශයන්හි සමාජ, ආර්ථික සහ සංස්කෘතික ප්‍රවාහයන්හි පූර්වාංගම පාර්ශ්වයක් නියෝජිත බව මෙම පර්යේෂණයේ උපන්‍යාසය යි.

## 3. පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය උපයෝගි කර ගනු ලැබීය. ප්‍රාථමික මූලාශ්‍රයන්ගෙන් කිහිපයක් කොළඹ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති සමකාලීන ලේඛන යි. “Coconut Oil and Copra, purchase of, for H.M.S. Governer”, “Memoranedum on The Proposed Coconut Research Scheme”, “A View of the Agricultural, Commercial, and Financial Interests of Ceylon” වැනි ලේඛන ඒවා අතර වේ. විදෙස් වාර්තාකරුවන්ගේ ලේඛන ද මෙම ප්‍රස්තුතාධ්‍යයනයට උපයුක්ත ය. විවිධ විද්‍යාර්ථීන් විසින් රචනා කරන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ, පර්යේෂණ පත්‍රිකා ආදිය ද්විතීයික මූලාශ්‍රය වශයෙන් භාවිතයට ගැනුණි. ලිඛිත මූලාශ්‍රයයන්ට අමතරව ගාල්ල හා මාතර දිස්ත්‍රික්කවල අහංගම, ගොවියාපාන, බෙන්තර, ගල්වඩුගොඩ, වැලිගම සහ මාතර නගරය මූලික කර ගෙන සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබීය. සම්මුඛ සාකච්ඡා තනි තනි පුද්ගලයින් සමග කෙරුණු ගැඹුරු සාකච්ඡා විය. පුද්ගලයන් 23 දෙනෙකු සමග සම්මුඛ සාකච්ඡා පවත්වනු ලැබීය. එසේ ම ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී භාවිත නිරීක්‍ෂණ ක්‍රමවේදය යටතේ ද දත්ත

සම්පාදනය කර ගැනීමට හැකි විය. මෙය ගුණාත්මක ක්‍රමවේදය පදනම් කර ගත් ඓතිහාසික දත්ත විශ්ලේෂණයකි.

## 4. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 4.1. සෙක්කුවේ ඓතිහාසික පසුබිම

ආහාර සැකසීමේ දී මේද හා තෙල් වර්ග භාවිත කිරීමට ආසියානුවන් හුරුපුරුදු වී තිබුණේ අදින් වසර හාර දහසකටත් පූර්වයේ සිට ය. හරප්පා ශිෂ්ටාචාරයට අයත් පුරාවිද්‍යාත්මක කැණීම්වලින් එය තහවුරු කෙරෙන සාධක සොයා ගෙන ඇත. අබ ඇට සහ පොල් වැනි ඔලීනීය ද්‍රව්‍ය ගණනාවක් තෙල් ප්‍රභවයන් ලෙස හරප්පා වැසියන් එකල භාවිත කළ බවට සාක්ෂි ලැබුණ ද ඒවා නිෂ්පාදනය කර ගත් ආකාරය පිළිබඳ පැහැදිලි තොරතුරු අනාවරණය නො වේ (Achaya, 1993). තෙල් නිෂ්පාදනය පිණිස භාවිත යන්ත්‍රයක් පිළිබඳ සඳහනක් සංස්කෘත සාහිත්‍ය තුළ දක්නට ලැබෙතත් එකී යන්ත්‍රය පිළිබඳ දිගු විස්තරයක් දක්නට නො ලැබේ (Monier-Williams, 1899). ක්‍රි.පූ. 1500 පමණ වන විට එළවළු තෙල් ලබා ගැනීම සඳහා වංගෙඩිය සහ මෝල්ගහ මෙන් ම ඇඹරුම්ගල ද භාවිතයට පැමිණ තිබුණි (Achaya, 1990). පසුකාලීන වාග් විද්‍යාත්මක සාක්ෂිවලට අනුව තෙල් හා උක් පැණි නිෂ්පාදනය සඳහා පීඩනය දී ඇත්තේ සතුන් විසින් බල ගැන්වුණ යන්ත්‍රකින් යැයි කේ.ටී. අචායා සඳහන් කරයි (Achaya, 1993). සානි, කොල්හු සහ චෙක්කු යන වචන ඒ සඳහා භාවිත විය. ඉන්දියාවේ පමණක් නොව මියන්මාරය සහ ඇෆ්ගනිස්ථානය යන රටවල ද එකී තාක්ෂණික ක්‍රමෝපාය තෙල් නිස්සාරණය සඳහා භාවිත ව තිබුණි (Achaya, 1993). ඉන්දියාවට ආසන්න පිහිටීමත් දකුණු ඉන්දියාව සමග දූරාතීතයේ පටන් පවත්වා ගෙන ආ සමීප සබඳතාවත් හේතුවෙන් ඉන්දීය තෙල් නිස්සාරණ සම්ප්‍රදාය ශ්‍රී ලංකාවට ද ලැබෙන්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

ශතවර්ෂ ගණනාවකට පූර්වයෙහි සිට ම ශ්‍රී ලංකාවේ තෙල් නිස්සාරණයට සහ උක් යුෂ ලබා ගැනීමට භාවිත වූ යම් යන්ත්‍රයක් පිළිබඳ සාධක පුරාතන සාහිත්‍ය ග්‍රන්ථයන්ගෙන් අනාවරණය වේ. උක් දඬු තළා යුෂ ලබාගැනීමට භාවිත කරන ලද යන්ත්‍රයක් පිළිබඳ මහාවංසයේ කරුණු අන්තර්ගත ය (ඌන පූරණ සහිතො මහාවංසො, පරි. 34, ගා. 4-5). දහතුන්වන ශතවර්ෂයේ දී පමණ රචිත විශුද්ධිමාර්ග සන්නය, තෙල් සිඳීමට භාවිත යන්ත්‍රයක් සහ සීනි නිෂ්පාදනයට භාවිත යන්ත්‍රයක් පිළිබඳ කරුණු ඉදිරිපත් කරයි (විශුද්ධි මාර්ග සන්නය, 923). තත් මූලාශ්‍රය සඳහන් කරන යන්ත්‍රය සෙක්කුව ම යැයි කිව නොහැකි වුව ද ඒවායින් හැඟවෙන්නේ සෙක්කුව වැනි යම් යාන්ත්‍රික නිර්මාණ විය යුතු ය.

### 4.2. ගාල්ල හා මාතර දිස්ත්‍රික්කය ආශ්‍රිත සෙක්කු කර්මාන්තයෙහි පසුබිම

ශ්‍රී ලාංකේය සංස්කෘතිය සහ පොල් (Cocos Nucifera Linn) අතර ඇත්තේ සුවිශේෂ බැඳියාවකි. ශ්‍රී ලාංකේය ඓතිහාසික සම්ප්‍රදාය තුළ අනාදිමත් කාලයක සිට පොල් ගස සම්බන්ධ තොරතුරු වාර්තාගත ය (සිරිවීර, 2001ඃ 229-231). ශ්‍රී ලාංකේය ජනතාවට පොල්ගස විවිධාකාරයෙන් ප්‍රතිලාභ ලබා දෙයි. "කප්රුක" ලෙස එය හඳුන්වනු ලබන්නේ එහි බහු භාවිතය හේතුවෙනි. පොල්ගසේ සෑම කොටසක් ම ශ්‍රී ලාංකිකයන්ට අතිශය ප්‍රයෝජනවත් වූ බව බ්‍රිතාන්‍යයන්ගේ වාර්තාවලින් පෙනී යයි. (Twenieth Century Impressions of Ceylon, 1907: 251) පොල්තෙල් යනු එහි එක් ප්‍රතිලාභයක් පමණි. පුද්ගලයෙකුගේ දෛනික කැලරි අවශ්‍යතාවෙන් සියයට 20ක් පමණ පොල්තෙල්වලට සැපයිය හැකි ය. ආහාර රසවත්

කිරීමටත් හිස ගැල්වීමටත් ආගමික කටයුතුවල දී පහන් දැල්වීමටත් බහුල ව පොල්තෙල් යොදා ගැනුණි. පොල්තෙල්වලට රෝම කූප ඔස්සේ සම විනිවිද ගමන් කිරීමේ සුවිශේෂ හැකියාවක් ඇතැයි පිළිගන්නා පාරම්පරික වෛද්‍යවරු දේශීය බෙහෙත් නිෂ්පාදනයේ දී පොල්තෙල් මිශ්‍ර කරති. කඩියන් කුහුඹුවන්, මී මැස්සන් සහ මදුරුවන් වැනි සතුන් දෂ්ට කළ අවස්ථාවල දී පොල්තෙල් ආලේප කරන්නේ එහි විෂ නසන ගුණයක් ඇතැයි විශ්වාස කරන බැවිනි. කොස්, දෙල් වැනි ගෙඩි වර්ගවල කොහොල්ලෑ යමක තැවරුණු විට ඒවා ඉවත් කිරීමට ද පොල්තෙල් යොදා ගැනේ. පොහොය දිනවල විහාරස්ථානයන්හි පහන් දැල්වීම සඳහා පොල්තෙල් සම්මාදම් කිරීම මෑතක් වනතුරු ම ගම්වල දක්නට ලැබුණ සිරිතකි (නිරංජන්, 2015). හින්දු ආගමිකස්ථානවල ද පහන් දැල්වීමට බහුල ව යොදා ගැනෙන්නේ පොල්තෙල් ය. රාත්‍රි කාලයේ දී නිවෙස් ඇතුළත ආලෝකවත් කිරීමට පොල්තෙල්වලින් දැල්වූ පහන් ද භාවිත විය (සම්මුඛ සාකච්ඡා, ගොවියාපාන, 2021.01.23). මේ කරුණුවලින් පෙනී යන්නේ ශ්‍රී ලාංකේය ජන ජීවිතය පොල්තෙල් සමග ඉතා සමීප ව පැවැති බව යි.

ආහාර සකසා ගැනීම පිණිස පොල් භාවිත කිරීම පිළිබඳ සාධක අනුරාධපුර යුගය දක්වා ම විහිද පවතී. රජරට ශිෂ්ටාචාරය නිරිත දිගට විතැන් වීමත් සමඟ පොල් පරිභෝජනය ඉහළ යන්නට ඇතැයි සිතිය හැකි ය. දකුණු පළාතේ වෙරළාසන්න ප්‍රදේශවල ඉතා සරුසාර ව පොල් වගා කළ හැකි විය (පිලීතියස්, 2009: 215). ඒ සඳහා දේශගුණික සාධක බෙහෙවින් ම බලපා තිබේ. තෙතමනය සහිත ඝන දියළු පස් හා වැලි මිශ්‍ර ලෝම පස මෙම කලාපයේ බහුලව දක්නට ලැබේ. මුහුද ආශ්‍රිත ව පිහිටීම හේතුවෙන් ප්‍රදේශයේ ඇති ලුණු මිශ්‍ර පස පොල් වගාවට වඩාත් උචිත ය. නිවර්තන කලාපීය බෝගයක් වන පොල් ගස හොඳින් වර්ධනය වීමට ඉහළ උෂ්ණත්වයක් මෙන් ම අධික තෙතමනය ද අවශ්‍ය වේ. අඟල් 60ක පමණ වාර්ෂික වර්ෂාපතනයක් පොල් වගාව සඳහා අවශ්‍ය වන අතර අඟල් 80ක පමණ වාර්ෂික වර්ෂාපතනයක් ලැබෙන්නේ නම් වැඩි අස්වැන්නක් ලබා ගත හැකි ය. මෙකී දේශගුණය සහ භූ භෞතික සාධක දකුණු වෙරළ තීරයේ දක්නට ලැබීම නිසා තත් කලාපය තුළ පොල් වගාව ශීඝ්‍රයෙන් ව්‍යාප්ත ව තිබේ. එම තත්ත්වය මත ජාතික පොල් නිෂ්පාදනයට 12%ක දායකත්වයක් සපයනු ලබන්නේ දකුණු පළාතෙනි. (Pathiraja and others, 2015: 4) කුඩා පොල් ත්‍රිකෝණය ලෙස දකුණු පළාත හැඳින්වීමෙන් ම පොල් නිෂ්පාදනයට මෙම භූගෝලීය කලාපයෙහි ඇති වැදගත්කම ප්‍රතීත කෙරෙයි.

ගාල්ල දිස්ත්‍රික්කයේ බෙන්තොට, අම්බලන්ගොඩ සහ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම, තල්අරඹ සහ කඹුරුගමුව ආදි ප්‍රදේශ වැඩි වශයෙන් පොල් වගාවට නැඹුරු ව තිබුණි. පෘතුගීසි තෝම්බුවලට අනුව පොල්වත්ත සහ තල් අරඹ යන ප්‍රදේශවලින් ලැබුණු පොල්වල ආදායමෙන් වැලිගම විහාරය නඩත්තුවටත් එහි දියුණුවටත් කටයුතු කර තිබේ. ඉතිහාසගත කරුණු සලකා බලන විට ලන්දේසි පාලන සමයේ දී පොල් වගාවට විශේෂ ස්ථානයක් හිමි ව පැවතුණි. ආර්ථික වාසි පිළිබඳ වැඩි නැඹුරුවක් දැක්වූ ලන්දේසීහු පොල් වගාව කෙරෙහි ද උනන්දු වූහ. එම පාලන සමයේ දී පොල් අරක්කු නිෂ්පාදනය සහ තෙල් නිෂ්පාදනය බහුල ව සිදු කෙරුණි. ලන්දේසි පාලන සමය අවසන් වන විට ඔවුනගේ පාලන ප්‍රදේශවල අක්කර 142,000ක පමණ පොල් වගා කර තිබුණි (අමරසේන, 1979: 84). පෘතුගීසි සහ ලන්දේසි යුගවල දී දකුණු වෙරළ තීරයේ පොල් වගාව සිදු වුව ද මහා පරිමාණ වාණිජ බෝගයක් වශයෙන් එය වගා කිරීම ඇරඹුණේ බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ය. මූලාශ්‍රය මගින් පෙන්නුම් කරන්නේ බ්‍රිතාන්‍යයන් ලන්දේසීන්ගෙන් බලය අත්පත් කර ගන්නා විට, හලාවත සිට මාතර දක්වා සමස්ත වෙරළබඩ තැනිතලාවේ අඛණ්ඩ පොල් වගාවක් තිබූ බව යි. එම භූමිය තුළ ගස් මිලියනයක් පමණ වූ බවට ඇස්තමේන්තු කර ඇත (Salgado, 45). 1797 දී පොල් ගස්වලින් බදු අය කිරීමට එරෙහි ව පහත රට ප්‍රදේශවලින් පැමිණි විරෝධතාව එකල බ්‍රිතාන්‍ය වෙළෙඳ සමාගමට ප්‍රබල අභියෝගයක් විය. එම කැරැල්ලේ ප්‍රතිඵලයක් ලෙස පොල්

ගස්වලින් බදු අය කිරීම වෙනුවට පොල් ගස ආශ්‍රිත නිෂ්පාදනවලින් බදු අය කිරීම ආරම්භ විය. කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණ ඔස්සේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව වාණිජ වැවිලි බෝග වගාව කෙරෙහි ස්වකීය අවධානය දැක්වීය. බ්‍රිතාන්‍යයන්ගේ ආධිපත්‍යය යටතේ පැවැති තේ සහ කෝපි වගාව වෙත පහසුවෙන් එක් වීමට දේශීය ධනවතුන්ට හැකියාවක් නො වී ය. එබැවින් අඩු වියදමකින් පහසුවෙන් කළ හැකි පොල් වගාව වෙත වැඩි වශයෙන් යොමු වූවෝ ස්වදේශීය ධනවත්තු ය (Twenieth Century Impressions of Ceylon, 1907: 251; කරුණානන්ද 1999ඃ 128). 1922 පමණ වන විට දිවයිනෙහි පොල් වගා කළ භූමි ප්‍රමාණය අක්කර මිලියනයක් පමණ වූ බව බ්‍රිතාන්‍ය වාර්තාවල දැක්වේ (Richards, 1924). දකුණු පළාතේ මහා පරිමාණ පොල් වැවිලිකරුවන්ගේ පසුබිම සලකා බලන විට ගාල්ල, ප්‍රධාන වරායක් වශයෙන් පැවති තත්ත්වය අහෝසි වීමත් සමඟ ඒ හා සම්බන්ධ ව සේවා සැපයූ කොටස් පොල් වගාව සඳහා වැඩි වශයෙන් යොමු වී ඇති බව හඳුනාගත හැකි ය. ගාල්ල මාතර දිස්ත්‍රික්කවල ප්‍රචලිත ව පැවති පොල් වගාව පිළිබඳ විස්තර ලන්දේසි සහ ඉංග්‍රීසි වාර්තා රාශියක ම අන්තර්ගත ය (Bertolacci, 1817: 147-154; Gilles, 1948: 8-10). පොල්, එකල දේශීය මෙන් ම විදේශීය වශයෙන් ද වාණිජ වටිනාකමක් හිමි කර ගෙන තිබීම දේශීයයන් පොල් වගාව කෙරෙහි නාභිගත වීමට ප්‍රධාන හේතුවක් වන්නට ඇත. මේ ආකාරයට පොල් වගාව සඳහා යොමු වූ ධනපතීහු තම පොල් ඉඩම්වලින් ලැබෙන ඵලදාවෙන් ස්වකීය ගෙවත්ත තුළ දී ම තෙල් නිස්සාරණය කොට වැඩි ආදායමක් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් කටයුතු කළහ.

ගෙවතු වගාවක් වශයෙන් පොල් වගා කිරීමට සාමාන්‍ය ගැමියෝ ද සුළු වශයෙන් යොමු වූහ (සම්මුඛ සාකච්ඡා, ගොවියාපාන, 2021.01.23). එසේ වුව ද ප්‍රදේශයේ මහා පරිමාණ පොල් වතුවල අයිතිය පැවතියේ ප්‍රධාන පවුල් කිහිපයකට හා සමාගම් කිහිපයකට පමණි. පොල් වගාවෙන් තුනෙන් දෙකක් පමණ අයත් වූයේ අක්කර 25ක් හෝ ඊට කුඩා ඉඩම් කට්ටි වර්ගයට යි. දක්ෂිණ ලංකාවේ වෙරළබඩ තීරයේ පොල් වගාවෙන් 35%ක් පමණ නියෝජනය කර තිබෙන්නේ අක්කර පහක් හෝ ඊට අඩු සුළු වගා භූමි ය (අමරසේන, 1979ඃ 85). පසු ව පාරම්පරික උරුමය අනුව ඉඩම්වල ස්වාමීත්වය බෙදී යැමත් සමග පොල් ඉඩම් ශීඝ්‍රයෙන් කුඩා වන්නට විය.

බ්‍රිතාන්‍ය යුගය ආරම්භ වන විට ද පොල්තෙල් ප්‍රධාන විදේශ අපනයන ද්‍රව්‍යක් විය. ලංකාවේ පොල්තෙල් නිෂ්පාදනය පිළිබඳ ප්‍රසාදයට පත් එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා තෙල් නිෂ්පාදනය වේගවත් කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. ඒ අනුව 1831 නොවැම්බර් 18වැනිදා තෙල්මෝලක් ස්ථාපනය කිරීම සඳහා ගාල්ලේ යුරෝපීය වෙළෙඳ සමාගමකට අනුග්‍රහ දැක්වූ අතර ඒ පිළිබඳ ගැසට් නිවේදනය එම වසරේ දෙසැම්බර් 3වැනි දින නිකුත් විය. එම ගැසට් නිවේදනයට අනුව 1832 දී 'ඇක්ලන්ඩ් සහ බොයිඩ් සමාගම' වාෂ්ප බලයෙන් ක්‍රියා කරන තෙල්මෝලක් ප්‍රථම වරට ගාල්ලේ පිහිටුවීය (කරුණානන්ද, 1999ඃ 128). එකී තෙල්මෝල අපේක්ෂිත තරම් ජනප්‍රිය නොවූයෙන් තවදුරටත් සෙක්කු කර්මාන්තය ම ව්‍යාප්ත විය.
1840 පමණ වෙද්දී පොල් වගාවේ ශීඝ්‍ර ව්‍යාප්තියක් සිදු වූ අතර ඒ සඳහා යොදා ගැනුණු භූමිවලින් විශාල ප්‍රදේශයක් තිබුණේ කොළඹ සිට මාතර දක්වා දිවෙන වෙරළ තීරයේ ය. බ්‍රිතාන්‍යයන්ගේ මැදිහත්වීම මත පොල් ආශ්‍රිත නිෂ්පාදන විශාල ප්‍රමාණයෙන් ලෝක වෙළෙඳපොළ සඳහා නිකුත් කිරීමට හැකි විය. එසේ ලන්දේසි සහ ඉංග්‍රීසි පාලන සමයේ දී පොල් වගාව දේශීය ව්‍යවසායකයන් අතර වේගයෙන් ජනප්‍රිය වීමට සමගාමී ව සෙක්කු කර්මාන්තය ද දකුණු මුහුදු තීරය අවට ද ව්‍යාප්ත විය.





නෙලන ලද පොල් අස්වනු (Cave 1908: 222)

### 4.3. සෙක්කුව හා එහි තාක්ෂණික පැතිකඩ

සිංහලයෙහි භාවිත 'සෙක්කු' යන්න ද්‍රාවිඩ 'චෙක්කු' යන්නෙන් බිඳී ආවකි. (Clough's Sinhala English Dictionary, 1982: 705) තෙල් සිඳීම සඳහා භාවිත සාම්ප්‍රදායික යන්ත්‍රයක් එනමින් හැඳින්වුණි. දකුණු පළාතේ දී සෙක්කුව ප්‍රධාන වශයෙන් යොදා ගැනුණේ පොල්තෙල් සිඳ ගැනීමට ය. එයට අමතර වශයෙන් මී, තල සහ කොහොඹ වැනි ඇට වර්ගවලින් තෙල් නිපදවීමට ද සෙක්කුව භාවිත විය.

සෙක්කුව අංග කිහිපයක් එක් ව සකස් වූවකි. සෙක්කුවේ බඳ කොටස කළුගලින් නිමැවී තිබුණි. ඇතැම් අවස්ථාවක කොස්, බුරුත වැනි තද අරටු සහිත ගස්වල කඳන්වලින් නිර්මිත ලී වංගෙඩි ද භාවිත කර ඇතත් එය එතරම් ජනප්‍රිය නො වී ය (Cave, 1908: 222). යොදා ගන්නා අමුද්‍රව්‍යයන්ගෙන් උපරිම තෙල් ප්‍රමාණයක් ලබා ගැනීමට නොහැකිවීමත්, ප්‍රදේශයේ දේශගුණික තත්ත්වය මත ඉතා ඉක්මනින් දිරාපත් වීමත් නිසා දැව වංගෙඩි වෙත වැඩි අවධානයක් යොමු නො වුණි. සෙක්කුව සඳහා භාවිත ශෛලමය වංගෙඩිය අඩි තුනක් හෝ



හතරක් පමණ පොළව අභ්‍යන්තරයේ සිටවනු ලැබේ. එය ක්‍රියාත්මක වන අවස්ථාවන්හි වංගෙඩිය බුරුල් වීම වැළැක්වීම සඳහා ගල් හා පස් දමා හොඳින් තද කර තිබේ.

පොළොවෙහි මතුපිට තිබෙන ප්‍රමාණය සකස් කර තිබෙන්නේ හරකෙකුගේ උසට සමාන්තර ව ය. කුඩා මුට්ටියක ඇතුල් පැත්තට සමාන වන ආකාරයට වංගෙඩියෙහි අභ්‍යන්තර කොටස ඉතා මටසිළුටු අන්දමින් නිමවා ඇත. සෙක්කුවේ ප්‍රමාණය අනුව එම කොටසෙහි ප්‍රමාණය මෙන් ම එක් වරකට සිඳිය හැකි තෙල් ප්‍රමාණය ද වෙනස් වේ. සාමාන්‍ය ප්‍රමාණයෙහි සෙක්කුවකින් වරකට පොල්ගෙඩි 100කින් පමණ තෙල් නිස්සාරණය කළ හැකි විය. පොල් ගෙඩි 200ක පමණ එකවර තෙල් සිඳිය හැකි විශාල සෙක්කු ගල් ද පැවතුණි. සෙක්කු ගල අභ්‍යන්තරය කොටස් දෙකකින් සමන්විත ය. එහි උඩ කොටස මෝල් ගස කැරකවීමට පහසුවන පරිදි විශාලවත් යට කොටස ගලාගෙන යන තෙල් ප්‍රමාණය පිටතට ලබා ගැනීම සඳහා විවෘත සිදුරක් සහිත ව ද නිපදවා තිබේ. වංගෙඩියේ අභ්‍යන්තරයෙන් සෑදූ සිදුර දිගේ ගලාගෙන එන තෙල් එකතු කර ගැනීම සඳහා භාජනයක් තැබිය හැකි වන පරිදි වන අඩක් පමණ සෑදූ සිදුරක් ද තෙල් ගලාගෙන එන සිදුරට පහළින් දක්නට ලැබේ. එම සිදුර මත රඳවන ලෑල්ල මත භාජන තබා පිටතට ගලා ගෙන එන තෙල් එක් රැස් කර ගත හැකි ය. තෙල් සිඳීම සඳහා භාවිත කරන අමුද්‍රව්‍ය වංගෙඩියෙන් පිටතට යාම වැළැක්වීම සඳහා වංගෙඩියේ මුදුනින් යකඩ පට්ටමක් සවිකර තිබේ.
සෙක්කුවෙන් තෙල් ලබා ගැනීම සඳහා වැදගත් වන විශේෂිත අංගයක් වූයේ මෝල් ගස යි. බොහෝ විට ඒ සඳහා යොදා ගෙන තිබෙන්නේ බුරුත ලීයකි. වංගෙඩියට යොදන අමුද්‍රව්‍ය හොඳින් ඇඹරීමට ශක්තිමත් මෝල් ගසක් අත්‍යවශ්‍ය වේ. සෙක්කු ගලේ ඇතුළත මෙන් ම මෝල් ගස ද සෘජුව තිබිය යුතු ය.

මෝල් ගස යතු ගෑමෙන් අනතුරුව මට සිලිටි වන සේ සකසා ගැනේ. එනිසා තත්ත්වයෙන් උසස් සෙක්කුවක් නිමවා ගැනීමේ දී ගල්වඩුවාගේ මෙන් ම ලී වඩුවාගේ ද දක්ෂතාව එකට



එක් විය යුතු ය. මෝල් ගසේ උඩට විවෘත වන කොටසේ කෙළවර මොට වූ උලක ස්වරූපය ගනී. එහි මතුපිටට ලීයෙන් සකස් කළ තොප්පියක් යෙදීමෙන් අපේක්ෂා කර ඇත්තේ මෝල් ගස ඔබ මොබ යාම වැළැක්වීම යි. එම ලී තොප්පියේ අනෙක් කෙළවර අඩි දෙකක් පමණ දිගට විහිදේ. එයට සවි කරන ලද චලනය කළ හැකි ලී පතු ජෝඩුවකි. තෙල් නිස්සාරණයේ දී වංගෙඩියේ ඇති අමුද්‍රව්‍ය අඩු වන විට මෝල් ගසේ සමබරතාවය රැකගැනීමට මෙන් ම තෙරපුම පාලනය කිරීමට ද ලී පතු ජෝඩුවෙන් විශාල දායකත්වයක් ලැබේ. ලී පතු ජෝඩුවට තවත් ලීයක් සවි කර ඇති අතර එය සෙක්කුවේ තිරස් ලී දණ්ඩට සවි වේ. සෙක්කු දණ්ඩේ එක් පැත්තක්, ගල් වංගෙඩියේ පාමුල ප්‍රදේශයේ දී පොළවට මඳක් ඉහළින් සවි කරනු ලැබේ. නමුත්

එම දණ්ඩ සෙක්කු ගලට සවි කරන්නේ නැත. එබැවින් එයට නිදැල්ලේ ක්‍රියාත්මක විය හැකි ය.

සෙක්කු දණ්ඩට සවි වන ආකාරයට සකස් කළ වියගසක් ද සම්බන්ධ කරනු ලැබේ. විය ගසේ අනෙක් කෙළවර ගවයාගේ මොල්ලියට ඇඳා තිබේ. ගවයාගේ නාසයට සම්බන්ධ කර ඇති තෝන් ලණුවෙන් විය ගහ පාලනය කෙරේ. සෙක්කුවට සම්බන්ධිත කුඩා කොටස් විවිධ පළාත් ජනවහර අනුව එකිනෙකට සාම්‍ය නොවන නම්වලින් හඳුන්වා තිබේ. මෝල්ගහ, තොප්පිය, ලණුවළල්ල, ලී කඳ, කම්බිකූර, පුන්නක්කු ගලවන පත්ත, සපත්තුව, පනාව සහ යකඩය ආදිය සෙක්කුවට සම්බන්ධ ප්‍රතීතාංග අතරින් කිහිපයකි.

සෙක්කුවේ ක්‍රියාවලිය සඳහා කිසිදු ආකාරයක ෆොසිල ඉන්ධනයක් අවශ්‍ය නො වේ. ගොනකු හෝ ගොන් බානක ආධාරයෙන් සෙක්කුව ක්‍රියා කරවිය හැකි ය. සෙක්කුවේ දැව දඬුවලට සහ එහි ඇති ඇතිල්ලෙන කොටස්වලට අවම බලය යෙදෙන පරිදි සෙක්කුව නිර්මාණය කිරීමට පැරැණියෝ සැලකිලිමත් වූහ. වංගෙඩිය මධ්‍යයේ පොල් තෙරපී තෙල් වෑස්සෙන පරිදි ඒවා නිමවා ඇත. ඊරියා කන්දේ බර වැඩි වන විට කොප්පරා තදින් තෙරපී හොඳින් ඇඹරී උපරිම තෙල් ප්‍රමාණයක් ලබා ගත හැකි ය. මෙසේ තෙරපීම නිසා වෑස්සෙන තෙල් ගලේ පහළ ඇති සිදුර දිගේ ගොස් ආධාරකය මත තබා ඇති භාජනයට එකතු වේ. සෙක්කුවේ ව්‍යුහයට සාමාන්‍යයෙන් විශාල බලයක් යෙදුණ ද කළුගල හැරුණු විට එම ව්‍යුහය ම නිමවා ඇත්තේ මෘදු ආකාරයට ය. එම හේතුවෙන් යම් තැනෙක යම් බලයක සිදු වන කුඩා විස්ථාපනයක් නිසා ඇති වන බලපෑම සමස්ත ව්‍යුහය පුරා පැතිරීම වළක්වනු ලැබේ. එවැනි විස්ථාපනයක දී  බලපෑමක් ගවයාට සම්ප්‍රේෂණය නොවීම අතිශය වැදගත් කරුණකි. සෙක්කු ගලේ පොල් තෙරපෙන අවස්ථාවක අදාළ තෙරපන දණ්ඩ හා ගල අතර යම් සිර වීමක් සිදු වුව හොත්, ඒ සමඟ ම ඇති වන බලපෑම එක වර ම විශාල ලෙස ගවයාගේ කරට දැනීම ව්‍යුහයේ නම්‍යශීලිභාවය නිසා වැළැකී යයි. එසේ ම ගවයා බලය යොදන ආකාරයේ යම් වෙනසක් කළ හොත් එයට ව්‍යුහය එකවර ම ප්‍රතිචාර දක්වා ගවයාට අනිසි බලපෑමක් සිදු කරන්නේ ද නැත (පීරිස්, 2009). සාමාන්‍යයෙන් එක් වරකට කොප්පරාවලින් තෙල් ලබා ගැනීම සඳහා පැය හතරක් පමණ එය ක්‍රියාත්මක කළ යුතු ය. නොකඩවා අධික බරක් රඳවා ගෙන සෙක්කුව වටා විශාල වාර ගණනක් ගමන් කිරීමට සිදු වීමෙන් ගවයාගේ බෙල්ලට දැනෙන වේදනාව අවම කිරීම සඳහා ලණුවලින් වියන ලද පටියක් ගවයාගේ බෙල්ලට බඳිනු ලැබේ.




කපිල පීරිස් විසින් පහත ඡායාරූපයෙන් උක්ත ක්‍රියාවලිය මැනවින් විග්‍රහ කරනු ලැබ තිබේ (පීරිස්, 2009).
සෙක්කුවේ තාක්ෂණික පැතිකඩ විස්තර කරමින් නූතන කාර්මික නවෝත්පාදකයන්ට තරග කළ නොහැකි ජයග්‍රාහී තත්ත්වයක සෙක්කුව පැවති බව කේව් (Cave) වාර්තා කරන්නේ විසි වැනි ශතාබ්දයේ ප්‍රථම දශකයේ දී ය (Cave, 1908: 222).

කොප්පරාවලින් මෙන් ම ගැමෙන් පසු වියළා ගත් පොල්වලින් ද සෙක්කුව ආධාරයෙන් තෙල් ලබා ගත හැකි ය. හොඳින් වියළා ගන්නා ලද කොප්පරා සිහින් තීරුවලට කපා ගැනීමෙන් අනතුරුව තෙල් සිඳීම සඳහා සෙක්කු ගලේ කුහරය තුළට දමනු ලැබීය. පොල් ගෙඩි 100ක පමණ කොප්පරා ප්‍රමාණයකින් තෙල් ගැලුම් දෙකක් පමණ ලබා ගත හැකි විය. සෙක්කු ගල තුළට මෝල් ගස බස්සවා එයට සම්බන්ධ වී ඇති ඊරියා කඳේ ගොනුන් ගැටගසනු ලැබේ. සෙක්කුවේ බඳින ලද ගවයා එය ක්‍රියාත්මක කරමින් එකම වෘත්තාකාර මගක ගමන් කරයි. එම හේතුවෙන් සෙක්කුව වටා වෘත්තාකාර ව සෑදුණු කුඩා අගලක් ද දක්නට ලැබුණි. විචාර බුද්ධිය හීන අත්දැකීම් මඳ පුද්ගලයන් හැඳින්වීමට අද ද 'සෙක්කු ගොනා වගේ' යන උපමාව බහුලව භාවිත වේ. ව.අයි.ස. ජෙයපාලන් විසින් රචිත දමිළ කෘතියක් සාමිනාදන් විමල් පරිවර්තනය කරන්නේ 'සෙක්කු ගොනා' යන නමිනි. පරාක්‍රම නිරිඇල්ල විසින් වසර 1976 දී රචනා කර නිර්මාණය කරන ලද 'සෙක්කුව' නාට්‍යය ද ඉහත අදහස ධ්වනිත කරනු පිණිස එකී නාමකරණයට ලක් කොට ඇති බව වැටහේ. ගොනුන් ගමන් කරනා විට කොප්පරා හොඳින් ඇඹරී උපරිම තෙල් ප්‍රමාණයක් ලබා ගත හැකි ය. ඇතැම් අවස්ථාවල මෝල් ගසේ පන්දමක් ද ගැටගසා තිබේ. මෙකී යාන්ත්‍රික ක්‍රියාවලිය සිදු කර ගෙන යෑම සඳහා ගොනුන් ඉක්මණින් දක්කනු පිණිස සෙක්කුව පදවන්නෙක් ද අවශ්‍ය වේ. එම පදවන්නාට වාඩි විය හැකි පරිදි සෙක්කු දණ්ඩෙහි කෙළවර සවි කරන ලද සිරස් ලෑලි කැබැල්ලකි. සෙක්කු දණ්ඩ මත තරමක විශාල කළුගල් ද පටවනු ලබන්නේ ගවයන්ට බර දැනෙනු පිණිස ය. සෙක්කු ගලෙහි දැවමය උපාංග රාශියක් ඇති බැවින් අව් වැසි දෙකෙන් විනාශ වීමට ඇති ඉඩ කඩ වැඩිය. එබැවින් සෙක්කු ගලට ඉහළින් වහළක් ගසා ආරක්ෂාව සපයා ගනු ලැබේ.

''ඔහු පාන්දර යාමේ සෙක්කුවෙහි දමන පොල් වඩිය හිඳ අවසාන කරන්නේ හවස් වරුවෙහි ය. සෙක්කුවෙහි යටි වනෙහි එකතුවන තෙලින් බින්දුවකුදු ඉතිරි නොකොට ඇදගත් පසු සෙක්කු කටෙහි ගල් බිත්තිය වසාගත් පුනක්කු වියළෙයි. ඉන් පසු ඔහු පන්දම අල්ලන්නේ වියලුණු පුනක්කු පදමට කර කරනු පිණිසයි.'' (වික්‍රමසිංහ, 1963ː 16)
උක්ත උපුටනය සෙක්කුවේ දෛනික කටයුතුවල අවසානය තේරුම් ගැනීම පිණිස වැදගත් වේ.

### 4.4. ආර්ථික, සමාජ හා සංස්කෘතික බලපෑම

ලන්දේසි ඉංග්‍රීසි පාලන සමයන්හි දී සෙක්කු කර්මාන්තය වෙත වැඩි වශයෙන් යොමු වූවෝ දේශීය නිලධාරී ප්‍රභූ පන්තිය යි. යටත්විජිත ආණ්ඩුව යටතේ මුලාදෑනි, මුදලි, මුහන්දිරම් ආදි තනතුරු හිමි කර ගත් ඔවුනට දේශීය ජනතාව අවනත කර ගෙන එමගින් ස්වකීය කර්මාන්ත කටයුතු පවත්වා ගැනීමට හැකියාව ලැබුණි. එයට සමගාමී ව ඔවුන්ගේ සමාජ තත්ත්වය ද ඉහළ නැගුණි. ඒ ඒ සෙක්කු කර්මාන්ත හිමියන් අතර ඥාතිත්වය ගොඩනැංවීමට අන්තර් විවාහ සබඳතා හේතුවී තිබේ. එම නිසා සෙක්කු කර්මාන්ත විශාල ප්‍රමාණයක් පැවතිය ද ඒවා බොහොමයක් එක ම ඥාති පවුල් කිහිපයකට අයිති විය. අහංගම ගොවියාපාන ප්‍රදේශයේ දී 20වැනි ශතකයේ මුල් භාගයේ දී සෙක්කු 6ක් පමණ ක්‍රියාත්මක වෙමින් පැවති බවට සාධක හමු වේ (ක්ෂේත්‍ර අධ්‍යයනයඃ ගොවියාපාන, 2020.01.23). කොග්ගල ප්‍රදේශය ආශ්‍රිත සිදුවීම් මූලබීජය කර ගෙන රචිත 'කරුවල ගෙදර' නවකතාවක් වුව ද සෙක්කු කර්මාන්තය පිළිබඳ අවබෝධයක් ලැබීමට එහි අන්තර්ගත කරුණු ප්‍රයෝජනවත් ය.
''තිනන් (පුද්ගල නාමයකි) රුපියල් හැත්තෑ පහක් වියදම් කොට ගල් සෙක්කුවක් ගෙනැවිත් වත්ත පහළ තැනක සිටවූයේ ය...ගමේ ආරච්චිට ද සෙක්කුවක් ඇත. මැද පන්තියේ තවත් කිහිප දෙනෙකුන්ට ද සෙක්කු ඇත. ඒ කවුරුත් කුලියට වැඩ කරන ගැමියන් ලවා පොල් හින්දවති.'' (වික්‍රමසිංහ, 1963ඃ 15)

සාමාන්‍ය ජනතාව මුහුණ දුන් අගහිඟතා ප්‍රයෝජනයට ගත් ඇතැම් ප්‍රභූ නිලධාරීහු උපක්‍රමශීලී ලෙස ගම්වැසියන් සතු කුඩා පොල් ඉඩම් ද තමන් වෙත පවරා ගැනීමට කටයුතු කළහ. ණය ලබාදීම, උකස් ගැනීම ආදි කටයුතු මගින් සෙක්කු කර්මාන්ත හිමියෝ වේගයෙන් විශාල ප්‍රමාණයේ පොල් ඉඩම් හිමියන් බවට පත් වූහ. එසේ ඉඩම් පවරාගත් ඇතැමෙක් තවදුරටත් ගම්වැසියන්ට ම ඒවායේ ජීවත්වීමට අවකාශ ලබා දුන්හ. එහෙත් එයින් පසු ව එම වැසියන්ට ස්වාධීනත්වය අහිමි වූ අතර ඉඩම් හිමියන්ගේ සෙක්කු කර්මාන්තවල අඩු මුදලට වැඩ කරන යටත් වැසියන් වීමට සිදු විය. එම පසුබිම මත පැරණි වැඩවසම් ලක්ෂණ සෙක්කු කර්මාන්තය මගින් ප්‍රකට ව පෙනුණි. සෙක්කු කර්මාන්ත හිමියෝ ආර්ථික අතින් ශක්තිමත් වීමත් සමග ධනවත් මධ්‍යම පාන්තිකයන් ලෙස වර්ධනය වූහ. සෙක්කු සහිත ගෙවල් එකල හඳුන්වා ඇත්තේ 'සෙක්කු ගෙදර' නමිනි. ''සෙක්කු ගෙදර මංගලිකා දීග ගියෙත් නෑ, තවමත් මං හිතන්නේ උඹ එනකං බලා ඉන්නවා" රෝහණ බැද්දගේ සූරීන්ගේ පද රචනයෙන් හා සංගීතයෙන් ගැයෙන උක්ත ගීතය එම ඉතිහාසය සිහිපත් කරවයි. කුඩා කාලය ගාල්ලේ බෙන්තර ප්‍රදේශයේ ගත කොට තිබූ ජයකුමාර රංචාගොඩ මහතා අතීතකාමියකු ලෙසින් සෙක්කුව පිළිබඳ ඔහුගේ මතක දිගහැරියේ මෙලෙස යි.

''දකුණු පළාතේ පොල් ගස් වැඩිපුර තිබුණු වතු සහිත ගෙවල්වල සෙක්කුවක් තිබුණා. අපේ ගෙදරත්, ලොකු තාත්තලගෙ ගෙදරත් සෙක්කු තිබුණා. ඒක වැළලී ගිය සුන්දර අතීතයක්. ඒ කියන්නෙ ගාලු දිස්ත්‍රික්කය පුරා මුහුදු බඩ ප්‍රදේශවල විශේෂයෙන්. අපි බෙන්තර. හැම ගමක ම සෙක්කු තුන හතරක් තිබුණා. ගාලු පාර දිගේ මාතරට වෙනකම් බස් එකේ යද්දි පාලුවට ගිය සෙක්කු ගල් ගණන් කරනව මම ඉස්සර. ඒ තරම් තියෙනවා. මාර්ටින් වික්‍රමසිංහ මහත්තයගෙ වත්තෙත් තියෙනව එකක්." (සම්මුඛ සාකච්ඡා, ඉඳුරුව, 2021.01.16)

ගාල්ල සහ මාතර අවට සෙක්කු කර්මාන්තයේ දී තෙල් නිපදවීමට බහුලව යොදා ගනු ලැබුවේ කොප්පරා ය. සෙක්කු හිමියෝ ගෙවතුවලින් ම පොල් සපයා ගත් අතර සුළු වශයෙන් පොල් වගා කළ ගැමියන්ගෙන් ද පොල් මිලට ගත්හ. 1894 පමණ වන විට පොල් ගෙඩියක මිල ශත තුනක් පමණ විය. ගැමියන්ගේ පොල් මිලදී ගැනීම සඳහා සෙක්කු හිමියන්

අතර තරගකාරීත්වයක් ද එකල නිර්මාණය වී තිබුණි. වැඩි මිලක් ගෙවන සෙක්කු හිමියන් වෙත තම ගෙවත්තේ පොල් විකිණීමට ගැමියන් යොමුවීම නිසා අනෙක් අය අභිබවා යෑමට වැඩි පොල් ප්‍රමාණයක් රැස් කර ගැනීම සඳහා වැඩි මුදලක් ගෙවීමට ඇතැමුන් යොමු ව තිබේ. එසේ මිලදී ගන්නා පොල් කරත්ත මගින් සෙක්කු කර්මාන්ත ස්ථානය වෙත ගෙනෙන ලදි. ගැමියන් ස්වකීය අවශ්‍යතාවන්ට ණය ලබා ගත්තේ සෙක්කු හිමියන්ගෙනි. එකී මුදල පියවීමට නොහැකි වූ අවස්ථාවල දී ඉතා සුළු මුදලකට තමාගේ පොල් සෙක්කු හිමියන්ට ලබා දීමට සිදු විය. එකතු කර ගනු ලබන පොල් ලෙලි ගසා සතියක් පමණ කුරුවල් වීමට ඉඩ හැරීමෙන් කොප්පරා සකස් කර ගෙන තිබේ. සෙක්කු කර්මාන්තය ආරම්භ වූ ලන්දේසි ඉංග්‍රීසි යුගවල දී ම කොප්පරා වටිනා වාණිජ භාණ්ඩයක් ලෙස සැලකුණි. 1960 දශකයේ දී ද කොප්පරා වැදගත් වාණිජ භාණ්ඩයක් වූ බවට පහත උද්ධෘතය සාක්ෂි දරයි.

''අපි අතිරේක වශයෙන් කොප්පරා වියලනවා. වේලන කාමරවල දුම් ගස්සනවා. මෙයින් කොටසක් අපි අපනයනය කරනවා. කොටසක් මාතර තෙල් මෝල් වලට යවනවා" (යාකව්ලෙෆ්, 1983: 312)

සෙක්කු කර්මාන්තයේ දී භාවිතයට ගන්නා කොප්පරා වර්ග කිහිපයකි. බරින් මෙන් ම ගුණාත්මක බවින් ද ඉහළ වර්ගය වන්නේ සුදු කොප්පරා ය. සම්පූර්ණයෙන් ම අව්රශ්මියෙන් පමණක් වේලන කොප්පරා එනමින් හැඳින්වේ. තවත් කොප්පරා වර්ගයක් වන වතු කොප්පරා ප්‍රභේද කිහිපයකින් ම යුක්ත ය. එක, දෙක, තුන සහ මිශ්‍ර යන ප්‍රභේද ඒවාට අයත් ය. වතු කොප්පරාවල සීයට 68ක පමණ තෙල් අන්තර්ගත ය. දකුණු පළාතේ දී කොප්පරා ක්‍රම කිහිපයකට සකස් කර ගනු ලැබේ. එනම් අව්වේ දමා වියළීමෙන් සහ කෘත්‍රිම ආකාරයට වියළීමෙනි (පෝරනුවල ආධාරයෙන්). ලෙලි ඉවත් කර සතියක් පමණ තබන ලද පොල් බිඳ අව් රශ්මිය වදින ලෙස අතුරනයක දමා බිම තුනී කරනු ලැබේ. පසුව ඒවා මැස්සක දමා වේළීම සිදුකර තිබේ. අඩි එක හමාරක් පමණ පොළොව හාරා එම වළට ගින්දර දමා මතුපිට සකසන ලද මැස්ස මත අතුරා පොල් වේළාගනු ලැබේ. ගින්දර දැමීම සඳහා බහුල වශයෙන් භාවිත කර තිබෙන්නේ පොල් කටු ය. පොල්කටු එකිනෙකට සම්බන්ධ වැලක් ලෙස සකසා ගිනි තැබීම සිදු කරයි. පසුදා නැවත පොල් අනෙක් පැත්ත හරවා ගින්දර දැමීමෙන් පසු ව පහසුවෙන් කොප්පරා, පොල් කටුවෙන් ඉවත් කළ හැකි වේ. එසේ කොප්පරා ගැලවීම සඳහා පුවක් ලීයෙන් කළ පත්තක් ද ආධාර කර ගෙන තිබේ.

සෙක්කුව ක්‍රියාත්මක වීමේ දී සෙක්කු ගලේ සිදුර දිගේ ගලා ගෙන යන තෙල් පහළින් ඇති භාජනයට එකතු වූ පසුව පීප්පවල ගබඩා කොට හොඳින් වසා ආරක්ෂාකාරී ව තබා ඇත. දකුණු පළාතේ සෙක්කු හිමියන් විසින් නිෂ්පාදනය කරන ලද තෙල් ප්‍රධාන වශයෙන් ම රැගෙන ගියේ ගාලු වරායට යි. සාමාන්‍යයෙන් ගාලු වරායට ඔවුන් ගමන් කළේ මසකට එක් වරක් පමණ ය. ඒ ස්වකීය කරත්තවලිනි. සෙක්කු හිමියන්ට කරත්තයක් හෝ දෙකක් තිබීම සාමාන්‍ය දෙයක් විය. 1877-95 අවධියේ දී කොළඹ සිට මාතර දක්වා දුම්රිය මාර්ගය ඉදි විය (කරුණානන්ද, 1999: 129). ඒ අනුව මාතර අවට තෙල් නිෂ්පාදකයන්ට දුම්රිය භාවිත කරමින් ද තම නිෂ්පාදන ගාලු වරාය වෙත රැගෙන යෑමට අවකාශ උදා විය. එසේ රැගෙන ගිය තෙල් නැව් මගින් අපනයන කටයුතු කරන සමාගම්වලට ගාල්ලේ දී විකුණා තිබේ. ගාලුකොටුවේ තිබූ හේලි, රිකොච් වැනි සමාගම් එකල තෙල් මිලදී ගත් ප්‍රධාන පෙළේ සමාගම් ය. තෙල් පමණක් නොව කොප්පරා කපාපු පොල් හා පොල් ගෙඩි ද එම සමාගම් මගින් අපනයනය කරන ලදි. කෙසේ වෙතත් ඉහත සඳහන් කළ සමාගම්වලට තෙල් විකිණීමෙන් විශාල ආදායමක් සෙක්කු හිමියන්ට ලැබුණි. එම හේතුව මත දේශීය වෙළෙඳපොළට සෙක්කු හිමියන් විසින් තෙල් නිකුත් කරනු ලැබුවේ ඉතා සුළු වශයෙනි. එකී

වෙළෙඳ සමාගම් ද නිෂ්පාදකයන්ගෙන් තෙල් ලබා ගැනීම සඳහා තරගකාරී ව කටයුතු කර ඇත. 1820 පමණ වන විට ගාලු වරායෙන් ලබා ගත් පොල්තෙල් කොරමැන්ඩල් වෙරළට අපනයනය කළ බව සඳහන් ය (අමරසේන, 1979: 85). 1820 දී සෘජුව ම පොල්තෙල් තොගයක් එංගලන්තයට යැවූ බව වාර්තාවල දැක්වේ (කරුණානන්ද, 1999: 128). විවිධ විදෙස් සමාගම් තරගකාරී ව දිවයිනේ තෙල් නිෂ්පාදන ලබා ගැනීමට කටයුතු කළ ආකාරය එම සමාගම් සහ බ්‍රිතාන්‍ය පරිපාලන නිලධාරීන් අතර හුවමාරු වූ ලේඛනවලින් තහවුරු වේ (Coconut Oil and Copra, purchase of, for H.M.S. Governer). ශ්‍රී ලංකාවේ කොප්පරා සඳහා ජර්මනියෙනුත් පොල්තෙල් සඳහා ඕලන්දයෙනුත් ඉහළ ඉල්ලුමක් පැවතුණි (Twenieth Century Impressions of Ceylon, 1907: 251; කරුණාන්ද, 1999: 130). සබන්, ඉටිපන්දම් සහ මාගරින් ආදිය නිපදවීම සඳහා යොදාගැනුණු බැවින් විදෙස් රටවල පොල් ඉල්ලුම ඉහළ යන්නට විය (Jayawardena, 2007: 144). පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ට ඉහළ මිලක් ලැබීම නිසා තව තවත් ඒ ආශ්‍රිත ආයෝජනයන්ට දේශීය ව්‍යාවසායකයෝ නැඹුරු වූහ. 1915 වන විට එවැනි අපනයනයන්ගෙන් රුපියල් දස ලක්ෂ 42.9ක් ලැබී තිබේ (Wickramaratna, 1937: 428). 1960 පමණ වන විටත් ලෝක වෙළෙඳපොළ තෙල් නිර්යාතයෙන් 30%ක් පමණ සපයමින් ප්‍රධාන තෙල් සපයන්නා වූයේ ශ්‍රී ලංකාව යි (යාකව්ලෙෆ්, 1983: 306-307).

පසු කාලීන ව සෙක්කු හිමියෝ දේශීය වෙළෙඳපොළ සඳහා ද තරගකාරී ව තෙල් ලබාදීමට උත්සුක වූහ. සෙක්කු කර්මාන්ත හිමිකරුවෝ සෙක්කුවේ කටයුතුවලට දායකත්වය සපයන ගැමියන්ට ද තෙල් නිකුත් කළහ. ඒ සාමාන්‍ය වෙළෙඳපොළ මිලට වඩා අඩුවෙනි. කරත්තවල අසුරා විවිධ ප්‍රදේශවලට ගෙන ගොස් තෙල් අලෙවි කිරීමට ද සෙක්කු හිමියෝ හා ප්‍රදේශයේ වෙළෙන්දෝ යොමු වූහ. ඒ අනුව දකුණු පළාතේ සිට හැටන් සහ නාවලපිටිය වැනි දුර බැහැර ප්‍රදේශවලට ද තෙල් ප්‍රවාහනය කළ බව හෙළිදරව් වේ. දකුණු පළාතේ මාර්ග පහසුකම් ද සෙක්කු කර්මාන්තයට සමගාමී ව දියුණු වී තිබේ. සෙක්කු තෙල් කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය හා නිෂ්පාදනය ප්‍රවාහනය කිරීමට කරත්තවලට ගමන් කළ හැකි මාර්ග ප්‍රදේශයේ ඉදිවුණි. සෙක්කු කර්මාන්තය පවත්වා ගෙන ගිය සෑම නිවසකට ම පාහේ කරත්තයක් අයිති වූ බැවින් ඒවා ගමන් කළ හැකි මට්ටමේ මාර්ග ද ඉදි කරවා ගෙන තිබුණි. ඉන්ද්‍රාණි මුණසිංහට අනුව මාතර - අකුරැස්ස, මාතර - හක්මණ ආදි මාර්ග ඉදි වී තිබෙන්නේ පොල් වගාව හා සම්බන්ධ වෙමිනි (මුණසිංහ, 2017: 50). එම මාර්ග පහසුකම් භාවිත කළ වෙනත් දේශීය වෙළෙන්දෝ සෙක්කු කර්මාන්ත සිදු කරන ස්ථානයට පැමිණ තෙල් මිල දී ගත්හ. 20වැනි ශතකයේ ප්‍රථම දශකයේ එවැනි වෙළෙඳුන්ගෙන් බහුතරය වූවෝ වැලිගම ආශ්‍රිත මුස්ලිම් වෙළෙන්දෝ ය (සම්මුඛ සාකච්ඡා, ගොවියාපාන, 2021.01.23). එසේ තෙල් ලබා ගන්නා ඇතැමෙක් වැඩි මුදලකට විදේශීය සමාගම්වලට යළි එම තෙල් විකුණූහ. ඒ අනුව සෙක්කු කර්මාන්තය හා බැඳුණු නව වාණිජ කණ්ඩායමක් ද ක්‍රමයෙන් ප්‍රදේශයේ වර්ධනය විය.

පොල්තෙල් නිෂ්පාදනය මගින් ලැබුණු අමතර වාණිජ නිෂ්පාදනයක් වූයේ පුන්නක්කු ය. තෙල් වැස්සී ගිය පසු ව සෙක්කු වංගෙඩිය තුළ ඉතිරි වන රොඩ්ඩ පුන්නක්කු ලෙස හඳුන්වනු ලැබේ. එය ද වෙළෙඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් ඇති වාණිජ ද්‍රව්‍යයක් විය (Twenieth Century Impressions of Ceylon, 1907: 251). සෙක්කුවේ ප්‍රධාන ශ්‍රමය සපයන්නන් වන ගවයන්ට ද පුන්නක්කුවලින් ආහාර සැපයිය හැකි විය. ඌරන්, කුකුළන් සහ ගවයන් සඳහා පුන්නක්කු ඉතා යෝග්‍ය ආහාරයකි. එබැවින් සත්ව ගොවිපළ හිමිකරුවෝ පුන්නක්කු මිල දී ගැනීමට ඉදිරිපත් වූහ. බෙල්ජියම, ප්‍රංශය සහ ජර්මනිය වැනි විදේශ රටවල් ද සත්ව ආහාරයක් ලෙස පුන්නක්කු ලබා ගැනීමට කටයුතු කළහ. 1907 පමණ වන විට

පුන්නක්කු අපනයනයෙන් ලත් ආදායම වාර්තා කර ඇත්තේ පහත පරිදිය. ඒ අනුව බෙල්ජියමෙන් රු. 388,866, ප්‍රංශයෙන් රු. 16,000 සහ ජර්මනියෙන් රු. 632,953ක මුදලක් පුන්නක්කු අපනයනයෙන් ලැබී තිබේ (Twenieth Century Impressions of Ceylon, 1907: 254).

පොල්ගස ආශ්‍රිත කිෂ්පාදනයන්ගෙන් බ්‍රිතාන්‍යයන් අය කළ බදු රාජ්‍ය ආදායම් ශක්තිමත් කර තිබේ. 1827 - 29 දක්වා ගත වූ දෙ වර්ෂයක කාලය තුළ පොල් ගස ආශ්‍රිත නිෂ්පාදනවලින් අය කළ බදු පහත පරිදි ය. පොල්තෙල් බදු ආදායම පවුම් 413, කොප්පරා බදු ආදායම පවුම් 1539 පොල් ගෙඩිවලින් ලැබුණු බදු ආදායම පවුම් 1551 (අමරසේන, 1979ː 45) කෝල්බෲක් වාර්තාවේ දැක්වෙන ඉහත තොරතුරුවලට අනුව සෙක්කු හිමියන්ට ද විශාල මුදලක් බදු ලෙස ගෙවීමට සිදු වන්නට ඇත. ''කුඹල් සකින් ද තෙල් සිඳින සෙක්කුවලින්ද බදු අය කරනු ලැබීය.'' (වික්‍රමසිංහ, 1947ː 19) බදු ගෙවීමට සිදු වුව ද තම කර්මාන්ත සහ වාණිජ භාණ්ඩ කළමනාකරණය කර ගැනීමෙන් ප්‍රාමාණික ආදායමක් ලබා ගැනීමට සෙක්කු හිමියන්ට අවකාශ සැලසී තිබුණි. 1922 පමණ වන විට පොල් ආශ්‍රිත නිෂ්පාදනයන්ට අතිරේක බදු පනවමින් වාර්ෂිකව රුපියල් අනූදහසක ආදායමක් උපයා ගැනීමට ඉංග්‍රීසීන් විසින් ක්‍රියා කරනු ලැබ තිබේ (Memoranedum on The Proposed Coconut Research Scheme, 1924). සෙක්කු පොල්තෙල් සඳහා විශාල ඉල්ලුමක් ලැබීමත් සමග එය ලාභදායී කර්මාන්තයක් බවට පත් විය. 1839 පමණ වන විට පොල්තෙල් ගැලුමක් සඳහා සෙක්කු හිමියන්ට රුපියල් 6ක පමණ මුදලක් ලැබී තිබේ. සෙක්කුව මගින් හිඳින තෙල් ඉහළ ගුණාත්මක බවකින් යුක්ත නිසා විදෙස් සමාගම් ඒවා වැඩි වශයෙන් මිලදී ගැනීමට පෙළඹුණහ.

කේව්ට අනුව 1908 පමණ වන විට නවීන තෙල් මෝල් දිවයිනේ ස්ථාපනය කර තිබුණ ද සෙක්කු කර්මාන්ත 3000ක් පමණ ඒ වන විටත් ක්‍රියාත්මක වෙමින් පැවතුණි. (Cave, 1908: 222)



කේව් විසින් අමුණා ඇති සෙක්කුවක සේයාරුවක් (Cave 1908: 223)

සෙක්කු කර්මාන්තයේ දී ශ්‍රමය යනු ඉතා වැදගත් සාධකයකි. සෙක්කු හිමි රදළ ප්‍රභූන් අවශ්‍ය ශ්‍රමය සපයා ගත්තේ ස්වකීය ගම් ප්‍රදේශය තුළිනි. රදළ වැඩවසම් ක්‍රමය ක්‍රියාත්මක වෙමින් පැවති නිසා ඔවුනට පහසුවෙන් ශ්‍රමය සපයා ගත හැකි විය. පසු ව ක්‍රමයෙන් වැඩවසම් ලක්ෂණ අභාවයට ගිය ද දුප්පත් ගැමි ජනතාවගේ ශ්‍රමය සෙක්කු කර්මාන්තය සඳහා තවදුරටත් ලබා ගත හැකි විය. ගම්වැසියෝ දෛනික වැටුපට සෙක්කු කර්මාන්ත වෙත තම ශ්‍රමය ලබා දුන්හ. පොල් වේළීම, කොප්පරා සැකසීම සහ සෙක්කුවෙන් තෙල් නිපදවීම යන කාර්යන්ට ඔවුන්ගේ ශ්‍රමය සැපයිය යුතු විය. ඇතැම් සෙක්කු කර්මාන්ත හිමියෝ ස්වකීය ශ්‍රමිකයන්ට වැටුපට අමතර වශයෙන්, දිවා ආහාරය සහ තේ ලබා දුන්හ. සෙක්කු කර්මාන්තයේ ව්‍යාප්තියත් සමග නව රැකියා අවස්ථා නිර්මාණය වීම ද ප්‍රදේශයේ ආර්ථික තත්ත්වයේ වර්ධනයට හේතු විය (මුණසිංහ, 2017: 33). එහෙත් ඔවුනට ලබා දුන් දෛනික වැටුප ඉතා සුළු මුදලක් විය. අහංගම රත්නායක මහත්මාට අනුව 1939 වන විට එය රුපියලක් පමණ විය (සම්මුඛ සාකච්ඡා, අහංගම, 2021.01. 14). එය ජීවත්වීමට ප්‍රමාණවත් මුදලක් නොවූ බැවින් කල්යන විට ගම්වැසියෝ සෙක්කු කර්මාන්තය ස්වකීය ජීවනෝපාය කර නො ගත්හ. ගොවිතැන් හෝ වෙනත් කුලී වැඩක් නොමැති අවස්ථාවල දී පමණක් සෙක්කු කර්මාන්තයට ශ්‍රමය සැපයීමට ඉදිරිපත් වූහ. මුල් කාලයේ දී සෙක්කු හිමියන් තමන් සහ පවුලේ අය සෙක්කුවේ වැඩ කිරීම මදි පුංචිකමක් ලෙස සැලකුව ද පසු කාලයේ දී ඔවුන් ද ස්වකීය සෙක්කු කර්මාන්තයට ශ්‍රමය සපයන්නන් ලෙස සම්බන්ධ වී තිබේ.

''පොල් හිඳීම පිළිබඳ සියලු දේ කරන්නේ තිනන් ය. පොල් එකතු කරනු සඳහා ඔහු බරබාගේ කරත්තයක් හා ගොනකු ද මිලට ගත්තේ ය. බිරිඳගෙ නෑ කොලුවකු ඔහු කරත්තය දැක්කීමටත් ගොනාට සාත්තු කිරීමටත් ගෙදරට ගෙන්වා ගත්තේ ය. ගෙදර මිදුලේ ගොඩගැසෙන පොල් ඔහුම ඔයයි. පොල් ඔයනු පිණිස ඔහු කුලියට ගැමියකු ද ගනියි.'' (වික්‍රමසිංහ, 1963: 15)

සෙක්කුව සා බැඳුණු සංස්කෘතිකමය චරිනාකම් ද පැවතුණි. සිංහල හා හින්දු අලුත් අවුරුද්ද සහ සෙක්කුව අතර තිබී ඇත්තේ අවියෝජනීය බැඳීමකි. අවුරුදු කාලයට ගමේ සෑම නිවසක ම පාහේ රස කැවිලි සකසන නිසා තෙල් ඉල්ලුම ඉහළ යන බැවින් අවුරුදු කාලය සෙක්කුවට වැඩ අධික කාලයක් වී තිබේ. බොහෝවිට ගම්වල කාන්තාවන් සාමූහික ව පොල් ගා මාගල්වල දමා වියළාගෙන සෙක්කු ගෙදරට ගෙන එන්නේ කල්දේරම්වල දමාගෙන ය. එහි දී ලබා ගන්නා පිරිසුදු ම තෙල්වලින් අලුත් අවුරුද්ද සඳහා කැවුම් කොකිස් සකසා ගෙන තිබේ. අවුරුදු සහ වෙසක් සමයේ දී හැකි තරම් තෙල් හිඳගැනීමට ගම්වැසියෝ උත්සුක වූහ.

''ඉඳහිටල වත්තක තනිවුණ සෙක්කු ගලක් දැක්කාම සෙක්කු වැඩ කළ කාලෙ මතක් වෙනව. ඒ කාලෙ දැන් වගේ නෙමේ අපි පුන්නක්කු කන්න හරිම ආසයි. සිල්ලර කඩෙන් ඉසසරහ ම තිබුනෙ පුන්නක්කු ගෝනියක් සිල්ලර කඩේ ගියොත් පුන්නක්කු කෑල්ලක් නොකා ආ දවසක් මට නම් මතක නෑ. මම විතරක් නෙමේ අපේ යාලුවො හැමෝමත් පුන්නක්කු කෑවා. අද පරපුරට දකින්න ම නැති දේවල් අතරට මේ සෙක්කුවත් එකතු උනා එහෙමනම්." (කපිලසේනඃ 2021.01.16)
ඉහත දක්වනු ලැබුවේ සෙක්කුව හා බැඳුණු කපිලසේන මහත්මාගේ මතකය යි. මාර්ටින් වික්‍රමසිංහ සූරීහු අපේ ගම ග්‍රන්ථයේ සෙක්කුව පිළිබඳ විස්තර මෙසේ ලියා තැබූහ.

''උදය වරුවේ වැඩ පටන් ගන්නා සෙක්කුකාරයකු ගල් සෙක්කුවේ ලා හිඳීමට ගන්නා පොල් වඩියේ වැඩ අවසාන වන්නේ සවස් කාලයේය. තෙල් ඉවතට ගෙන ඇඹරීමෙන් පදම් වූ පොල් ටික පුන්නක්කු වූ පසු ඉතිරිව රැඳී ඇති තෙල් මාරුව නැති කිරීමට පන්දම් අල්ලනු ලැබේ. උදයවරුවේ සිට හවස් වන තෙක් ඇඹරීමෙන් හා මැඩීමෙන් වෙහෙසට පත් වූවාක් මෙන් සෙක්කුව වෙහෙස නොඉවසිය හැකිව එසේ හඬ නගතත් සචේතනික ගවයෝ දෙදෙනා කරබාගෙන තම ස්වාමියාට සේවය කරති. පොල් හිඳින්නාගේ අවසරය ඇතිව සෙක්කු කඳ උඩ වාඩිවී සෙක්කු පදින ළමයි හැම සෙක්කුවකම පාසා දකින්න ලැබෙත්." (වික්‍රමසිංහ, 1940ඃ 28-29)

එයට ම සමාන විස්තර 'කරුවල ගෙදර' ග්‍රන්ථයේ ද සංගෘහිත ය.

''පන්දමට හසුව කරවන පුනක්කුවලින් නිකුත්ව පැතිරෙන්නේ කරවන බිබිකම් පුස්ඹ වැන්නකි. උදේ සිට සවස් වන තෙක් වැඩ කිරීමෙන් හෙම්බත් වුණාක් මෙන් සෙක්කුව හඬන්නේ මේ අවස්ථාවෙහි ය. ඒ හැඬීම අසන අහළ පහළ ගෙවල ළමයි දුව එති. තිනන් සෙක්කු මෝල් ගසට කරදීමෙන් එය උස්සා එළියට ගනියි. අනතුරුව සෙක්කු වන වසා සිටින මුදුන නැති තුර්කි තොප්පියක් වැනි පුනක්කු වටය අලවංගුවෙන් දෙබෑ කොට එළියට ගනියි. පනිට්ටු පලු දෙකක් වැනි පුනක්කු පලුදෙක බලන තිනන්ගේ මුහුණ සන්තෝෂයෙන් එළිය වෙයි. ළමයෙක් සුවඳැති උණු පුනක්කු පළුවකින් ඇබිත්තක් කඩාගෙන කයි. අනික් ළමයි ද ඔහු අනුගමනය කරති.'' (වික්‍රමසිංහ, 1963ඃ 16)

### 4.5. සෙක්කු කර්මාන්තයෙහි පරිහානිය

වසංගත සහ ආහාර මිල ඉහළ යාමට සාපේක්ෂ ව තෙල් මෝල් අක්‍රිය වෙමින් පැවති බව 1918 දී රාජ්‍ය ලේකම් වාර්තා කරයි (Coconut Oil and Copra, purchase of, for H.M.S. Governer). එවැනි තත්ත්වයන් මත පවත්වා ගෙන ආ සෙක්කු කර්මාන්තය 1940 පමණ වන විට ක්‍රමයෙන් පරිහානියට පත් වීම ආරම්භ විය. ඒ සඳහා බලපෑ කරුණු රාශියකි. වාෂ්ප

බලයෙන් සහ ඉන්ධන මගින් ක්‍රියා කරන තෙල් මෝල හඳුන්වාදීම ඒ සඳහා බලපෑ ප්‍රධාන කරුණකි. ගාල්ල සහ මාතර ප්‍රදේශවල එවැනි තෙල් මෝල් කිහිපයක් ම පිහිටුවා තිබුණි. සෙක්කුවෙන් මෙන් වඩා ගුණාත්මක තෙල් එම මෝල්වලින් නොලැබුණ ද අවම කාලයක් සහ අවම ශ්‍රමයක් යොදවමින් වැඩි තෙල් ප්‍රමාණයක් ඒවායින් නිෂ්පාදනය කළ හැකි විය. එම නව යන්ත්‍ර සමඟ සාම්ප්‍රදායික සෙක්කු කර්මාන්තයට තරග කිරීම පහසු නො වී ය. සෙක්කු කර්මාන්තය සඳහා මිනිස් ශ්‍රමය ද විශාල වශයෙන් අත්‍යවශ්‍ය විය. අඩු වේතනයකට සෙක්කු කර්මාන්තයේ නියැලීම වෙනුවට ගම්වැසියෝ වැඩි වැටුප් ලැබිය හැකි රැකියා වෙත නැඹුරු වූහ. එසේ ම සෙක්කු හිමියන් ධනයෙන් ආඪ්‍ය වීමත් සමඟ ඔවුනගේ දරුවන්ට වැඩි වශයෙන් උසස් අධ්‍යාපන අවකාශ විවෘත විය. එවැනි අධ්‍යාපනයක් ලැබීමෙන් පසු ව ඔවුන්ගෙන් බහුතරය අධ්‍යාපන තත්ත්වයට සරිලන රාජ්‍ය සේවයේ රැකියාවන් ලබා ගැනීමට මිස තවදුරටත් පාරම්පරික කර්මාන්තය පවත්වා ගැනීමට නැඹුරු නො වූහ. එම හේතු මත සෙක්කු කර්මාන්තයට අවශ්‍ය මානව ශ්‍රමය සපයා ගැනීම අපහසු විය. අනෙක් අතින් කොප්පරා සහ පොල් ගෙඩි අලෙවි කිරීම සෙක්කුවෙන් තෙල් නිපදවා අලෙවි කිරීමට වඩා ලාභදායී විය.

"1960 දශකයේත් අපේ පළාතේ සෙක්කු වැඩ කළා. හැත්තෑ ගණන් වෙන කොට ඉවරයි. පස්සෙ අපේ ගම්වල ඒවා අභාවයට ගියා, ලයිට් ඒමත් සමග. සෙක්කු වෙනුවට මෝල් ආව. සෙක්කු ගල් ඇන්ටික්වලට වික්කා. බෙන්තොට බීච් හොටෙල් එකේ ප්‍රධාන පඩි පෙළේ නිකල් ගරාදි සවි කරල තියෙන්නෙ සෙක්කු ගල් පේලියක. ඒ පැතිවලට සංචාරක ව්‍යාපාරය ආවට පස්සෙ සෙක්කු ගලුත් විකුණුවා ඇන්ටික්වලට." (සම්මුඛ සාකච්ඡා, ඉඳුරුව, 2021.01.16)

අද වන විටත් ශේෂ ව ඇති සෙක්කු ගල් සංචාරක හෝටලවලින් මිල දී රැගෙන යනු ලබන්නේ සෙක්කු ගලකට රු 5,000ක් පමණ ගෙවීමෙනි (සම්මුඛ සාකච්ඡා, වැලිගම, 2021.01.24). දකුණු වෙරළ තීරයේ සෙක්කු කර්මාන්තය සම්පූර්ණයෙන් ම අභාවයට ගිය ද තැන්තැන්වල යළිත් සෙක්කු කර්මාන්තය විවිධ අරමුණු මත ආරම්භ කිරීමේ උද්‍යෝගයක් ද හඳුනා ගත හැකි ය (ලංකාදීප, 2013.11.25). අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව ප්‍රදේශයේ සෙක්කුපිටිය ගම්මානයේ ඖෂධීය තෙල් සහ තලතෙල් නිෂ්පාදනය කිරීමට සෙක්කුව භාවිත වන ආකාරය අදටත් දැක ගත හැකි ය. එහි දී සාම්ප්‍රදායික ව භාවිත ගවයා වෙනුවට යොදා ගන්නේ අත් ටැක්ට්‍රය යි (දිවයින, 2013.09.08).

### 4.6. නූතන උපයෝගිතාව

සෙක්කුව වර්තමාන විසි එක්වැනි ශතාබ්දයට ප්‍රයෝජනවත් අංගයක් දැයි විමසිය යුතු ය. සෙක්කු කර්මාන්තය සඳහා සැපයිය යුතු ශ්‍රමය සහ කාලය අධික බැවින් වාණිජකරණය වූ සමාජයකට තවදුරටත් සෙක්කුව භාවිත කිරීම අපහසු ය. එම හේතුව මත සෙක්කුවට වඩා පහසුවෙන් තෙල් නිෂ්පාදනය කළ හැකි ක්‍රමෝපායන් ජනප්‍රිය වීම වැළැක්විය නොහැකි තත්ත්වයකි. එහෙත් පැරණි තාක්ෂණික ඥානය විදහා දක්වන සෙක්කුව සජීවී කෞතුකාගාරයක් ලෙස පවත්වා ගත හැකි ය. සංචාරකයන් බහුල ව ගැවසෙන දකුණු වෙරළ තීරයේ දේශීය සහ විදේශීය සංචාරකයන් ආකර්ෂණය කර ගන්නා අංගයක් ලෙස සෙක්කුව පවත්වා ගෙන යා හැකි ය. නූතන ශ්‍රී ලංකාවේ දේශීය සහ ස්වභාවික ආහාරපාන මෙන් ම භාණ්ඩ ද උත්කර්ෂයට නැංවීමේ නැඹුරුවක් ඇත. නිෂ්පාදනයේ දී තෙල් රත්වීම අවම මට්ටමක පවතින බැවින් සෙක්කු පොල්තෙල් ගුණාත්මක බවින් ඉහළ ය. එම තෙල් ශරීරයට අහිතකර නොවන බැවින් සෙක්කු තෙල්වලට විශාල ඉල්ලුමක් ද පවතියි. පොල්තෙල් නිෂ්පාදකයන්ගෙන් ඇතැමෙකු 'සෙක්කු පොල්තෙල්' යන නමින් පොල්තෙල් අලෙවි

කරන්නේ එහි ඇති වාණිජ වටිනාකම මනාව වටහා ගෙන ඇති බැවිනි. (S H G Hela Osu: 2021.01.04) සංචාරක කර්මාන්තයට සමගාමී ව ප්‍රදර්ශනාත්මක වශයෙන් සෙක්කුව ක්‍රියාත්මක කළ හැකි අතර එහි දී නිෂ්පාදනය කෙරෙන තෙල් වැඩි මිලකට අලෙවි කරමින් ආර්ථික වටිනාකමක් ලබා ගැනීමේ ශක්‍යතාව පවතී. එමගින් පැරණි තාක්ෂණික ඥානය සංරක්ෂණය කරමින් මතු පරපුර දැනුම්වත් කිරීමේ අවකාශය ද සලසා ගත හැකි ය.

## 5. සමාලෝචනය

අනුරාධපුර යුගයේ පටන් පොල්ගස සහ පොල්තෙල් ශ්‍රී ලාංකේය සංස්කෘතිය සමග ආබද්ධ ව පැවතුණි. එහෙත් වාණිජ භෝගයක් ලෙස පොල් ගසට වැඩි ඇගයුමක් ලැබුණේ ලන්දේසි සහ ඉංග්‍රීසි පාලන සමයන්හි දී ය. දේශීය ව්‍යවසායකයන් ඒ වෙත නැඹුරුවීමත් සමග කොළඹ සිට මාතර දක්වා වෙරළ තීරය අවට පොල් වගාව ශීඝ්‍ර ව ව්‍යාප්ත විය. පොල් ගසින් විවිධ නිපැයුම් සිදු කළ අතර තෙල් නිෂ්පාදනය එයින් එකක් පමණී. පොල්තෙල් නිෂ්පාදනය සඳහා භාවිත කළ යන්ත්‍රය සෙක්කුව යි. එය හුදු යාන්ත්‍රික කටයුත්තකට සීමා නොවූ අතර, එය එකල සමාජ, ආර්ථික හා සංස්කෘතික ව්‍යුහයන් සමග බැඳී පැවතුණි. සෙක්කු හිමියෝ ස්වකීය නිෂ්පාදන විදේශීය සමාගම්වලට සහ දේශීයයන්ට අලෙවි කරමින් ධනයෙන් සමෘද්ධිමත් වූහ. යටත් විජිත තනතුරු ලබා ගැනීමට එම ධනවත් භාවය උපයුක්ත කර ගත් ඔව්හු එකී ධනය සහ බලය භාවිත කරමින් සමාජ තත්ත්වය උත්කර්ෂවත් කර ගත්හ. ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය නංවාලීමට ද සෙක්කු කර්මාන්තයට හැකි විය. ප්‍රදේශයේ මහා මාර්ග පද්ධතියෙහි වර්ධනයට සෙක්කු කර්මාන්තය ඉවහල් වුණි. කුඩා කුඩා පොල්වතු හිමියන්ට ඉඩම් අහිමිවී යෑ ම වැනි අතුරු ප්‍රතිඵල ද එමගින් විද්‍යමාන විය. යම් වැඩවසම් ලක්ෂණ ප්‍රකට කළ සෙක්කු කර්මාන්තය වටා ගොඩනැංවුණු සංස්කෘතියක් ද ගාල්ල මාතර ප්‍රදේශයන්හි පැවතුණි. අද වන විට සෙක්කුව අභාවයට ගොස් තිබුණ ද නව සමාජ ආර්ථික අවශ්‍යතා වෙනුවෙන් එය තවදුරටත් භාවිත කළ හැකි වන්නේ නව නිර්මාණශීලී අදහස් සමග ගළපා ගනිමිනි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍ර

ඌනපූරණ සහිතො මහාවංසො. (1959). (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි. කොළඹː ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

පිලීතියස් දුටු ලංකාව. (2009) (පරි.). පාලිත ජයකොඩි. කොළඹː දයාවංශ ජයකොඩි සහ සමාගම.

විශුද්ධි මාර්ග සන්නය. (1888). (සංස්.) ධර්මරත්න. කොළඹː ලක්මිණි පහන මුද්‍රණාලය.

Bertolacci, Anthony (1817). A View of the Agricultural, Commercial, and Financial Interests of Ceylon. London: Black, Parbury and Allen.

Cave, Henry (1908) The Book of Ceylon. London: Cassell and Company Limited Paris, New York: Toronto and Melbourne.

Coconut Oil and Copra, purchase of, for H.M.S. Governer, Archives 3076 Gilles, Helen T (1948). Ceylon, Island Of The "Lion People" (Pamphlet)ග

Twentieth Century Impressions of Ceylon (1907). (ed.) Arnold Wright, London, Durban, Colombo, Perth (W.A.), Singapore, Hong Kong: Lloyd's Greater Britain Publishing Company, Ltd.

**ද්වීතීයික මූලාශ්‍රය**

අමරසේන, එස්. (1979). ශ්‍රී ලංකා ආර්ථික භූගෝල විද්‍යාව. කොළඹ: සරසවි මුද්‍රණ ශිල්පීන් හා ප්‍රකාශකයෝ.

කරුණානන්ද, උක්කුබණ්ඩා (1999). ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය. කර්තෘ ප්‍රකාශන.

මුණසිංහ, ඉන්ද්‍රාණි (2017). ශ්‍රී ලංකාවේ වැවිලි ආර්ථිකය හා වෙළුණු මහා මාර්ග සංවර්ධනය. කර්තෘ ප්‍රකාශන.

වික්‍රමසිංහ, මාර්ටින් (1940). අපේ ගම. කොළඹ: සිලෝන් ප්‍රින්ටර්ස්.

සිරිවීර, ඉන්ද්‍රකීර්ති (2001). රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි. කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම.

Achaya, K.T. (1990). Oilseeds and Oilmilling in India: A Cultural and Historical Survey. New Delhi, India: Oxford and IBH.

Achaya, K.T. (1993). Ghani: The traditional oil mill of India. Kemblesville: Pennsylvania: U.S.A.: Olearius Editions.

Clough's Sinhala English Dictionary (1982). New Delhi: Asian Educational Service.

Jayawardena, Kumari (2007). Nobodies to Somebodies. Colombo: Social Sciences' Association and Sanjiva Books.

Pathiraja, P.M.E.K., Griffith, G.R., Farquharson, R.J., and Faggian, R. (2015). "The Sri Lankan Coconut Industry: Current Status and Future Prospects in a Changing Climate". Australasian Agribusiness Perspectives, Paper 106.

Richards, A.G., (1924). Memorandum on The Proposed Coconut Research Scheme. Colombo: Acting Government Printer.

Wickramaratna, L.A (1937). Economic Development in the Plantation Sector 1900 – 1947. History of Ceylon,.Vol. III. Colombo: University of Ceylon.

### පුවත්පත් ලිපි

දිවයින 2013.09.08, ඒකනායක, සුදත් ''සෙක්කු කරකවමින් සුවඳ ගහන තල තෙල් හිඳින සෙක්කුපිටියේ ඇත්තෝ'' කොළඹː උපාලි පුවත්පත් සමාගම.

### අන්තර්ජාල ලිපි

නිරංජන්, ''පොල්තෙල් ඇත්තටම අහිතකරද?'' https://worldbeyondworld.blogspot.com
පීරිස්, කපිල (2009). ''සෙක්කුවේ අපේ ඉංජිනේරු සම්ප්‍රදාය'' http://www.vidusara.com

https://www.facebook.com/shghelaosu/posts/833590703869102

# Use of literature-based online ESL materials in enhancing the English speaking skills of undergraduate learners

Ruwan Gunawardane[1*], Shavindra Chandradasa[2], H.H. Senevirathne[3]

Faculty of Science, University of Ruhuna

*ruwan24@gmail.com

## Abstract

මුල්කාලයේ ආගමික අර්ථයෙන් භාවිත වුවද පසුකාලීනව සාහිත්‍ය කලා නිර්මාණවලින් ගොඩනැගෙන අර්ථමය කණිකා හා දාර්ශනික ඉංගිත හා ප්‍රකාශන පඨනයෙහිලා භාවිත විය. එය ආගමික පරිසරයෙන් වියුක්තව සාකච්ඡා කිරීමේ මූලික සංකල්පය පිළිබඳ හැරී ලෙවින් (Harry Levin) අදහසක් පළ කළද සාහිත්‍ය කලා කියවීමේදී එපිෆනි යන්න කියවීම් ක්‍රමයක් ලෙස භාවිත කරන ලද්දේ ජේම්ස් ජොයිස් (James Joyce -1898ඪ1902* විසිනි. ඒ අනුව මුල්කාලයේ ආගමික පරිසරයේ යෙදුණු මෙම එපිෆනි යන වචනය පසුකාලීනව සාහිත්‍ය කියවීම සඳහා භාවිත කරන ලදි. එසේම ඔවුහු මෙම එපිෆනි යන වචනය ප්ලේටෝගේ හා ඇරිස්ටෝටල්ගේ දාර්ශනික අදහස් ඇසුරෙන් බිහි වන්නට ඇතැයි ද අදහස් පළ කරති (Bowen, 1981:103,104).

ජේම්ස් ජොයිස් හා හැරී ලැවින් සහ වෙනත් නිර්වචන ආශ්‍රයෙන් එපිෆනි යන්න අර්ථ දක්වා ඇත්තේ කිසියම් සිදුවීමක් හෝ අද්දැකීමක් පිළිබඳ එකවර වටහා ගැනීමක්, ක්ෂණික අන්තර්දෘෂ්ටියක්, ක්ෂණික පහළවීමක් යනුවෙනි (sudden realization, manifestation, insight, Enlightenment). ඒ අනුව එපිෆනි යනු එකවර ඇතිවන බුද්ධිමය ප්‍රභාවක් හා සමාන දෙයකි. ආකිමිඩීස් දිය නාමින් සිටියදී 'යුරේකා' (මම එය සොයාගත්තා) යැයි කෑගසමින් දිව ගිය සිදුවීම, ඇයිසැක් නිව්ටන් එකවර ඇපල් ගෙඩියක් හිස මත වැටීමෙන් ගුරුත්වාකර්ෂණය පිළිබඳ යම් සංජානනයක් ලැබූ සිදුවීම ඉතා ප්‍රසිද්ධ සංසිද්ධිය. මේ සිදුවීම් දෙකෙහිම දක්නට ලැබෙන්නේ එකවර ඇති වූ බුද්ධිමය ප්‍රභාවක ප්‍රහර්ෂයයි. එලෙස අපව වෙනස් කරවන සුලු තියුණු ක්ෂණික බුද්ධිමය ප්‍රභාවයන් හා අන්තර්දෘෂ්ටි පෞද්ගලික අද්දැකීම් ආශ්‍රයෙන් සැමටම පවතින්නකි. ඇතැම්විට නරකක් අයපහතක් පිළිබඳවද එකවර අලෝකයක් අප තුළට පැමිණිය හැකිය. එය හොඳක් පිළිබඳ තියුණු අන්තර්දෘෂ්ටියක් අප තුළ කරන වෙනසට සාපේක්ෂව නරකකට වුව අප තුළ වෙනසක් ඇති කිරීමේ හැකියාවක් ඇත.

එහෙත් මෙහිදී එපිෆනි යන්නෙන් සාකච්ඡා කරන්නේ එකවර දර්ශනය වන, මිනිසා වෙනස් කිරීමේ ශක්‍යතාවෙන් හෙබි බුද්ධිමය අන්තර්දෘෂ්ටි පිළිබඳවයි. එලෙස යම් තියුණු විදර්ශනාත්මක ආලෝකයක් අප වෙනස් කිරීමට සමත් වූ විට නොයෙක් පුද්ගලයෝ විවිධාකාර අයුරින් එය ප්‍රකාශයට පත් කරති. ඇතැම් විට යමෙක් එය කෑගසා කියත්. තවකෙක් එය ලෝකය වෙනස් කරන න්‍යායක් ගොඩනගා ගැනීමට සංඥාවක් ලෙස සලකත්. එසේම තවකෙක් එය කවියකින්, කෙටි කතාවකින්, නවකතාවකින් හෝ සිනමා පටයකින් යන සාහිත්‍ය කලා නිර්මාණාදියෙන් ඉදිරිපත් කරත්. ඒ සියලු ප්‍රකාශනයන්ගෙන් ඉදිරිපත් වන්නේ අදාළ පුද්ගලයාගේ වෙනසට හේතු වූ ක්ෂණික අන්තර්දෘෂ්ටියේ ප්‍රකාශනයයි. සත්‍ය අවබෝධය වනාහිද බොහෝ කාලයන් මුළුල්ලේ ප්‍රගුණ කළ යමක් එකවර දර්ශනය වීමක්ය. එයද එපිෆනි යන්නෙහි එක් පැතකඩකි. බුදුරජාණන් වහන්සේ විසින් 'අනේකජාති සංසාරං' (විමලකිත්ති හිමි සහ ජනානන්ද හිමි, 2006ඃ 62,24) වැනි උදාන දේශනා කරන ලද්දේ එවැනි

ක්ෂණිකව දර්ශනය වූ බුද්ධිමය ප්‍රභාවක ප්‍රහර්ෂයෙනි. බුද්දක නිකායේ හමුවන උදාන හා ථේර, ථේරී ගාථා යන කෘතිවල සෞන්දර්යාත්මක හා ආගමික අගයෙන් යුත් කෙටි ගාථා ධර්ම හමු වේ. එම ගාථා ධර්මවල සංක්ෂිප්ත කර ඇත්තේ සත්‍ය අවබෝධයෙන් ලත් ප්‍රහර්ෂය භික්ෂු-භික්ෂුණීන් වහන්සේ ගාථාවක් ලෙස දේශනා කළ විධියයි. එයද එපිෆනි නොහොත් ක්ෂණික සත්‍ය දර්ශනය වීමේ (අන්තර්දෘෂ්ටියේ) ප්‍රතිඵලයකි. ඒ අනුව නූතන සිංහල කෙටිකවියේ පාඨකයා වෙනස් කිරීමට ශක්‍යතා ඇති ක්ෂණික අන්තර්දෘෂ්ටිමය ගුණාංග දක්නට ලැබෙන'යුරු මෙහිදී දීර්ඝව විමර්ශනය කෙරේ.

## 5.3. ක්ෂණික අන්තර්දෘෂ්ටි සංකල්පයේ ආංගික ලක්ෂණ හා නූතන සිංහල කෙටි කවිය

විසිවන සියවසට පෙර රෝමාන්තික කවියේදී එපිෆනි සංකල්පය මිනිසා හා සොබාදහම පිළිබඳ උත්තර, පාරිශුද්ධ, සදාතනික හැඟීම් හා වටිනාකම් දැනවීම සඳහා භාවිත වූ බව ඇමරිකානු දර්ශනික චාල්ස් ටේලර් පවසයි. ඔහු එය පැවැත්මේ ක්ෂණික අන්තර්දෘෂ්ටිය (epiphanies of being) යන නමින් හඳුන්වා ඇත (අමරකීර්ති, 2016: 196). එහෙත් විසිවන සියවසෙන් පසුව බිහිවන නූතනවාදී කවියෙහි එපිෆනි සංකල්පය වෙනස් අර්ථයකින් භාවිත විය. එනම් ස්වාභාවික වස්තු පිළිබඳ රෝමාන්තිකවාදී අදහස්වලින් වියුක්තව කිසියම් සංසිද්ධියක්, ප්‍රවාදයක් හෝ ස්වභාව දහමේ සිදුවීමක් ඇසුරෙන් පාඨකයාගේ අභ්‍යන්තරයට ක්ෂණික අන්තර්දෘෂ්ටිමය ආලෝකයක් දැනවීමයි.

නූතනවාදී කවියෙහි භාවිත එපිෆනි සංකල්පයෙහි ස්වභාවය ක්ෂණික අන්තර්දෘෂ්ටියක් හෙවත් ක්ෂණිකව යම් ප්‍රඥමය අලෝකයක් දර්ශනය වීමක්ය; සාහිත්‍ය නිර්මාණයක ප්‍රඥ-චමත්කාරයක් සහිත සෞන්දර්ය කාර්යයක් පිළිබඳ සංඥාවක් දැනවීමය. එපිෆනි (Epiphany) සංකල්පීය වචනය ක්ෂණික දර්ශනය, ක්ෂණික බුද්ධිමය ප්‍රභාව හා ක්ෂණික අන්තර්දෘෂ්ටිය යනුවෙන් සිංහලට පරිවර්තනය කළ හැකිය. මෙම සංකල්පය සාහිත්‍ය කියවීම් ක්‍රමයක් ලෙස භාවිත කිරීමේදී එහි ඇති ආංගික ලක්ෂණ පිළිබඳ අවබෝධය අත්‍යවශ්‍යය. අන්තර්දෘෂ්ටිය මගින් තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය වන ලෙස කලාව හා සාහිත්‍යය භාවිත කරන්නේ කෙසේද යන්න කියාදෙයි (අමරකීර්ති, 2010: 67). එහිදී කිසියම් සාහිත්‍ය කලා ශානරයකින් ප්‍රකාශිත අන්තර්දෘෂ්ටියෙන් සැපයෙන ක්ෂණික බුද්ධිමය ප්‍රභාවෙන් රසිකයාට තර්ක බුද්ධියේ හා සමාජ සම්මත දෘෂ්ටිවාදවල සීමා ඉක්මවා සිතීමේ ක්ෂණික අවබෝධයක් සැපයේ. *Therigatha* (Poems of the First Buddhist Women) කෘතියේ එපිෆනි සංකල්පය පිළිබඳ ඉතා විශිෂ්ට පැහැදිලි කිරීමක යෙදෙන මහාචාර්ය චාල්ස් හැලිසි ක්ෂණික අන්තර්දෘෂ්ටියේ ආලෝකය මිනිසාට ලෝකය පිළිබඳ නිදහසේ සිතීමට ඉඩ ලබාදෙන බව පවසයි (Hallisey, 2015: ix).

මිනිසා උපතේ සිට දැනුවත්ව හෝ නොදැනුවත්ව විවිධ හෙජොමනි සංකල්ප හා නොයෙක් දෘෂ්ටිවාද පිහිටා හා ව්‍යුහගතව සමාජය දෙස බැලීමට පුරුදු වේ. එපිෆනියෙන් සිදුවන සත්‍ය ක්ෂණිකව දර්ශනය වීම හේතුවෙන් එලෙස ගොඩනගා ගත් පාරභෞතික හා ආවිර්ණ කල්පිත ආකල්ප විනිවිද යෑමේ ස්වාධීනතාවක් ගොඩනැගේ. එය කිසියම් සිදුවීමකින් හෝ සාහිත්‍ය කලා නිර්මාණයක් රසවිඳීමෙන් ගොඩනැගෙන විදර්ශනාත්මක අවබෝධයකි. යථාර්ථය, ලෝක සත්‍ය හා මනුෂ්‍යත්වය පිළිබඳ මානසිකව ගොඩනැගෙන එම විදර්ශනාත්මක ආලෝකය සාහිත්‍ය ඇසුරෙන් සොයා බැලීම ක්ෂණික අන්තර්දෘෂ්ටිය (Epiphany) නමැති සාහිත්‍ය න්‍යාය මගින් සිදු කෙරෙයි (සිරිසුධම්ම හිමි, 2019: 356).

එනම් අනුකරණවාදී සාහිත්යික, සංස්කෘතික, දේශපාලනික හා ආගමික ආධිපත්‍යයෙන් මිදී ප්‍රඥ-චමත්කාරයක් සහිත අන්තර් දෘෂ්ටියේ ආලෝක කණිකාවක් පාඨක අබිමුවෙහි තැබීම එපිෆනියෙන් සිදු වේ. එය සාහිත්‍ය නිර්මාණයක ඇතුළත් වන්නේ එකවර ඇස නොගැටෙන ලෙසින්ය. දක්ෂ පාඨකයා එවැනි අප්‍රකාශිත තැන් මනාව දකියි. පාඨකයා සත්‍ය කරා රැගෙන යන එකී අලෝක ධාරා හෙවත් අන්තර්දෘෂ්ටි මනාව හඳුනාගනී. සාහිත්‍යකරුවා ස්වකීය සමාජයට දනවන අන්තර්දෘෂ්ටි කවියේ මතුපිට සෝෂාකාරීබවට ආලෝලනය වන හදිසිකාර පාඨකයාට නොපෙනේ. සාහිත්‍ය නිර්මාණයෙන් ප්‍රකාශිත ක්ෂණික අන්තර්දෘෂ්ටියේ සත්‍යය දර්ශනය වීමට පාඨකයාද ඒ සඳහා පුරුදු පුහුණු විය යුතුය. එවැනි ක්ෂණික අන්තර්දෘෂ්ටියක අද්දැකීමක් පාඨකයාට හැඳුනාගැනීමට පහසුවන සේ එපිෆනියේ ලක්ෂණ කිහිපයක් පහත වෙන් වෙන්ව දක්වා ඇත. ඒවා උදාහරණ ආශ්‍රයෙන් පසුව වෙන් වෙන්ව සාකච්ඡා කෙරේ.

- ක්ෂණිකව දර්ශනය වීම
- ඇතුළාන්තයට කතා කිරීම සහ විනිවිද යාම
- අනිර්වචනීය හෝ අවාච්‍ය බුද්ධිමය අලෝකයක් මනසෙහි සැරිසැරීම
- සාම්ප්‍රදයික මතවලට ඉහළින් සිතීමට ඉඩ ලබාදීම
- තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය
- ලෝකය දෙස ස්වාධීනව මෙන්ම විදර්ශනාත්මකව දැකීමට හැකිවීම
- සම්මත ආචාරධාර්මික සිරිත් විරිත්වලට සීමා නොවීම හා රෙගුලාසි ගත වැරදි දෘෂ්ටිවාද ඉවත් කිරීම
- හෙජමොනික (hegemony) සංකල්ප විනිවිද යමින් අධිපති මතවාද ප්‍රශ්න කිරීම
- එපිෆනිය එකවර ඇස නොගැටීම හා මතුපිට සාලංකාරික බවින් මිදීම
- දෛනිකත්වය ඇසුරෙන් වෙනස් ගැඹුරු අර්ථයක් මුණගැස්වීම
- කරණීය තර්කණයෙන් වියුක්තව ලෝකය දෙස දැකීමට ඉගැන්වීම
- කාලය, අවකාශ හා ක්‍රියාවලිය පිළිබඳ සංකථන පඨනය
- චිත්තරූප හා වචනවල අර්ථජනනීයතා එකිනෙකට සමීපව තැබීම

- අන්තර්දෘෂ්ටියේ ආලෝකයෙන් විවිධ අර්ථ ව්‍යුහ සංරචනය (අමරකීර්ති, 2010: 67-70), (Taylor, 2008: 460), (සිරිසුධම්ම හිමි, 2019: 356)

### 5.3.1.ක්ෂණිකව දර්ශනය වීම

ක්ෂණිකව දර්ශනය වීම හෙවත් දැනවීම එපිෆනියේ ස්වභාවයයි. සක්‍රීය හා උද්‍යෝගිමත් පාඨකයා කවිය සමග ගනුදෙනු කිරීමේදී එපිෆනි ක්‍රියාවලිය එකවර පාඨකයා වෙත සම්මුඛ වීම ස්වභාවයෙන්ම සිදු වන්නකි. කවියෙන් මතුවන බුද්ධිමය ප්‍රභාව පාඨක මනසේ සැරිසරන්නේ එකවර ඇසිපිය හෙළන ක්ෂණයකිනි. මෙහිදී 'එකවර දර්ශනය වීම' යන්න වරදවා වටහා නොගත යුතුය. මන්ද එපිෆනිය යන්න එකවර දර්ශනය වන්නේ පාඨකයාගේ පූර්ණ සවිඤ්ඤාණිකත්වය මතයි. පහත සඳහන් කෙටි කවිය ඇසුරෙන් එය තවදුරත් වටහාගත හැකිය.

> "අලුත ගොඩබෑ
> මාළු අහිනෙහි
> වැඩිපුර ම උඩ පනින මාළුවා
> ඔහු
> මුහුදට ම බාර දෙයි" (රණවීර හා වීරසිංහ, 2014: 195)

මෙම කවියේ එපිෆනිය එකවර දර්ශනය වීමට නම් අදාළ පාඨකයා තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය කරන, සම්මත සමාජ, සංස්කෘතික විඤ්ඤාණයට ඉහළින් සිතන පුද්ගලයෙකු විය යුතුය. මාළු වෙළෙන්දට සහ මස් වෙළෙන්දට සංවේදී, ළතෙත් හදවතක් නැති බව සමාජයෙහි සම්මත ආකල්පයයි. 'මාළුකාරයා', 'මස්කඩකාරයා' යැයි මිනිසුන් ඔවුන්ව හඳුන්වන්නේද කිසියම් අපහාසාත්මක දෘෂ්ටියකින් හා අධිකාරි බලයෙන් පහළ මට්ටමක තබමිනි. ඉහත කවිය මෙකී සම්මතයන්ට ඉහළින් සිතීමට අවශ්‍ය අන්තර්දෘෂ්ටිය පාඨකයාට ලබාදෙයි. එය එකවර දර්ශනය වී කියවන්නා වෙනස් කිරීමට සමත් අන්තර්දෘෂ්ටියක් ලෙස භාරගැනීමට පාඨකයාගේ චින්තන ක්‍රියාවලියේද යමක් තිබිය යුතු බව මෙමගින් පැහැදිලි වේ. මෙම කවිය සමාජයෙහි පවතින වැරදි දෘෂ්ටීන්ගෙන් නිදහස්ව එකිනෙකාට ගෞරව කිරීමට කියාදෙයි. ඒ සඳහා අවශ්‍ය විදර්ශනාත්මක ආලෝකය කවියා ලබා දෙන්නේ 'වැඩිපුරම උඩ පනින මාළුවා ඔහු මුහුදටම භාරදෙන බව' පැවසීමෙනි. එම යෙදුම සාම්ප්‍රදායිකව හා අධිපති මානසිකත්වයෙන් ගොඩ නැගුණු මනෝමූලික දෘෂ්ටිවාද බිඳ හෙලීමකි. රසිකයාට යථාර්ථය දැකගැනීමට මග එම අතුල් පහරෙන් කියාදෙයි. කවියක පවතින මෙවැනි සත්‍යයේ දර්ශනයන් අන්තර්දෘෂ්ටිය යනුවෙන් හැඳින්විය හැකිය. කෙටි කවිය වැනි කුඩා සාහිත්‍ය උපශානරවල අන්තර්දෘෂ්ටිය වැනි විශේෂතා අන්තර්ගත වීම එහි සෞන්දර්යය ශක්තිමත් වීමට හා ප්‍රඥාමය චමත්කාරයන්ගෙන් තීව්‍ර වීමට හේතුවකි.

### 5.3.2. ඇතුළාන්තයට කතා කිරීම සහ විනිවිද යාම

එපිෆනියකින් හෙවත් ක්ෂණික අන්තර්දෘෂ්ටියකින් සිදුවන ප්‍රධාන කාරණාවක් වන්නේ පාඨකාභ්‍යන්තරයට අමන්ත්‍රණය කිරීමයි. මිනිසා විසින් ගොඩනගාගෙන සිටිනු ලබන විවිධ සම්මත සීමා අන්තර්දෘෂ්ටිය මගින් අතික්‍රමණය කෙරෙයි. පාඨක අභ්‍යන්තරයට ක්ෂණික අන්තර්දෘෂ්ටියක් ආමන්ත්‍රණය කිරීමට සමත් වන්නේ කවියේ සමස්ත අංග කෙරෙහි පාඨකයා අන්තර්ගත වූ කල්හිය. අන්තරාවතීර්ණ වීම යනු විනිවිද යාමකි.

'විනිවිද යාම' යන පදයෙහි අර්ථය යමක් ඇතුළට අවතීර්ණ වීම යන්නයි. එනම් බාහිරින් හෝ මතුපිටින් බැලීම නොව එහි ඇතුළාන්තය නිරාකරණය කරගැනීමයි. යම් ගැටලුවක් හාත්පස විසඳා ගැනීමට ඒ ගැටලුව හා ඒකාත්මික විය යුතුය. ඒ ගැටලුව තුළම දිය විය යුතුය. එම අදහස වඩාත් නිවැරදිව එක් වචනයකින් පැවසිය හැක්කේ 'විනිවිද යාම' යන පදය මගින් බව මණ්ඩාවල පඤ්ඤවංස හිමියෝ පවසති (පඤ්ඤාවංස හිමි, 2015: 32,33). කිසියම් දෙයක් පිළිබඳ සැබෑ අවබෝධයක් ලැබීමට ඒ හා සමග එකතු වීම හෙවත් විනිවිද යා යුතුය. සාහිත්‍ය පඨිතයක ඇතුළාන්තය නිරවුල් කරගැනීමට සියලු අංශු කෙරෙහි විනිවිද යා යුතුය. එලෙස කවියක් විනිවිද යන අවස්ථාවේ කවියේ අර්ථ ව්‍යූහ ලිහා බැලීමෙන් ප්‍රකාශ වන ක්ෂණික අන්තර්දෘෂ්ටිමය කණිකා පාඨකයාගේ ඇතුළාන්තයට කතාකරයි; ඔහුගේ ඇතුළාන්තය සමඟ ගනුදෙනු කරයි; ඔහුව වෙනස් කිරීමට සමත් වෙයි. පහත සඳහන් කෙටි කවිය ඒ සඳහා එක් උදාහරණයක් පමණි.

> "වැඩ ඇරී
> වැඩට යති
> ගැහැනු" (අතුකෝරල, 2008: 15)

බොහෝ විවාහ සංස්ථාවල ස්ත්‍රීන්ට පොදු වූ ජීවන චක්‍රය මෙම කවියේ වචන 5න් අර්ථවත් කෙරේ. පාඨක මනසෙහි ස්ත්‍රී සමාජභාවය පිළිබඳ සානුකම්පිත දෘෂ්ටියක් ඇති කරලීමට මෙම කවිය සමත්ය. පවුල් සංස්ථාව ඇතුළත ස්ත්‍රියගේ අපරිමිත කාර්යභාරය අගය කිරීම බොහෝ සැමියන්ට අමතක වන කාරණයකි. ගෙදර දෙර වැඩ හා දූදරුවන් බලාගැනීම ස්ත්‍රියට උරුම අනන්‍ය කාර්යයන් ලෙස සංස්කෘතිකගත වී ඇති අතර එය නිතර මිනිසා, සංස්කෘතිය හා සමාජ මගින් ප්‍රතිනිෂ්පාදනය වන දෘෂ්ටිවාදයකි. එකී සංස්කෘතික සම්මත හා ගෙදර වැඩ ස්ත්‍රියට පැවරීමේ මානසිකත්වයෙන් මිදීමට මෙම කවියෙන් ලැබෙන අන්තර්දෘෂ්ටිය ඉතා වැදගත්ය. මෙම කවිය තවදුරටත් පාඨකයාව ප්‍රබල අර්ථයක් කරා රැගෙන යයි. මෙම කවියේ සඳහන් වන්නේ වැඩ ඇරී වැඩට යන ස්ත්‍රියක පිළිබඳය. රැකියාවක් කළ පමණින් ස්ත්‍රියට උරුම වැඩවලින් ඇයට නිදහස් වීමට නොහැකි තරමට සමාජයේ ඇය උපකරණීය තත්ත්වයට පත්ව ඇත. ඇයට රැකියාවට අමතරව නිවසට ගිය පසුද නැවත වැඩ කිරීමට සිදු වේ. එබැවින් ස්ත්‍රීන් ජීවිත කාලය පුරාම සිදු කරන්නේ වැඩ ඇරී වැඩට යෑමේ ක්‍රියාවලියයි. මෙම කවිය වැඩ ඇරී ගෙදර ගොස් කිසිවක් නොකර

නිදහසේ සිටින ඇතැම් පිරිමින්ට නැවත තමන් ගැන් සිතීමට උගන්වන තියුණු අන්තර්දෘෂ්ටියක් සහිත කවියකි. තවද මෙම කවිය සංස්කෘතික මානයෙන්ද, ස්ත්‍රී දෘෂ්ටියෙන්ද, පිරිමි සමාජභාවයෙන්ද, සහානුකම්පිතවද, විසංයෝජනීයවද කියවිය හැකි බහුවිධ අර්ථ ඇතුළත් කෙටි කවියකි. කවියේ මෙම සියලු මානයන් මගින් ප්‍රකාශිත විවිධ ක්ෂණික අන්තර්දෘෂ්ටි සොයාගත හැක්කේ පාඨකයාට කවියේ සමස්තය විනිවිද යාමෙනි. මෙවැනි කවි මගින් ලබාදෙන ක්ෂණික අන්තර්දෘෂ්ටි පාඨකයාගේ චිත්තාභ්‍යන්තරයට ආමන්ත්‍රණය කිරීමට සමත් වන අයුරු ඉහත උදාහරණයෙන් පැහැදිලි වේ.

### 5.3.3.අනිර්වචනීය හෝ අවාච්‍ය බුද්ධිමය අලෝකයක් මනසෙහි සැරිසැරීම

කවියක් කියවීමේදී පාඨකයා වෙත සැපයෙන ක්ෂණික අන්තර්දෘෂ්ටිය කිසියම් අවාච්‍ය බුද්ධිමය උත්තේජනයකි. ඇතැම් විට එම හැඟීම භාෂාව පෙරළීමට අපොහොසත් හැඟීමක් වන අතර එය පුද්ගලබද්ධ කාරණාවක් වේ. කවියකින් සැපයෙන අන්තර්දෘෂ්ටිමය හැඟීමේ කිසියම් අවාච්‍යමය හා අනිර්වචනීය ස්වභාවයක් ගැබ්ව ඇත. සතුට, භය, වේදනාව ආදි හැඟීම් භාෂාවට නැගීම අපොහොසත් බැවින් ඒ ලක්ෂණය අන්තර්දෘෂ්ටියේ ආංගික ලක්ෂණයක් ලෙස හැඳින්විය හැකිය. කොවිඩ් වසංගත සමයක හෙට පිළිබඳ අවිනිශ්චිත හැඟීමකින් ජීවත් වන පාඨකයා, පහත කවිය කිවීමෙන් ලත් ක්ෂණික අන්තර්දෘෂ්ටියේ සමස්තය වචනයට හසු කර ගැනීමට පහසු නැත. එය අන්තර්දෘෂ්ටියේ ස්වභාවයයි.

"අවමඟුල් පෙරහරේ
යන අතරතුර
ඔහු සකස් කරයි පා ඇඟිල්ලෙන්
සොහොන් බිම පඩිපෙළක
ගැලවුණු තැන්" (රණවීර හා වීරසිංහ, 2014: 28)

මෙම කෙටි කවියේ ඇතුළත් 'සොහොන් බිමක පඩිපෙළ' නමැති චිත්තරූපයෙන් ප්‍රකාශ වන්නේ තියුණු අන්තර්දෘෂ්ටියකි. ඉන් ජනිත වන හැඟීම අවාච්‍ය බුද්ධිමය ආලෝකයකි. ජීවිතය නමැති පඩිපෙළෙහි තැන් තැන් ගැලවී ගියද එය සංස්කරණය කිරීමට හැකි දෙයක් නොවේ. සමීප පුද්ගලයෙකුගේ මළගමක යන සැමවිටම මරණයේ ඇති අම්හිරි වේදනාව ප්‍රත්‍යක්ෂයෙන් අප සැම දන්නා කාරණාවකි. එහෙත් කොවිඩ් වැනි වසංගත සමයක මනුෂ්‍ය මරණ ගණන එදිනෙදා ඇස ගැටෙමින් සාමාන්‍යකරණයට ලක්ව ඇත. එවැනි අද්දැකීම් නිරන්තරයෙන් හමුවන කාලයක මෙවැනි කවිවලින් ලබා දෙන අන්තර්දෘෂ්ටි ජීවිතය හා මරණය පිළිබඳ යථාර්ථය පාඨකයාට සමීප කරවීමට සමත්ය.

### 5.3.4. සාම්ප්‍රදායික මතවලට ඉහළින් සිතීමට ඉඩ ලබාදීම

කිසියම් සාම්ප්‍රදායික මත මගින් කුමන හෝ පාර්ශ්වයකට අගතියක් වේ නම් එම මතවාද ප්‍රශ්න කිරීම බුද්ධිමත් පාඨකයාගේ ලක්ෂණයයි. ඇතැම් කෙටි කවිවලින් සපයන එපිෆනි එවැනි සාම්ප්‍රදායික මතවලට ඉහළින් සිතීමට අවශ්‍ය ක්ෂණික අන්තර්දෘෂ්ටි ලබාදීමට සමත්ය. පහත සඳහන් කෙටි කවිය ඒ සඳහා නිදර්ශන සපයයි.

"පිරිමි වීදුරු තුළ
පිරවෙයි
ගැහැනු වයින්" (ඇම්බ්‍රෝස්, 2018: 24)

ස්ත්‍රියගේ සියලු කරණීය පැවරුම්, ස්වභාවය, අගපසඟ, ඇඳුම් පැලඳුම් ආදි සියලු සංකල්ප සංස්කෘතික විඤ්ඤාණයට එකතු වී ඇත්තේ විවිධ ස්වරූපයෙනි. ඒ සඳහා අධිපතිවාදී පුරුෂ දෘෂ්ටියද බලපා ඇත. එබැවින් බොහෝ පිරිමි ආකෘතිවල ස්ත්‍රියට සිරවීමට සිදු වී තිබේ. මෙම කවියේ 'පිරිමි වීදුරු' හා 'ස්ත්‍රිය නමැති වයින් පිරවීම' තියුණු රූපක දෙකකි. එහි අන්තර්ගත අර්ථ ව්‍යූහ තියුණු අන්තර්දෘෂ්ටි පාඨකයා වෙත සපයන අතර සාම්ප්‍රදායිකව ස්ත්‍රිය පිළිබඳ නිගමනවලට එළඹ සිටින පිරිමි හා ගැහැනු දෙපාර්ශ්වයටම එම දෘෂ්ටිවාද විනිවිද යාමට මෙම කවිය කියාදෙයි.

### 5.3.5.තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය කරයි

ක්ෂණික අන්තර්දෘෂ්ටිය සැමවිටම තර්ක බුද්ධියේ සීමා ඉක්මවා සිතීමට අවශ්‍ය මාන වෙත පාඨකයාව රැගෙන යයි. සමාජය විසින් ගොඩගනා ගෙන සිටින විවිධ තර්ක හා ප්‍රවාද කෙතරම් විශ්වාසයෙන් යුතුව සමාජ සම්මතයක් ලෙස ස්ථාවර වී තිබුණද එය සාවද්‍ය වන අවස්ථා තිබේදැයි සබුද්ධිමත් පාඨකයා සොයා බලයි. එපිෆනිය යනු ඒ සඳහා බුද්ධිය අවදි කරන ආලෝක විධියකි. සමාජ, සංස්කෘතික හා ආගමික ව්‍යූහ මගින් මිනිසා වෙත පවරන ලද තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය කරන අන්තර්දෘෂ්ටියක් පහත සඳහන් ආරියවංශ රණවීරගේ කවියෙන් දැකගත හැකිය.

"**අම්මා**
අම්මා දකින්න ආසයි හීනෙන් වත්
තාත්තමයි එන්නේ මහ උදාරමින්
මුල්ලේ ද ඔබ ළිප ගිනි මැද ඔහේදිත්
හීනයත් අත්පත් කරගෙන ද තාත්තා......?" (රණවීර, 2017: 28)

සාමාන්‍ය සමාජයේ පවතින පුරුෂවාදී අධිපති මතවාද පවුල් සංස්ථාවේ මව්පිය ධුරාවලීයේද දැකගත හැකිය. 'අම්මා' හා 'තාත්තා' යන ප්‍රතිපක්ෂ යුගලයේ පාරභෞතික බලය සහිත පදය 'තාත්තා' යන පදයයි. පාඨකයාට මෙම තර්කය ඉතා සියුම්ව විග්‍රහ කිරීමට අවශ්‍ය

තියුණු අන්තර්දෘෂ්ටියක් ඉහත කවියෙන් සැපයේ. මෙම කවියේ සඳහන් 'හීනෙන් වත් අම්මා දකින්නට නොහැකි වීමත්', 'තාත්තා මහ උදාරමින් පෙනීමත්', 'අම්මා ළිප ගිනි මැද මුල්ලට වී සිටීමත්', 'තාත්තා හීනය අත්පත් කරගෙන සිටීමත් යනු වෙන වෙනම කියවිය හැකි අර්ථ ව්‍යූහ සහිත පද හතරකි. පුරුෂමූලික සමාජ රටාවක ජීවත් වන ස්ත්‍රියකගේ ඉරණම 'මුල්ලේ ද' යන වචනයෙන් මනාව පාඨකයාට ඒත්තු ගැන්වෙයි. තවද අම්මා හීනෙන් වත් දැකීමට අවශ්‍ය වුවත් හීනෙන් වුව තාත්තා පෙනීම මගින් සමාජ, සංස්කෘතික හා පුද්ගල විඥ්ඥාණයට අධිපති දෘෂ්ටිවාද කර ඇති බලපෑම වටහාගත හැකිය.

### 5.3.6.ලෝකය දෙස ස්වාධීනව මෙන්ම විදර්ශනාත්මකව දැකීමට හැකිවීම

ලෝක ස්වභාවය පිළිබඳ වඩාත් නිදහස්ව දැකීමට පුද්ගල මනස දියුණු කිරීම පහසු කාර්යයක් නොවේ. මිනිසාට ලෝකය දෘශ්‍යමාන වන්නේ ඔවුන්ගේ දෘෂ්ටියේ ස්වභාවය අනුවය. එවැනි පරිසරයක මිනිසා විසින් ගොඩනගා ගන්නා ආස්ථානවල පවතින ස්වාධීනතාවේ නිරවද්‍යතාව මැන ගැනීමට අන්තර්දෘෂ්ටි ඉවහල් වේ. මෙහිදී කෙටි කවිවල පවතින එම ගුණාංගය පහත කවියෙන් තවදුරටත් පැහැදිලි කරගත හැකිය.

"පුංචිම
කුහුඹුවාටත්
අඳුරු
සෙවණැල්ලක්" (නිවුන්හැල්ල, 2009: 20)

වසන්ත ප්‍රියංකර නිවුන්හැල්ලගේ ඉහත කවියෙන් ලබා දෙන ක්ෂණික අන්තර්දෘෂ්ටියේ විදර්ශනාත්මක ආලෝකය ඉතා ස්වාධීනව ලෝකය දෙස බැලීමට කියාදෙයි. අනෙකාට ගරු කිරීම හා අනෙකාගේ ස්වාධීනතාව ආරක්ෂා කිරීම මෙම කවියෙන් ලබාදෙන ප්‍රබල දාර්ශනික අන්තර්දෘෂ්ටියයි. මෙහි සෙවණැල්ල යනු බහුවිධ අර්ථ ජනනීය ශක්‍යතාවෙන් යුක්ත රූපකයකි. සමාජය විසින් පුද්ගලයාගේ ස්වභාවය හෝ වෙනත් සත්වයෙකුගේ ප්‍රමාණය මත සෙවණැල්ලේ වටිනාකම තීරණය කළද මෙම කෙටි කවිය සියලු පූර්ව නිශ්චිත නිගමන බැහැර කර සියලු සත්වයන්ගේ වටිනාකම සමාන බව පාඨකයාට කියාදෙයි.

### 5.3.7.සම්මත ආචාරධාර්මික සිරිත් විරිත්වලට සීමා නොවීම හා රෙගුලාසි ගත වැරදි දෘෂ්ටිවාද ඉවත් කිරීම

සම්මත ආචාරධාර්මික සිරිත් විරිත් එලෙසම පිළිගැනීමට සීමා නොවී ඒ සියලු රෙගුලාසිගත පිළිගැනීම් විචාරාත්මකව දැකීම හා ප්‍රශ්න කිරීමට පොහෝනා අන්තර්දෘෂ්ටි ඇතැම් කෙටි කවි මගින් පාඨකයා වෙත සපයා ඇත. පාඨකයාගේ විචාරාත්මක චින්තනය අවදි කරවන සුලු ක්ෂණික අන්තර්දෘෂ්ටි ඇතුළත් අගනා කෙටි කවි කිහිපයක් කුසල් ධනංජය කුරුවිටගේ 'අස්පර්ශනීයන් වෙත' කාව්‍ය කෘතියේ දැකගත හැකිය.

"හාම්පුතු ත්‍යාගශීලී බවත්
කසල ශෝධක
මංකොල්ලකාරයකු බවත්
කුණු බක්කියක් සිතයි" (කුරුවිට, 2020: 33)

සමාජය දෙස ආචාරධාර්මිකව බැලීමට අවශ්‍ය සම්මත හා නිර්මිත හුදෙක් දේවභාෂිතයක් හෝ වෙනස් කළ නොහැකි දෙයක් ලෙස නොසිතීමට අවශ්‍ය විචාරාත්මක දෘෂ්ටිය මෙම කවියෙන් පාඨකයාට ලබාදෙන අන්තර්දෘෂ්ටියයි. මෙහි 'කුණු බක්කිය' යන යෙදුම ක්ෂණික අන්තර්දෘෂ්ටියක් සපයන අර්ථ ව්‍යූහයකි. මිනිසා විසින් අදහනු ලබන හානිදායක විවිධ දෘෂ්ටිවාද 'කුණු බක්කිය' හා සමානය. කවියා පාඨකයාට ස්වකීය ඇතුළාන්තය දෙස නිරීක්ෂණයට ඉඩකඩ ලබා දෙන්නේ 'කුණු බක්කිය' නමැති අන්තර්දෘෂ්ටි ආලෝකයෙනි. ත්‍යාගශීලී හා ත්‍යාගශීලී නොවන පිරිස් අප වෙන් කර ඇත්තේ ධනවත් හා නිර්ධන ස්තරායනය යටතේය. එහෙත් ත්‍යාගශීලී යැයි සම්මත හාම්පුතුන් මංකොල්ලකරුවන් නොවන්නේද යන ප්‍රශ්නාර්ථයේ අන්තර්දෘෂ්ටිය මෙම කවිය විචාරාත්මකව කියවන පාඨකයාට අනවරතව සිහිකැඳවේ.

### 5.3.8. හෙජමොනික (hegemony) සංකල්ප විනිවිද යමින් අධිපති මතවාද ප්‍රශ්න කිරීම

හෙජමොනිය හෙවත් නායකාධිපත්‍යය ප්‍රශ්න කිරීම හා බලය සහිත සංකල්ප හා භාෂාත්මක අසමබර තැන් නිදහස්ව කියවීම එපිෆනියකින් පාඨකයාට ලැබෙන තවත් බුද්ධිමය ආලෝකයකි. හෙජමොනිය **(hegemony)** යන්න අන්තෝනියෝ ග්‍රැම්ස්චි විසින් විස්තර කරන ලද න්‍යායික සංකල්පයකි. හෙජමොනි යන වචනය එක් අයුරකින් ධනපති පන්තිය සෙසු පන්තිවල කීකරුබව ලබාගන්නා ක්‍රමෝපයක් ලෙස අර්ථ ගැන්විය හැකිය (දිසානායක, 2010: 197). සමාජයේ බලය හිමි පාර්ශ්වය විසින් තම බලය තහවුරු කරගැනීමටත් පවත්වාගෙන යාමටත් ජන විඥ්ඥාණය හැසිරවීමටත් විවිධ හෙජමොනි නිර්මාණය කරනු ලබයි. එය විවිධ ක්‍රම ඇසුරෙන් සමාජගත වේ. සිරිත් විරිත්, ආගමික විශ්වාස, සංස්කෘතිය, දේශපාලනය හා භාෂාව ආදි විවිධ අංශ මගින් නිර්මාණය වන හෙජමොනිය විසින් මිනිසා පාලනය කරනු ලබයි. එය මර්දනීය උපකරණ ලෙසින් හා දෘෂ්ටිවාදාත්මක උපකරණ වෙසින් මිනිසා වෙත පැමිණෙයි. එලෙස මිනිසා පාලනය වන අධිකාරි මත විනිවිද යන ක්ෂණික අන්තර්දෘෂ්ටි යම් යම් කෙටි කවිවල දැකගත හැකිය.

"හාම්පුතු රථය පදවන'තර
කියන වචනයක් පාසා
හිස වනයි
අර සෙල්ලම් බල්ලා" (කුරුවිට, 2020: 89)

හෙජමොනි සංකල්ප නොහොත් විවිධ අධිපති මතවාද ජන විඥ්ඥාණයට හුරුපුරුදු වූ කල්හි මිනිසාව එම මතවාද විසින් පාලනය කෙරෙන බව ඔවුන්ටම නොතේරෙයි. එවිට එම මතවාද පවත්වාගෙන යනු ලබන්නේ පාලනය කරන පිරිස විසින් නොව පීඩිත පන්තිය විසින්මය. එය අප නොදැනුවත්වම අප විසින් ප්‍රතිනිෂ්පාදනය කරනු ලබයි. ඉහත කෙටි කවියේ සඳහන් 'සෙල්ලම් බල්ලා' යනු උක්ත කියමන වඩාත් පැහැදිලි කරන සංකේතයයි. සෙල්ලම් බල්ලා යනු හාම්පුතුගේ කැමැත්ත-නොකැමැත්ත අනුව හැසිරීම තීරණය කරන ප්‍රාණය නිරුද්ධ සත්වයෙකි. විවිධ හෙජමොනි සංකල්ප මගින් පාලනය වන අප හුදෙක් ප්‍රාණය නිරුද්ධ සෙල්ලම් බල්ලන් නොවේද යන්න මෙම කවියෙන් සැපයෙන එක් ක්ෂණික අන්තර් දෘෂ්ටියකි.

### 5.3.9. එපිෆනිය එකවර ඇස නොගැටීම හා මතුපිට සාලංකාරික බවින් මිදීම

ඇතැම් කෙටි කවිවල දක්නට ලැබෙන අන්තර්දෘෂ්ටි එකවර ඇස නොගැටේ. කවියා එම අන්තර්දෘෂ්ටිය සපයන්නේ නිර්මාණයේ මතුපිට සාලංකාරික නිමගනවලට එකවර ඇස නොගැටෙන ලෙසිනි. ගැඹුරු කියවීමකින් විනිර්මුක්ත හදිසිකාර සහෘදයෙකුට කවියේ වාඩ්මය තලයේ දක්නට නොලැබෙන එහෙත් නිර්වාඩ්මය තලයේ පිහිටවන ලද අර්ථව්‍යූහ සංගෘහීත එකී අන්තර්දෘෂ්ටිමය එළි ග්‍රහණය කරගත නොහැකිය. ඒ සඳහා නිර්මාණයේ සංඥා හා බැඳි සන්දර්භගත ව්‍යූහ හා ඉන් පිටත ව්‍යූහ හඳුනා ගැනීමට පාඨකයාට සිදු වේ. තවද කවියේ නිර්වාඩ්මය සංඥා ඇති කරන ද්විතීයක අර්ථ සලකා බැලීමට පාඨකයා සංවේදී විය යුතුය. මෙම කරුණු රෝලන්ඩ් බාත් විසින් පෙන්වා දෙන ලද්දේ ව්‍යූහවාදී සංකල්පද ඉක්මවා යමිනි. එනම් කෘතියක් කතුවර දෘෂ්ටියෙන් (writerly) හා පාඨක දෘෂ්ටියෙන් (readerly) කියවීමට යෝජනා කිරීමයි (රණවීර, 2019: 244). එවිට නිර්මාණයේ මතුපිට එකවර නොපෙනෙන බොහෝ නිර්වාඩ්මය තල පාඨකයාට සොයාගනු හැකි වේ. පහත සඳහන් කවියේ අන්තර්දෘෂ්ටි කවියේ මතුපිය පෘෂ්ඨයේ එකවර දෘශ්‍යමාන නොවේ. පාඨකයාට එය වටහා ගැනීම පිණිස කවියේ නිර්වාඩ්මය තලවලට පිවිසීමට සිදු වේ.

> "පර්වතය මත විතරක් ද
> මේ තණපත මතත්
> හිරු එළිය" (රණවීර හා වීරසිංහ, 2014: 27)

මෙම කවියේ මතුපිට මහා ඝෝෂාකාරීව අර්ථ විවෘතතාවක් නොමැත. පාඨකයාට අර්ථය වටහාගැනීම පිණිස නිහඬ, නිශ්චල නිර්වාඩ්මය අර්ථ ව්‍යූහ ලිහා බැලීමට සිදු වේ. මෙම කවිය නාගාර්ජුනපාදයන්ගේ ශූන්‍යතා දර්ශනයේ අන්‍යෝන්‍ය ප්‍රතිබද්ධතාව (Interdependence relationship) සිහි කැඳවයි. එනම් ශූන්‍යතාව වනාහිම හුදෙක් යමකට තනිව පැවතිය නොහැකි බවයි. එහිදී හිරු, පර්වත, තණ පත් යනු හුදෙකලා වස්තුවක් නොවේ. ඒ සියල්ල අන්‍යෝන්‍ය වශයෙන් බැඳී පවතී. එම සත්‍ය වටහා ගැනීමට තමන්

සමීපයේ ඇති තණපත වුව ප්‍රමාණවත්ය. යමෙකුට තණපත හා අන්තරාවතීර්ණ වීමෙන් හිරුද, පර්වතයද එක සේ දැකිය හැකිය. එවිට එම වස්තූන් දෙකෙහි වෙනසක් ඔහුට නොපෙනේ. (එකම වස්තුවක් ලෙස පෙනීමෙන් අර්ථවත් වන්නේ ඕනෑම වස්තුවක සමාන පදාර්ථ අන්තර්ගත වී ඇති සත්‍ය වටහා ගැනීමයි.) එබැවින් ඇතුළු හදෙහි ආධ්‍යාත්මික සුව සොයන යෝගියාට තමන් සමීපයේ ඇති ඉතා කුඩා දෙයකින් මහා විශාල යථාර්ථයක් දැකිය හැකිය. මෙම කවියෙන් ප්‍රතීත වන්නේ පාඨක ආධ්‍යාත්මය හා සන්නිවේදනය වන ක්ෂණික අන්තර්දෘෂ්ටියකි. එය පාඨකයාගේ ඇතුළු හදෙහි විදර්ශනාත්මක ප්‍රහර්ෂ දනවන්නකි. මෙම කවියෙන් ජනිත වන එකී එපිෆනිය ඉහත අනුමාතෘකාවල සාකච්ඡා කළ කෙටි කවිවල අන්තර්දෘෂ්ටිවලට වඩා සපුරා වෙනස්ය. එබැවින් කෙටි කවියේ ප්‍රස්තුතය අනුව ඉන් ජනිත වන අන්තර්දෘෂ්ටිය විවිධ ස්වරූප ගන්නා බව පාඨකයා දත යුතුය.

### 5.3.10. දෛනිකත්වය ඇසුරෙන් වෙනස් ගැඹුරු අර්ථයක් මුණගැස්වීම

සාමාන්‍ය මනුෂ්‍ය ජීවිතයේ සිදුවන දෛනිකත්වයේ ප්‍රකාශන ඇසුරෙන් වෙනස් ගැඹුරු අරුත් නිෂ්පාදනය කවියේ එක් කාර්යභාරයකි (අමරකීර්ති, 2016: 217). එහිදී කවියාට දෛනිකත්වයට ඉහළින් අර්ථ නිෂ්පාදනය කිරීමද දෛනිකත්වය තුළින්ම අරුත් නිපදවීමද සිදු කළ හැකිය. එලෙස නිර්මාණයෙන් ප්‍රකාශිත දෛනිකත්වය විනිවිද යන අන්තර්දෘෂ්ටියක් පහත කෙටි කවියෙන් පාඨකයාට සැපයේ.

"නිදහසේ
ගෙට එන්න
ගෙට්ටුවේ එල්ලා
කන්තෝරුව" (කපුවත්ත, 2015: 42)

මාලන් බණ්ඩාර කපුවත්ත රචනා කළ **අඟුණ මල්** නමැති කෙටි කාව්‍ය සංග්‍රහයේ ඇතුළත් ඉහත කවියද ප්‍රබල අන්තර්දෘෂ්ටියක් සපයන කවියකි. රාජකාරි ජීවිතය හා පෞද්ගලික ජීවිතය පටලවාගත් පවුල් ජීවිත අද සමාජයේ කොතෙකුත් අපට හමුවේ. කන්තෝරුව ගේට්ටුවේ එල්ලා ගෙට පැමිණෙන ලෙස ආරාධනා කිරීමෙන් පාඨකයාට ලබාදෙන ප්‍රබල අන්තර්දෘෂ්ටිය කෙටි කවිය වචන අවම වූ පමණින් බැහැර කළ නොහැකි කාව්‍ය උපශානරයක් බව වටහා දීමට සමත්ය. මෙම කෙටි කවිය මගින් එදිනෙදා ජීවිතයේ හමුවන දෛනිකත්ව මගින් යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීම සිදු කෙරේ. එහිදී කවියා එදිනෙදා ජීවිතයේ යථාර්ථය පාඨකයා අභිමුව තබන්නේ අලුත් අද්දැකීමක ස්වරූපයෙනි. කන්තෝරුව ගේට්ටුවේ එල්ලීම යන කාව්‍යෝක්තියෙන් ගොඩනැගෙන තියුණු එළිය මිනිසා කෙතරම් කන්තෝරුවල එල්ලා සහ එල්ලී සිටින්නේද යන්න ප්‍රශ්න කෙරෙයි. පාඨකයාගේ අභ්‍යන්තරයේ ගොඩනැගෙන එවැනි ප්‍රශ්න කවියෙන් ගොඩනැගුණු අන්තර්දෘෂ්ටියේ ප්‍රතිඵලයයි.

### 5.3.11. කරණීය තර්කණයෙන් වියුක්තව ලෝකය දෙස දැකීමට ඉගැන්වීම

කෙටි කවිවලින් සැපයෙන ක්ෂණික අන්තර්දෘෂ්ටි තර්ක බුද්ධියේ සීමා අතික්‍රමණය කරන බව ඉහත මතෘකාවකදී සාකච්ඡා කෙරිණි. එලෙස තර්ක බුද්ධියේ සීමා ඉවතලන තවත් එක් දැක්මක් ලෙස කරණීය තර්කණයෙන් වියුක්තව ලෝකය දෙස බැලීම හැඳින්විය හැකිය. නූතන සමාජයේ ජීවත් වන මිනිසා විවිධ සම්මතයන්ගේ කරණීය භූමිකාවක එක් කොටස්කරුවෙකි. එහිදී කරණීය තර්කණය (instrumental reason) යනුවෙන් අදහස් වන්නේ උපකරණවාදී මානසිකත්වයයි. එම කරණීය භූමිකා සමාජ සම්මත ලෙස ජන විඥ්ඥාණයට ඇතුළු වී ඇත. උදාහණයක් ලෙස බිරිඳ පිළිබඳ මනුෂ්‍යත්වයෙන් නොව උපකරණවාදී මානසිකත්වයෙන් බැලීමට බොහෝ මිනිසුන් පුරුදු වී තිබේ (අමරකීර්ති, 2010: 67). ඊට හේතුව බිරිඳ වනාහි උදෑසන නැගිටීම, දරුවන් බලාගැනීම, කෑම පිළියෙල කිරීම, රෙදි සේදීම ආදි කරණීය භූමිකා ඇයට නියමිත කාර්යයන් ලෙස සම්මත වී ඇති බැවිනි. මෙවැනි කරණීය තර්කණ විචාරාත්මක දෘෂ්ටියෙන් දැකීමට පාඨකයා පොළඹවන එපිෆනි ඇතැම් කෙටි කවිවල දැකිය හැකිය.

"**නිදහස් අධ්‍යාපනය**
සාමා අමර
කෝ සල් මල් සුවඳ
පිපෙන්නට පෙර
උන් කඩාගෙන...
හෙට ඒවි යන්න
ගහත් කපා ගෙන
හිටපං ඇහැරිලා
සල්ගහ බදාගෙන" (ඥාණානන්ද හිමි, 2014: 29)

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් හා බැඳි කරණීය තර්කණයක් ලෙස නිදහස් අධ්‍යාපනය රැකගැනීම සමාජගත වී තිබේ. බොහෝ විශ්වවිද්‍යාල උද්ඝෝෂණවල දක්නට ලැබෙන සටන් පාඨයක් ලෙස නිදහස් අධ්‍යාපනය සුරැකීම දැකගත හැකිය. එහෙත් නිදහස් අධ්‍යාපනය සුරැකීම හුදෙක් විශ්වවිද්‍යාල ශිෂ්‍යයාගේ කරණීය භූමිකාවේ කොටසක් පමණක් නොවේ. එය ඉන් පරිබාහිර මිනිසුන්ගේද අපේක්ෂාවක් විය යුතුය. මීට අමතරව පාඨකයාට කරණීය තර්කණයෙන් වියුක්තව ලෝකය දෙස බැලීමට සියුම් එහෙත් තියුණු අන්තර්දෘෂ්ටියක් පහත සඳහන් කෙටි කවියෙන් සැපයේ.

"කන්දකට පුළුවන් නම්
දියවෙන්න
මුහුදකට බැරි ඇයි

ගිනිගන්න" (ෆර්නැන්ඩු, 2019: 70)

මෙම කවියේ නිර්වාඩිමය අර්ථ ව්‍යූහ කිහිපයක කරණීය තර්කණ කිහිපයක් ඉක්මවා ඇති අයුරු ඉතා සියුම් නිරීක්ෂණයෙන් වටහාගත හැකිය. ස්ත්‍රිය පිළිබඳ සම්මත විනිවිද කියවීම මුහුදක් තරම් 'දරා ගැනීම' යන සාමන්‍ය තර්කණය ඉක්මවා 'ගිනි ගැනීම' යන නවමු කාව්‍යෝක්තියෙන් අඟවා ඇත.

### 5.3.12. කාලය, අවකාශ හා ක්‍රියාවලිය පිළිබඳ සංකථන පථනය

කෙනෙත් යසුඩා The Japanese Haiku නම් කෘතියෙහි හයිකු කවියක පාදවල ඇතුළත් අවස්ථා තුනක සම්මුතියක් දකියි. එය හයිකු කවියෙහි අන්තර්ගතය හා හයිකු තාක්ෂණය වටහාගැනීමට පහසු න්‍යායාත්මක ලක්ෂණයකි. එය සියලු හයිකු කවිවල එක සේ දැකගත නොහැකි ගුණාංගයක් නොවුණත් කෙටි කාව්‍ය උපශානරවල ස්වභාවය වටහා ගැනීමට මෙම ත්‍රිවිධ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය වැදගත්ය. එසේම යම් යම් කෙටි කවිවලින් සැපයෙන අන්තර්දෘෂ්ටි වටහාගැනීමටද මෙම කාලය අවකාශය හා ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යාසය වැදගත්ය. කෙනෙත් යසුඩා පවසන හයිකු කවියේ මූලික පදර්ථ තුන පහත දැක්වේ (Yasuda, 1985: 41).

- අවකාශය පිළිබඳ ඥානනය (Sense of Place) - කොහේද (Where)
- ක්‍රියාව පිළිබඳ ඥානනය (Sense of Action) - කුමක්ද (What)
- කාලය පිළිබඳ ඥානනය (Sense of Time) - කවර වේලාවකද (When)

"'රෑ වුණා'
කියාගෙන
ගෙට ඇදෙමි
කපට බැව්
හන්දාම.

ඈ සිනහ මුව
තවම
හැන්දැව" (වෙඩිවර්ධන, 2020: 65)

මංජුල වෙඩිවර්ධන විසින් රචිත මෙම කෙටි කවියේ 'රෑ වීම හා හැන්දැව' යන ස්ථානවල ඇත්තේ 'කාලය' යන පදාර්ථයයි. 'ගෙට ඇතුළු වීම' යනු 'අවකාශයයි'. 'ඈ සිනා මුව' තවම පැවතීමත් 'කපටි භාවයත්' ක්‍රියා යන පදාර්ථයයි. යසූඩා පවසන ත්‍රිවිධ ක්‍රියාවලිය මෙම කවියේ බොහෝ නිර්වාඩිමය අර්ථ ව්‍යූහ වටහාගැනීමට අත්වැලකි. මුළු දවසම තනි ගෙදරක

ජීවත් වන බිරිඳකගේ චිත්තාභ්‍යන්තරයේ හැසිරීමත් බිරිඳගෙන් වෙන්ව රැකියාවට පිටව ගොස් නැවත පැමිණෙන ස්වාමියාගේ හෘදසාක්ෂියත් එකිනෙකට සම්මුඛ වන අවස්ථාවක් ලෙස 'ඈ සිනාහ මුව තවම හැන්දෑව' යන ප්‍රකාශනයෙන් දැනවේ. ස්වාමි-භාර්යා සම්බන්ධතාව පිළිබඳ ඉතා තියුණු අන්තර්දෘෂ්ටියක් විවෘත අවකාශයක තබන කවියා නිහඬ වන්නේ පාඨකයාට එය විසඳා ගැනීමට අවස්ථාව ලබා දෙමිනි.

### 5.3.13. චිත්තරූප හා වචනවල අර්ථජනනීයතා එකිනෙකට සමීපව තැබීම

කෙටි කවියක සෞන්දර්ය පාඨකයාට සම්මුඛ කරන ප්‍රධාන ලක්ෂණයක් ලෙස චිත්තරූපය හැඳින්විය හැකිය. ඒ සඳහා ඇතැම්හු සංකල්ප රූප යන වචනය භාවිත කරති. කෙටි කවියේ දක්නට ලැබෙන සීමිත වචන සංඛ්‍යාවක බොහෝ අර්ථ හෝ අලංකාර එකතු කළ නොහැකිය. දක්ෂ කෙටි කවියා ඒ සඳහා භාවිත කරන කාව්‍ය උපක්‍රමය වන්නේ චිත්තරූපික හා රූපකාර්ථ භාෂා භාවිතයයි. ඇතැම් කෙටි කවිවල වචනවලින් අපේක්ෂිත අර්ථජනනීයතාවත් ඒ හා බැඳි චිත්තරූප සංකලනයත් ක්ෂණික අන්තර්දෘෂ්ටි පාඨකයා වෙත සැපයෙන තවත් මාර්ගයකි. එහිදී සිදු වන්නේ කවියේ වචනවල අර්ථයත් චිත්තරූපයත් එකවිට පාඨකයාට මුණගැස්වීමයි.

"බොහෝ කලකට පසු
වෑ කන්ද බැස එන මට
යමක් කියන්නට ගිය
පැරණි කෝන්ගහ
ම'දෙස බලා නිහඬ විය" (විජේසිරිවර්ධන, 2017: 79)

'පැරණි කෝන්ගහ' යනු කවියේ සමස්තය කේන්ද්‍රගත වන ස්ථානයයි. පාඨකයා කවියේ චිත්තරූපයත් බහුවිධ අර්ථජනනීයතාවත් සමීපාර්ථයේ තබා විසඳන්නේ 'කෝන්ගහ' යන සංකේතය ස්වකීය අද්දැකීම් හා අනුයුක්ත කිරීමෙනි. මෙහි කෝන්ගහ රූපකාර්ථවත් යෙදුමකි. කවියා කෝන්ගහ යන සංකේතයෙන් ජීවිතයේ විඳි සියලු අතීත අද්දැකීම්වල විශාලත්වයත් නිහඬව දරා සිටීමත් ඉස්මතු කරයි. කෝන්ගහ ම'දෙස බලා නිහඬ වීම යන්නෙන් පාඨකයා වෙත තියුණු ක්ෂණික අන්තර්දෘෂ්ටියක් සැපයේ. ඕනෑම ජීවිතක සම්පූර්ණයෙන් විවෘත නොකරන ලද හා විවෘත කළ නොහැකි සිදුවීම් දරා සිටීම මානව ජීවිතයේම එක් සංකීර්ණ ක්‍රියාවලියකි. ඒ කෝන්ගහේ නිහඬත්වයේ දෝංකාරය පාඨකයාට ස්වකීය අභ්‍යන්තරයෙන් ඇසීම මෙම කවියෙන් සැපයෙන අන්තර්දෘෂ්ටියේ එක් පාර්ශ්වයකි.

### 5.3.14. අන්තර්දෘෂ්ටියේ ආලෝකයෙන් විවිධ අර්ථ ව්‍යුහ සංරචනය

ක්ෂණික අන්තර්දෘෂ්ටියක් බහුශාබ්දික විය හැකිය. එනම් බොහෝ ශබ්ද හා අර්ථ ගොඩනැගීමට ඇති හැකියාවයි. කවියක් කියවීමෙන් එකවර පැමිණෙන බුද්ධිමය අවදි වීමක්

මගින් පාඨකයාගේ අභ්‍යන්තරයෙහි ඇතුළු එළියක් නිර්මාණය විය හැකිය. එය ආධ්‍යාත්මික සහනයක් විය හැකිය. ඇතැම් විට සම්මත ඓතිහාසික, දේශපාලනික සන්දර්භවලින් ඈත්ව සර්වකාලීන මානවවාදී හා දාර්ශනික අර්ථවලට සමීප වීමට අන්තර්දෘෂ්ටිය මගපාදනු ඇත. කවියේ වස්තුවිෂය අනුව හා පාඨකයාගේ කියවීමේ ස්වභාවය අනුව අන්තර්දෘෂ්ටි මගින් විවිධ අර්ථ ව්‍යූහ සංරචනා කරනු ලබයි. කවිය නිගමනාත්මක බවින් නිදහස්ව විවෘතව තැබෙන විට පාඨකයා එමගින් විවිධ සංරචනා සිදු කරගනී. එය පාඨකයාගේ අද්දැකීම් හා කියවීමේ ධාරිතාව අනුව පාඨකයාගෙන් පාඨකයාට වෙනස් වේ. (රෝලන් බාත් පශ්චාත් ව්‍යුහවාදය යටතේ පැහැදිලි කරන පාඨක ප්‍රතිචාර න්‍යාය ඇසුරෙන් මෙම කාරණාව වඩාත් ගැඹුරෙන් සාකච්ඡා කළ හැකිය.) කවියෙන් ඉස්මතු වන අන්තර්දෘෂ්ටියේ ආලෝකයෙන් විවිධ අර්ථ ව්‍යූහ සංරචනය වන අයුරු පහත උදාහරණයෙන් පැහැදිලි කරගත හැකිය.

> "හඳත්
> ලපයක්
> හදා ගත්තනෙ" (සේනාරත්නන, 2015: 18)

පාලිත සේනාරත්න විසින් රචිත මෙම කෙටි කවියේ අන්තර්දෘෂ්ටිය විවිධාර්ථවත් සංරචනයකට පාඨකයාව පොළඹවයි. කවියා පවිත්‍රත්වය, ආදරය, සුන්දරත්වය ආදි විවිධ අර්ථ දැනවීමට 'සඳ' භාවිත කර තිබේ. කවීන් ඒ තරමට සඳෙහි ඇති ලප හා කැළැල් පිළිබඳවද විවිධ කාව්‍ය රචනා ලියා තිබේ. එහෙත් මෙම කෙටි කවියේදී කවියා සිදු කර ඇත්තේ එම සංසිද්ධිය නැවත ප්‍රතිනිෂ්පාදනය කිරීම නොවේ. කවියා විසින් මෙහිදී සිදු කරනු ලබන්නේ සාමාන්‍ය සමාජයේ පවතින ප්‍රවාදයක් ප්‍රතිනිෂ්පාදන ස්වරූපයෙන් බහු අර්ථ ජනනට සමත් සංරචනයක් ලෙස ප්‍රතිනිර්මාණය කිරීමයි. එහිදී 'සඳ' හා 'ලපය' යන සංකේතාර්ථ චිත්තරූපද්වය රූපකාර්ථයෙන් කියවීමට පාඨකයා සමත් විය යුතුය. එවිට 'සඳ' හා 'ලපය' යන්නට විවිධාර්ථ ආරෝපණය කරගත හැකිය. හුදෙක් කැළැල් දැක සිනාසෙන අයටත් දුක් වෙන අයටත් කැළැල් වනාහි සුන්දරත්වයේම ආංගික ලක්ෂණයක් බව මෙම කවියෙන් ලබාදෙන තියුණු හා ක්ෂණික අන්තර්දෘෂ්ටියයි.

## 6. සමාලෝචනය

කෙටි කවි යනු නූතන සිංහල කාව්‍ය ප්‍රවණතාවල හමුවන නවතම කාව්‍ය උපශානරයකි. එහෙත් මෙම කාව්‍ය උපශානරයේ ඇති සුවිශේෂතා වර්තමානයේ අධ්‍යයනය වී ඇත්තේ අවම වශයෙනි. කෙටි කවියේ ඇති වචන අවම බව හා රිද්මයානුකූල බවින් තොරවීම යන හේතු කරණකොට ගෙන මෙම කාව්‍ය උපශානරය සම්බන්ධයෙන් ඇතැම්හු විවිධ දෝෂාරෝපණ එල්ල කරති. මෙම පර්යේෂණයේදී කෙටි කවිවල ඇති විශේෂතාව එපිෆනි (Epiphany) සංකල්පය හෙවත් ක්ෂණික අන්තර්දෘෂ්ටිය නමැති න්‍යායාත්මක ප්‍රවේශය

යටතේ සාකච්ඡා කළ අතර එහිදී කෙටි කවිවලින් ලැබෙන ක්ෂණික බුද්ධිමය ආලෝකයේ ප්‍රබලත්වය කෙසේදැයි වටහාගැනීමට හැකිවිය. ඒ අනුව කෙටි කවි හුදෙක් එකවර කියවා ඉවතලිය නොහැකි පුද්ගලයාගේ ඇතුළාන්තයට ක්ෂණිකව ආමන්ත්‍රණය කළ හැකි විශිෂ්ට අන්තර්දෘෂ්ටිමය කණිකා ගුණාංග ඇතුළත් කාව්‍ය ශානරයක් බව සනාථ විය. මෙම එපිෆනි ගුණාංගය සියලු කෙටි කවිවල එකසේ දැකගත නොහැකිය. එය කෙටි කවියේ අර්ථයට හා සෞන්දර්යයට සමීප විය හැකි එක් න්‍යායික ප්‍රවේශයක් පමණි. එමෙන්ම එපිෆනි ගුණාංගය කෙටි කවි සඳහා පමණක් අනන්‍ය කියවීම් ක්‍රමයක් නොවේ. එය ඕනෑම සාහිත්‍ය, කලා නිර්මාණයක් කියවීමේදී භාවිත කළ හැකිය. ක්ෂණික අන්තර්දෘෂ්ටියේ හෙවත් එෆිපනියේ විවිධ ස්වභාව තිබිය හැකිය. එය වස්තුවිෂය අනුව පාඨකයාගේ ස්වභාවය හා බුද්ධිමය ධාරිතාව අනුව පෙනෙන හා දැනෙන අයුරු වෙනස් විය හැකිය. එබැවින් කෙටි කවියේ භාවිත ප්‍රස්තුතය අනුව ඉන් ජනිත වන අන්තර්දෘෂ්ටිය විවිධ ස්වරූප ගන්නා බව පාඨකයා දත යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අතුකෝරල, ලක්ශාන්ත. (2008). හිතග්ගිස්සෙ නැතත් මොට්ටු. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අමරකීර්ති, ලියනගේ. (2016). නව කවි සලකුණ. නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

අමරකීර්ති, ලියනගේ. (2010). පහන සහ කැඩපත. බොරැල්ල: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.

බණ්ඩාර කපුවත්ත, (2015). මාලන්. අඟුණ මල්. කර්තෘ ප්‍රකාශනයකි.

කල්පනී, ඇම්බ්‍රෝස්. (2018). පියා නොහැඹූ පියාපත්. නුගේගොඩ: සංහිඳ ප්‍රකාශකයෝ.

කුරුවිට, කුසල් ධනංජය. (2020). අස්පර්ශනීයන් වෙත. යක්කල: සන්ථව ප්‍රකාශන.

ගම්ලත්, සුචරිත. (සංස්.). (2009). ඉංගිරිසි-සිංහල මහා ශබ්දකෝෂය. නුගේගොඩ: සංහිඳ ප්‍රකාශකයෝ.

තැන්නේ ඤාණානන්ද හිමි. (2014). පන්හිඳක දඟ. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, විමල්. (2010). නව විචාර සංකල්ප. බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශකයෝ.

පඤ්ඤවංස හිමි, මණ්ඩාවල. (පරි.). (2015). Y+kH;djdoh o idfmalaI;djdoh o@. කොළඹ: සේරි ප්‍රකාශන.

ප්‍රියංකර නිවුන්හැල්ල, වසන්ත. (2009). iq<Õ. අනුරාධපුරය: වන්නි ප්‍රකාශන.

රණවීර, ආරියවංශ. (2017). තවමත් මල්. මහරගම: අහස මීඩියා වර්ක්ස්.

රණවීර, ආරියවංශ සහ නන්දන වීරසිංහ. (2014). තුන් පෙති හතර පස් පෙති. කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

රණවීර, ආරියවංශ. (2019). බටහිර සාහිත්‍ය විචාර විධි. මහරගම: අහස මීඩියා වර්ක්ස්.

විජේසිරිවර්ධන, සුනිල්. (2017). ගිරි මුදුන මගේ නිවහන. දෙහිවල: විදර්ශන ප්‍රකාශන.

විමලකිත්ති හිමි, අහුන්ගල්ලේ සහ උඩුවේ ජනානන්ද හිමි. (පරි.). (2006). Oïumomd<s ^iq;;msgfl Lqoaol ksldfhd 1 ^ÿ;sh .fJ:d&&. (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව). නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

වෙඩිවර්ධන, මංජුල. (2020). නිමිති. දෙහිවල: විදර්ශන ප්‍රකාශන.

සිරිසුධම්ම හිමි, අපරැක්කේ. (2019). කෙටි කවි ලකුණ. යක්කල: සත්ථව ප්‍රකාශන.

සේනාරත්න, පාලිත. (2015). හයිකු මොහොත. කර්තෘ ප්‍රකාශනයකි.

ෆර්නැන්ඩු, යේශා. (2019). ලිලැක්. නුගේගොඩ: ඉමාෂි ප්‍රකාශන.

Bowen, Zack. (1981). Joyce and the Epiphany Concept: *A New Approach, Journal of Modern Literature*. Volume 09 (Issue 01), Indiana University Press.

Hallisey, Charles. (trans.). (2015). *Therigatha (Poems of the First Buddhist Women&).* Cambridge: Harvard University Press.

Paranavitana, S. (1945). "Brahmi Inscriptions in Sinhalese Verse," *Journal of the Ceylon Branch of the Royal Asiatic Society*. (Vol. xxxiv, No 98) Ceylon Branch.

Taylor, Charles, (2008). *Sources of the Self the Making of Modern Identity*. Cambridge: Cambridge University Press.

Yasuda, Kenneth. (1985). *The Japanese Haiku*. Tokyo: Charles E. Tuttle Company.

## Peer Review Policy of the Journal of the Faculty of Humanities and Social Sciences (JFHSS)

Manuscripts submitted by authors are preliminary assessed, in collaboration with the Editor-in-Chief, for their suitability for publication in the journal, scrutinizing each paper individually to determine whether it has followed the guidelines of the journal or has a basis in original research, or a review paper presenting some new connections. Papers deemed suitable are then tested for the plagiarism. After finishing the initial screening process, manuscripts will be preceded for peer reviewing process. The manuscripts will be referred to two reviewers to assess the scientific quality without details of the author and his/her affiliation. If one referee recommended to reject the paper with strong reasons, the final decision of the Editorial Board is to reject the paper. Upon receiving reviewer's comments, the Editorial Board will make the final decision of acceptance of the paper without revision or return to the author for further improvement or reject the paper without any revision. If revisions are required, the author is given one month for the revision and resubmission of the paper. A revised paper is sent again for the relevant referees to make sure that the required revisions have been done. The accepted papers will be published in the Journal of the Faculty of Humanities and Social Sciences (JFHSS) online and in print.

### Copyright

All rights reserved with the Faculty of Humanities and Social Sciences, University of Ruhuna. No responsibility is assumed by the Faculty of Humanities and Social Sciences for the statements and opinions expressed by the contributors to the journal. Please note that the journal accepts online submissions only.

## මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨ සඟරාවේ (JFHSS)ප්‍රකාශන ආචාර ධර්ම

රුහුණ විශ්ව විද්‍යාලයේ *මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ ජර්නලය* ප්‍රකාශයට පත්කිරීමට සම්බන්ධ කර්තෘ මණ්ඩල සාමාජිකයින්, කතුවරුන් සහ සමාලෝචකයින් අනුගමනය කළ යුතු ජාත්‍යන්තරව පිළිගත් සදාචාරාත්මක ප්‍රමිතීන්.

**කතුවරුන් සඳහා:**

i. සඟරාවේ ප්‍රකාශයට පත් කරන ලද පිටපත් මුල් පිටපත් වන අතර ඒවා වෙනත් තැනක ප්‍රකාශයට පත් කර හෝ වෙනත් තැනක ප්‍රකාශයට පත් කිරීම සඳහා සලකා බලනු ලැබ නැත.

ii. වෙනත් පුද්ගලයෙකුගේ අදහස් හෝ වැඩ භාවිතා කර එය තමන්ගේම යැයි මවා පාන ලද, අනුපිටපත් කරන ලද, ගොතන ලද සහ ව්‍යාජ දත්ත සහිත අත් පිටපත් දැඩි පරීක්ෂාවකින් පසුව නීති විරෝධී යැයි සලකනු ලබන අතර ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iii. උපුටා දැක්වීම් නිසි ලෙස පිළි නොගත් අත් පිටපත් වෘත්තීයමය නොවන ඒවා ලෙස සලකනු ලබන අතර ඒවා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iv. ප්‍රකාශයට පත් කිරීමට පෙර හෝ පසුව හඳුනාගත් අත්පිටපත්වල ඇති සැලකිය යුතු දෝෂ හෝ සාවද්‍යතාවයන් වහාම ඉවත් කිරීම සඳහා හෝ නිසි නිවැරදි කිරීම් සමඟ නැවත ප්‍රකාශයට පත් කිරීම සඳහා ප්‍රධාන කර්තෘවරයාට හෝ කර්තෘ මණ්ඩලයට දැනුම් දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**කර්තෘ මණ්ඩල සාමාජිකයින් සඳහා:**

i. සියළුම ඉදිරිපත් කිරීම් ජර්නලයේ ප්‍රකාශයට පත්කිරීමේ යෝග්‍යතාවය සඳහා තක්සේරු කරනු ලබන්නේ ඒවා වෙනත් පුද්ගලයෙකුගේ අදහස් හෝ වැඩ භාවිතා කර එය තමන්ගේම යැයි මවා පෑම, අනුපිටපත් කිරීම, ගොතන ලද සහ ව්‍යාජ දත්ත හෝ අතිරික්ත තොරතුරු අඩංගු නොවන බවට තනි තනිව පරීක්ෂා කර බැලීමෙනි.

ii. කතුවරයාගේ (ශාස්ත්‍රීය) අධ්‍යයන හෝ වෘත්තීය තත්ත්වය නොසලකා සියලු අත් පිටපත් රහස්‍යව තක්සේරු කරනු ලබන්නේ ඒවායේ බුද්ධිමය අන්තර්ගතය සඳහා පමණක් වන අතර සෑම කතුවරයකුටම ගෞරවයෙන්, ආචාරශීලීව හා සාධාරණත්වයෙන් සලකනු ලැබේ.

iii. සෑම ඉදිරිපත් කිරීමක් සඳහාම අනුගමනය කරන ලද සමාලෝචන ක්‍රියාවලියේ රහස්‍යභාවය එහි ප්‍රකාශනය අතරතුර සහ පසුව දැඩි ලෙස පවත්වාගෙන යනු ලැබේ.

iv. ඉදිරිපත් කිරීමක් සමාලෝචනය කිරීම සඳහා කර්තෘ මණ්ඩල සාමාජිකයෙකුට පවරා ඇති අවස්ථාවක දී, එම පැවරුම ක්ෂණිකව විධිමත් ලෙස ප්‍රතික්ෂේප කිරීමෙන්, බැඳියාව පිළිබඳ ගැටුම් විසඳනු ලැබේ.

v. අදාළ විෂය ක්ෂේත්‍රයන්හි ඔවුන්ගේ විශේෂඥතාව මත විභව සමාලෝචකයින් නම් කිරීම කර්තෘ මණ්ඩල සාමාජිකයාගේ වගකීම ලෙස සැලකේ.

vi. ඉදිරිපත් කිරීමක් සමාලෝචනය කිරීම සඳහා සමාලෝචකයින් කතුවරයා අනුබද්ධිත පීඨයෙන් / දෙපාර්තමේන්තුවෙන් නම් නොකෙරේ.

vii. ඵලදායී, සාධාරණ හා සාධනීය සමාලෝචන ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා ඔවුන්ගේ දායකත්වයේ විෂය පථය, ගුණාත්මකභාවය සහ කාලානුරූපතාවය අවධාරණය කරමින් සමාලෝචකයින් තෝරා ගැනීම කර්තෘ මණ්ඩලයේ අරමුණ වේ.

viii. ප්‍රකාශිත අදහස්වල නිරවද්‍යතාවය පවත්වා ගැනීම සඳහා පාඨකයන්ගේ සහ කතුවරුන්ගේ අවශ්‍යතා සපුරාලීම වස් ජර්නලයේ ගුණාත්මකභාවය හා අදාළත්වය ඉහළ නැංවීම සඳහා නිරන්තර වැඩිදියුණු කිරීමේ යෝජනා ක්‍රමයක් පවත්වනු ලැබේ.

ix. කර්තෘ මණ්ඩලය වගකියනුයේ ඉදිරිපත් කළ අත්පිටපත් සඳහා ප්‍රකාශන තීරණ ගැනීම පිළිබඳ වන අතර ඒවායේ අන්තර්ගතය තීරණය කිරීම සඳහා නොවේ.

x. බුද්ධිමය හා සදාචාරාත්මක ප්‍රමිතීන් කිසිදු තත්වයක් යටතේ කිසි විටෙකත් සම්මුතියකට ලක් නොවේ.

xi. අවශ්‍ය විටකදී නිවැරදි කිරීම්, පැහැදිලි කිරීම් සහ සමාව ප්‍රකාශ කිරීම් මගින් කර්තෘ මණ්ඩලයේ නම්‍යශීලීභාවය තහවුරු වේ.

**සමාලෝචකයින් සඳහා:**

i. සමාලෝචකයින් තමන් සමාලෝචනය කරන අත් පිටපත් පිළිබඳ සම්පූර්ණ රහස්‍යභාවය සමාලෝචන ක්‍රියාවලියේදී සහ පසුව පවත්වා ගනු ලැබේ.

ii. අත් පිටපත් ඒවායේ බුද්ධිමය අන්තර්ගතය, ප්‍රභවය, වැදගත්කම, සඟරාවේ විෂය පථයට අදාළ බව තක්සේරු කරනු ලැබේ.

iii. සෑම කතුවරයකුටම (නිර්නාමික වුවද) ඔහු හෝ ඇය විසින් ඉදිරිපත් කරන ලද අත් පිටපතේ තත්වය නොසලකා ගෞරවයෙන්, ආචාරශීලීව හා සාධාරණව සලකනු ලැබේ.

iv. ඕනෑම ආකාරයක බැඳියාව පිළිබඳ ගැටුමක් ඇති සමාලෝචකයින් වහාම ක්‍රියාත්මක වන පරිදි අදාළ පැවරුම් විධිමත් ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබේ.

v. අත් පිටපතක් ප්‍රකාශයට පත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට හේතු පළමුව කර්තෘ මණ්ඩලයේ අවධානයට යොමු කෙරේ.

vi. ඵලදායී, සාධාරණ හා සාධනීය සමාලෝචන ක්‍රියාවලියක් සහතික කිරීම සඳහා සඟරාවේ අරමුණු, සමාලෝචන විෂය පථය, ප්‍රකාශනයේ ගුණාත්මකභාවය සහ කාලානුරූපතාවය සෑම සමාලෝචකයෙකු විසින්ම දැඩි ලෙස අනුගමනය කරනු ලැබේ.

## Publication Ethics of the Journal of the Faculty of Humanities and Social Sciences (JFHSS)

To be followed by the editorial board members, authors, and reviewers involved in the publishing of the ***Journal of the Faculty of Humanities and Social Sciences*** **(JFHSS)**, the Faculty of Humanities and Social Sciences, University of Ruhuna, in alignment with the internationally recognized ethical standards.

**For Authors**:

i. The manuscripts published in the journal are originals, neither published elsewhere nor under review for publication by another publisher.

ii. Manuscripts with plagiarized, duplicated, fabricated, and falsified data are treated as illegal after strict screening and rejected.

iii. Manuscripts with citations and quotes that are not duly acknowledged are treated as unprofessional and rejected.

iv. Any significant errors or inaccuracies in the manuscripts identified before or after publication are expected to be immediately informed to the Editor-in-Chief or the Editorial Board either for withdrawal or for republication with due corrections.

**For Editorial Board Members:**

i. All submissions are assessed for their suitability for publication in the journal by scrutinizing them individually to make sure that they contain no plagiarized, duplicated, fabricated, and falsified data or redundant material.

ii. All manuscripts, irrespective of the academic or professional status of the author(s), are confidentially assessed in principle only for their

intellectual content, and every author is treated with respect, dignity, courtesy, and fairness.

iii. Confidentiality of the review process adopted for each and every submission is strictly maintained during and after its publication.
iv. Issues of conflict of interest are addressed in the event of an editorial board member is assigned to review a submission, by formally declining such assignment with immediate effect.
v. Nominating potential reviewers on the basis of their expertise in the relevant subject areas is considered the responsibility of the editorial board member.
vi. Referees for submissions are not nominated from the faculty/department, which the author is affiliated to.
vii. The aim of the Editorial Board is to select reviewers with emphasis on the scope, quality, and timeliness of their contribution to ensure an effective, fair, and constructive review process.
viii. A constant improvement scheme is conducted for upgrading the quality and relevance of the journal to meet the needs of readers and authors to maintain the accuracy of the ideas published.
ix. The Editorial Board is responsible for making publication decisions for the submitted manuscripts but not for determining their contents.
x. Intellectual and ethical standards are never compromised under any circumstance.
xi. The flexibility of the Editorial Board is established by publishing corrections, clarifications, and apologies as and when needed.

**For Reviewers:**

i. The reviewers are required to maintain complete confidentiality about the paper(s) they review during and after the review process.
ii. Manuscripts are objectively evaluated for their intellectual content, originality, significance, relevance to the purview of the journal.
iii. Every author (although anonymous) is treated with dignity, courtesy, and fairness irrespective of the status of the manuscript submitted by him or her.
iv. Reviewers with any form of conflict of interest are supposed to formally decline the relevant assignment(s) with immediate effect.
v. Reasons to reject publication of a manuscript are first brought to the attention of the Editorial Board.

vi. The aims of the journal, the review scope, the quality and timeliness of the publication are strictly followed by every reviewer to ensure an effective, fair and constructive review process.

Editorial office:
Editorial Office-FJHSS
Faculty of Humanities and Social Sciences
University of Ruhuna, MH 8100
Matara, Sri Lanka
Email: fjhss@hss.ruh.ac.lk
Web: http://www.hss.ruh.ac.lk/JFHSS/index.html